# 4
## ශ්‍රේණිය

## මූලික පිරිවෙන්
# සමාජ විද්‍යාව

## මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර
## Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



සමාජ විද්‍යාව - මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර

# සමාජ විද්‍යාව

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය

මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

# Primary Piriven Mid Year Tearm Test - 2018

04 ශ්‍රේණිය /Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
Sociology I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

සමාජ විද්‍යාව I

උපදෙස්

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරාදී ඇති උපදෙස් අනුව පිළිතුරු ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

01. "සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි." මෙම නිර්වචනය ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා කවුරුන් ද?

(i) ඔගස්ට් කොම්ට
(ii) ජෝන් සටුවට් මිල්
(iii) එලිසබත් ජේ. විල්කින්ස්
(iv) එමිල් ඩූර්කයිම්

02. "සමාජ විද්‍යාව මිනිසාගේ සකල සමාජ ජීවිතය විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නකි." මෙම අදහස ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා කවුරුන්ද?

(i) ජෝන් සිටුවට් මිල්
(ii) මැක්ස් වෙබර්
(iii) එල්. ටී. හොබ්හවුස්
(iv) එමිල් ඩූර්කයිම

03. සමාජ විද්‍යා විෂය බිහිවීමට බලපෑ ප්‍රධානතම හේතු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

A. දේශපාලන ප්‍රතිසංස්කරණ
B. කාර්මික විප්ලවය
C. සමාජවාදය බිහි වීම
D. ආගමික ප්‍රතිසංස්කරණ

(i) A,C,D
(ii) A,B,D
(iii) A,B,D
(iv) B,C,D

04. ජේම්ස් වොට් (Jemes watt) විසින් සොයාගනු ලැබුයේ,

(i) ගුවන් යානා එන්ජිම යි.
(ii) දුම්රිය එන්ජිම යි.
(iii) හුමාල එන්ජිම යි.
(iv) නැව් එන්ජිම යි.

05. සමාජය පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විෂයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

A. පරිසර විද්‍යාව
B. මානව විද්‍යාව
C. රසායන විද්‍යාව
D. ආර්ථික විද්‍යාව

(i) A,B
(ii) B,C
(iii) B, D
(iv) C,D

06. ස්වභාවික ලෝකය පිළිබඳ හදාරණු ලබන විෂයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

A. භෞතික විද්‍යාව  B. ඉතිහාසය  C. ජීව විද්‍යාව  D. දේශපාලන විද්‍යාව

(i) A,B  (ii) A,C  (iii) B, C  (iv) C,D

07. නිවැරදි පෞරුෂයක් සහිත පුද්ගලයෙකු සමාජානුයෝජනය කිරීමට වඩාත් වැඩි දායකත්වයක් සපයනු ලබන්නේ පහත කුමන අන්තර් සබඳතාවය ද?

(i) අඹු සැමි සබඳතාවය  (ii) මිත්‍ර මිත්‍ර සබඳතාවය

(iii) දෙමාපිය දූදරු සබඳතාවය  (iv) ගිහි පැවිදි සබඳතාවයි

08. පහත සූත්‍ර අතරින් මානව සබඳතා නිවැරදිව පවත්වා ගෙන යාමට මඟ පෙන්වනු ලබන ප්‍රබලම බෞද්ධ සූත්‍රය වනුයේ,

(i) මංගල සූත්‍රයයි  (ii) වසල සූත්‍රයයි

(iii) පරාභව සූත්‍රයය  (iv) සිගාලෝවාද සූත්‍රයයි

09. ඔගස්ට් කොම්ට් ඉදිරිපත් කළ සමාජ පරිණාම අවධි දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A. දේවවාදී අවධිය  B. රණකාමී අවධිය  C. පාර භෞතික අවධිය  D. යථානුභූත අවධිය

(i) A,B,C  (ii) A,B,D  (iii) A,C,D  (iv) B,C,D

10. වැඩවසම් සමාජය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ සමාජ දාර්ශනිකයා වන්නේ,

(i) මැක්ස් වේබර් ය.  (ii) හර්බට් ස්පෙන්සර් ය.

(iii) එමිල් ඩූර්කයිම් ය  (iv) කාල් මාර්ක්ස් ය

11. ප්‍රාථමික සමාජයක ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(i) සංකීර්ණ සමාජයක් තිබීම  (ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තිබීම

(iii) ශ්‍රම විභජනයක් තිබීම  (iv) නොදියුණු සරල නිෂ්පාදන ක්‍රමයක් තිබීම

12. සමාජ පරිණාමය කෙරෙහි බලපානු ලබන මූලික සාධකයන් ඇතුළත් පිළිතු තෝරන්න.

A. නවීකරණය.  B. නාගරීකරණ.  C. දේශපාලනීකරණය.  D. කාර්මීකරණය.

(i) A,B,C  (ii) A,B,D  (iii) A,C,D  (iv) B,C,D

13. නවීකරණයට අදාළ අංග නිවැරදි ව ඇතුළත් පිළිතුර තෝරන්න.

A. කාර්මික නවීකරණය  B. අධ්‍යාපන නවීකරණයි

C. ආර්ථික නවීකරණය  D. කෘෂිකාර්මීකරණය

(i) A,B,C  (ii) A,B,D  (iii) A,C,D  (iv) B,C,D

14. සමාජ පරිනාමය පිළිබඳ කරුණු සඳහන් බෞද්ධ සූත්‍රය කුමක් ද?,

(i) සිගාලෝවාද සූත්‍රය  (ii) පරාභව සූත්‍රය

(iii) අග්ගඤ්ඤ සූත්‍රය  (iv) වසල සූත්‍රය.

15. රටක් පාලනය කිරීමේ දී වැදගත් කරුණු රැසක් දක්වෙන බෞද්ධ සූත්‍රය වනුයේ,

(i) කූටදන්ත සූත්‍රය යි.  (ii) චක්කවත්ති සීහනාද සූත්‍රය යි.

(iii) සිගාලෝවාද සූත්‍රය යි.  (iv) වසල සූත්‍රය යි.

16. පුද්ගලයාගේ මෙලොව සමාජ ජීවිතය යහපත් ලෙස ගත කිරීමට උපදෙස් දෙන ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ අඩංගු කරුණු නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

A. උට්ඨාන සම්පදා B. කළ්‍යාණ මිත්තතා.

C. ශ්‍රද්ධා සම්පදා D. සමජීවිකතා

(i) A,B,C (ii) A,B,D (iii) A,C,D (iv) B,C,D

17. සංස්කෘතියට අදාළ කරුණු නිවැරදි ව සඳහන් පිළිතුර තෝරන්න.

A. එය මිනිසාගේ සමාජ උරුමයයි.

B. එය සමහර ජන කොටස් අතර දක්නට නැත.

C. එය ජන කොටසක් තවත් ජන කොටසකින් වෙන් කොට හඳුනා ගනී.

D. එය පරම්පරාවෙන් පැවරෙයි.

(i) A,B,C (ii) A,B,D (iii) A,C,D (iv) B,C,D

18. "සංස්කෘතිය යනු මිනිසා පරම් පරාවෙන් පරම්පරාවට දායාදයක් වශයෙන් ගෙන යනු ලබන ජීවන රටාවයි." මෙම නිර්වචනය ඉදිරිපත් කළ දාර්ශනිකයා කවුද?

(i) ඊ. බී. ටයිලර් (ii) රේමන්ඩ් පර්ත්

(iii) රැල්ෆ් ලින්ටන් (iv) බ්‍රැනිස්ලෝ මැලිනෝව්ස්කි.

- පහත වගුව භාවිතා කොට 19 සහ 20 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A. භෞතික සංස්කෘතිය<br><br>B. අභෞතික සංස්කෘතිය | C. ගොඩනැගිලි<br>D. උපකරණ<br>E. සිරිත් විරිත්<br>F. නිශ්පාදන<br>G. ඇඳුම්<br>H. මෙවලම්<br>I. ආකල්ප හා විශ්වාස | J. බලි තොවිල්<br>K. සිතකරණය<br>L. බෝධි පූජා<br>M. නඟුල<br>N. පිරිත් දේශනා<br>O. නැකැත් බැලීම<br>P. වී බිස්ස |

19. භෞතික සංස්කෘතියට අයත් දෑ ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?

(i) A,D,N. (ii) A,G,K. (iii) A,H,M. (iv) A,I,P

20. අභෞතික සංස්කෘතියට අයත් දෑ ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?

(i) B,D,L (ii) B,G,K (iii) B,I,O (iv) B,H,P

පහත වගුව තුළ ලංකාවේ පවතින ආගම් කිපයක් හා ඒවා ව්‍යාප්ත වූ අයුරු මෙන්ම ප්‍රධාන ආගමික ග්‍රන්ථ පිළිබඳව දක්වා තිබේ. එම වගුව භාවිතා කොට ප්‍රශ්න අංක 21 22 සහ 23 ට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A. හින්දු | D. චෝල, පාණ්ඩ්‍ය, කේරලයෙන් ව්‍යාප්ත වුණි. | G. බගවත් ගීතාව |
| B. මුස්ලිම් | E. පෘතුගීසි, ඉංග්‍රීසින්ගෙන් ව්‍යාප්ත වුණි. | H. බයිබලය |
| C. ක්‍රිස්තියානි | F. ආරාබියෙන් පැමිණි වෙළඳුන්ගෙන් ව්‍යාප්ත වුණි. G. බගවත් ගීතාව | I. කුරානය |

21. ක්‍රිස්තියානි ආගමට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

(i) A,D,G (ii) A,E,G (iii) C,E,H (iv) B,F,I

22. හින්දු ආගමට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

(i) A,E,G. (ii) A,D,G. (iii) B,E,H. (iv) C,F,I

23. මුස්ලිම් ආගමට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

(i) B,E,G. (ii) B,D,G. (iii) B,F,I. (iv) B,F,H

24. පැවිදි උප සංසකෘතියට අදාල වචන ඇතුලත් පිළිතුරු තෝරන්න.

(i) කනවා, වඩිනවා, නානවා

(ii) සැතපෙනවා, ස්නානය කරනවා, අනුභව කරනවා.

(iii) වළදනවා, පැන්පහසු වෙනවා, සැතපෙනවා

(iv) නිදනවා, දේශනා කරනවා, නානවා

25. යටත් විජිත යුගයේ ලංකාව යටත් කරගත් ජාතීන් පිළිවෙලින් නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

(i) ඉංග්‍රිසි, ලන්දේසි, පෘතුගීසි

(ii) පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රිසි

(iii) ලන්දේසි, ඉංග්‍රිසි, පෘතුගීසි

(iv) ඉංග්‍රිසි, පෘතුග්‍රිසි, ලන්දේසි

26. තත්වය හා කාර්ය භාර්ය පිලිබද අදහස් ඉදිරිපත් කළ දාර්ශනිකයා වන්නේ,

(i) සිග්මන් ෆ්‍රොයිඩ් ය.

(ii) මැක්ස් වෙබර් ය.

(iii) රැලප් ලින්ටන් ය.

(iv) හොබ්ස් හවුස් ය.

27. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ආරෝපිත තත්වය යනු තමා විසින් ඇතිකරගනු ලබන දෙයකි.

(ii) සාධිත තත්වය යනු උපතින් ලැබෙන දෙයකි.

(iii) ආරෝපිත තත්වය හා සාධිත තත්වය යන දෙකම උපතින් ලැබෙන්නකි.

(iv) සාධිත තත්වය යනු උපතින් පසු තමා ඇති කර ගනු ලබන තත්වයකි.

28. ලංකාවේ වැඩිම ජන වර්ග පිළිවෙලින් දක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(i) දෙමළ, මුස්ලිම්, සිංහල, බර්ගර්, මැලේ.

(ii) සිංහල, බර්ගර්, මුස්ලිම්, දෙමළ, මැලේ.

(iii) මුස්ලිම්, දෙමළ, සිංහල, මැලේ, බර්ගර්.

(iv) සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ.

29. රාජ්‍ය පාලනය උදෙසා බුදුන් වහන්සේගේ දේශනා නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

A දසරාජ ධර්මය

B සප්ත අපරිහානි ධර්ම

C ත්‍රිලක්ෂණය

D සතර සංග්‍රහ වස්තු

(i) A,B,C. (ii) A,B,D. (iii) 3. A,C,D. (iv) 4. B,C,D

30. සමාජයේ මිනිසුන් පිරිහෙන අයුරු විස්තර කරන වඩාත් නිවැරදි බෞද්ධ සූත්‍රය කුමක් ද?

(i) මංගල සූත්‍රය.  (ii) වසල සූත්‍රය

(iii) ව්‍යග්ගපජ්ජ සූත්‍රය  (iv) පරාභව සූත්‍රය

1. A,B,C.  2. A,B,D.  3. A,C,D.  4. B,C,D

31. අතීතයේ ගමික නමින් හැඳින්වූයේ,

(i) රජතුමා ය.  (ii) ජනපද පාලකයා ය.

(iii) ගමක පාලකයා ය.  (iv) නගරයක පාලකයා ය.

32. නාගරීකරණය වේගවත් වීමට බලපාන සාධක නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

A. රැකියා පහසුකම්  B. ඉහළ වෙළඳපොළ පහසුකම්

C .අධ්‍යාපන පහසුකම්  D.ජාතිවාදී ගැටුම්

(i) A,B,C  (ii) A,B,D  (iii) A,C,D  (iv) B,C,D

33. මිහිඳු හිමියන්ගේ වැඩම කිරීමෙන් පසු ලාංකිකයන්ට ලැබුනු දායාදයක් නොවන්නේ,

(i) භාෂාව හා සාහිත්‍යය යි.  (ii) ආගම හා ධර්මය යි.

(iii) සංස්කෘතිය හා ගෘහ නිර්මාණශිල්පය යි.  (iv) යක්ෂ වන්දනය හා ප්‍රේත වන්දනය යි.

34. චතුර් වර්ණය ලෙස හැඳින් වූ කුල භේදය ප්‍රතික්ෂේප කරමින් බුදුන් වහන්සේ ඒ වෙනුවට හඳුන්වා දුන්නේ,

(i) සිව්පසය යි.  (ii) සිව් ශබ්විහරණ යි.

(iii) සිව්වනක් පිරිස යි.  (iv) සතර සංග්‍රහ වස්තු යි.

35. සලාතය හා සකාතය යන ධර්ම කාරනා අඩංගු වන ආගම වන්නේ,

(i) හින්දු ආගම යි.  (ii) කතෝලික ආගම යි.

(iii) බෞද්ධ ආගම යි.  (iv) ඉස්ලාම් යි.

36. සමාජ පාලනය උදෙසා දස පනත අනුගමනය කරනුයේ,

(i) ඉස්ලාම් දහම තුළ ය.  (ii) හින්දු දහම තුළ ය.

(iii) කතෝලික දහම තුළ ය.  (iv) බෞද්ධාගම තුළ ය.

37. පුද්ගලයාට ස්වකීය චින්තනය මෙහෙයවා ස්වාධීනව තීරන ගැනීමේ අයිතිය තහවුරු කරන බෞද්ධ සූත්‍රය වනුයේ,

(i) සිගාලෝවාද සූත්‍රය යි.  (ii) වසල සූත්‍රය යි.

(iii) කාලාම සූත්‍රය යි.  (iv) පරාභව සූත්‍රය යි.

38. සාමණේර භික්ෂූන්ගේ හික්මීම සඳහා බුදුන් වහන්සේ දේශනා කර ඇති විනය නීති මාලාව ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) දිනචරියාව (ii) සතර සංවර ශීලය

(iii) සේඛියා (iv) දස සීලයයි

39. ගිහි පැවිදි යුතුකම් දක්වෙන බෞද්ධ සූත්‍රය වනුයේ,

(i) වසල සූත්‍රය යි. (ii) පරාභව සූත්‍රය යි.

(iii) සිඟාලෝවාද සූත්‍රය යි. (iv) රතන සූත්‍රය යි.

40. පුද්ගල ජීවිතේ සපුරාගත යුතු මංගල කරුණු 38 ක් දක්වෙන බෞද්ධ සූත්‍රය වනුයේ,

(i) රතන සූත්‍රය යි. (ii) මෙත්තානිසංස සූත්‍රය යි.

(iii) කරණීයමෙත්ත සූත්‍රය යි. (iv) මහා මංගල සූත්‍රය යි.

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**04 ශ්‍රේණිය/Grade 04**

සමාජ විද්‍යාව I, II
sociology I, II

### සමාජ විද්‍යාව II

සැලකිය යුතුයි

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.

01. I. "සමාජ ශාස්ත්‍රවල රැජිණ සමාජ විද්‍යාවයි" මෙ අදහස ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා කවුරුන්ද?

II. ප්‍රංශ විප්ලවය සිදු වූ වර්ෂය ලියා දක්වන්න

III. හර්බට් ස්පෙන්සර් ඉදිරිපත් කළ සමාජ පරිණාමයේ අවධි දෙක ලියා දක්වන්න

IV. 'ප්‍රාථමික සංස්කෘති' නැමැති කෘතිය රචනා කළ බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයා කවුද?

V. ලංකාවේ දැනට පවතින උප සංස්කෘතීන් දෙකක් ලියා දක්වන්න

VI. පෘතුගීසින් පැමිණීම නිසා ලංකා සමාජයේ සිදුවූ වෙනස්කම් දෙකක් ලියන්න

VII. මිහිඳු හිමියන් සමඟ ලක්දිව වැඩම කළ දූත පිරිස නම් කරන්න

VIII. ලංකාවේ ජීවත් වන ප්‍රධාන ජන වර්ග දෙකක් ලියන්න

I.X "ගිහිවිනය" ලෙස හැඳින්වෙන බෞද්ධ සූත්‍රය කුමක්ද?

X. බෞද්ධ සමාජ ව්‍යුහය නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. I. සමාජ විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර දෙකක් ලියන්න.

II. සමාජ විද්‍යාව බිහිවීමට බලපෑ හේතු කාරණා තුනක් ලියන්න.

III. සමාජයේ පැවැත්ම උදෙසා සමාජ සාරධර්ම වල වැදගත්කම බුදුන් වහන්සේ දේශනා කොට තිබේ. බෞද්ධ සූත්‍ර ඇසුරෙන් පැහැදිලි කරන්න

(ලකුණු 2+3+5 = 10)

03. I. සමාජ පරිණාමය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න

II. ඓන්ද්‍රිය ඒකාබද්ධතාව සහිත සමාජයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

III. නවීනකරණය තුළ භික්ෂුව සමාජයේ විනය යහපත් අයුරින් පවත්වා ගත යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න

(ලකුණු 2+3+5 = 10)

04. I. සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

II. 'සංස්කෘතිය' යනු කුමක්දැයි නිර්වචනයක් ඇසුරින් දක්වන්න

III. බටහිර යටත් විජිත පාලනය නිසා ශ්‍රී ලාංකික සංස්කෘතියේ වෙනස්කම් නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

05. I. ආවෘත සංස්කෘතිය කුමක්දැයි දක්වන්න

II. හින්දු ආගමික උප සංස්කෘතිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න

III. "පැවිදි උප සංස්කෘතිය භික්ෂු ශාසනයේ පැවැත්ම තහවුරු කරයි.' විමසන්න

(ලකුණු 2+3+5 = 10)

06. I. මහාවංශයේ දැක්වෙන ආකාරයට මුලින්ම ලංකාවට පැමිණි ආර්යය කණ්ඩායම් දෙකක් නම් කරන්න

II. පැරණි ලාංකේය සමාජයේ පැවැති ඇදහිලි හා විශ්වාස මහින්දාගමනයත් සමඟ අර්ථවත් වූයේ කුමන අයුරින්දැයි පැහැදිලි කරන්න.

III. ඉංග්‍රීසීන් ලංකාව යටත් කරගැනීමෙන් පසු සිදුවූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

07. I. මව් කුසේ සිටම දරුවා මවගෙන් කායිකව හා මානසිකව පෝෂණය ලබන බව බුදුරජාණන්වහන්සේ දැක්වූයේ කුමන සූත්‍රයේද?

II. ලංකාවේ ප්‍රධාන ජනවර්ග තුනට ආවේනික සංස්කෘතික උත්සව තුනක් වෙන වෙනම දක්වන්න.

III. ලාංකීය සමාජයේ පවතින විවිධත්වය තුළ එකමුතුබව ආරක්ෂා කරගන්නේ කෙසේදැයි බෞද්ධ ඉගැන්වීම් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

08. I. ජන සංඛ්‍යාව අනුව , නගර , වර්ග පහකට බෙදේ. ඉන් වර්ග දෙකක් නම් කරන්න.

II. අතීතයේ සිටම බෞද්ධ භික්ෂූන් වහන්සේ සමාජ පාලනය උදෙසා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

III. "සමාජ ගැටලු" නිරාකරණය උදෙසා බුදුන් වහන්සේ මඟ පෙන්වා තිබේ. විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

**04 ශ්‍රේණිය /Grade 04**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II — කාලය : පැය තුන යි

sociology I, II — Time : Three Hours

**සමාජ විද්‍යාව I**

උපදෙස්

» මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.

» එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුරු ලකුණු කරන්න.

» මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

01. සමාජ විද්‍යාඥයෝ මිනිසා සංස්කෘතික ............................... වශයෙන් හඳුන්වති.

(i) සාමාජිකයෙකු (ii) සත්ත්වයෙකු

(iii) කොටස්කරුවෙකු (iv) උරුමකරුවෙකු

02. පුද්ගලයකු සමාජයට ............................. සංස්කෘතිය තමා වෙත පවරා ගැනීම ලෙස දැක්විය හැකිය.

(i) පරිවර්තනයවීම (ii) සම්බන්ධවීම

(iii) අනුකලනයවීම (iv) හිමිකරුවෙකු වීම

03. 'ප්‍රාථමික සංස්කෘතිය' නමැති කෘතියේ කතුවරයා වනුයේ .................................................... ය.

(i) කාල් මාක්ස් (ii) ඊ. බී. ටයිලර්

(iii) හර්බට් ස්පෙන්සර් (iv) රේමන්ඩ් ෆර්ක්

04. 'මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දායාදයක් වශයෙන් ගෙන යන ජීවන රටා සමුදාය සංස්කෘතිය යි.' මෙම නිර්වචන ඉදිරිපත් කරන ලද්දේ......................................... විසිනි.

(i) රැල්ෆ් ලින්ටන් (ii) ඊ. බී. ටයිලර්

(iii) ඔගස්ට් කොම්ට් (iv) නන්දසේන රත්නපාල

05. සංස්කෘතිය ගැන සාකච්ඡා කිරීමේ දී යොදා ගන්නා ප්‍රධාන එළඹුම් ...................................... ඇත.

(i) පහක් (ii) තුනක් (iii) හතක් (iv) දෙකක්

- නිවැරදි වරණය තෝරන්න.

06. සමාජ විද්‍යාව විෂයක් ලෙස ස්ථාපිත වූයේ,

(i) 16 වන සියවසේ දී ය. (ii) 17 වන සියවසේ දී ය.

(iii) 19 වන සියවසේ දී ය. (iv) 20 වන සියවසේ දී ය.

07. මානව සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සමාජ විද්‍යා විෂය තුළින් කරන ලද බව අවධාරණය කළ සමාජ විද්‍යාඥයා වනුයේ,

(i) එලිසබත් ජේ. විල්කින්ස් ය. (ii) ඔගස්ට් කොම්ට් ය.

(iii) එල්. ටී. හොබ්හවුස් ය. (iv) කාල් මාක්ස් ය.

08. 'සමාජ විද්‍යාව මිනිසාගේ සකල සමාජ ජීවිතය විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නකි'. මෙම නිර්වචනයේ හිමිකරුවා වනුයේ,

(i) කාල් මාක්ස් ය. (ii) ඔගස්ට් කොම්ට් ය.

(iii) හර්බට් ස්පෙන්සර් ය. (iv) එල්. ටී. හොබ්හවුස් ය.

09. සංස්කෘතියේ ප්‍රධාන කොටස් ගණන

(i) දෙකකි. (ii) තුනකි. (iii) පහකි. (iv) හතරකි.

10. හින්දු ආගම ලංකාවේ ව්‍යාප්ත වූයේ චෝල, පාණ්ඩ්‍ය කේරළ දේශයන්ගෙන් පැමිණි ජනතාව නිසා බව සඳහන් ප්‍රධාන සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ,

(i) එදා හෙළදිව යි. (ii) දීපවංශය යි.

(iii) චූලවංශය යි. (iv) බෝධිවංශය යි.

11. භෞතික සංස්කෘතියට උදාහරණයක් <u>නොවන්නේ</u> මින් කුමක් ද?

(i) විශ්වාස (ii) මෙවලම්

(iii) ගොඩනැගිලි (iv) උපකරණ

12. බුබ්බුලාකාර දාගැබෙන් සංකේතවත් වූයේ,

(i) කෘෂිකර්මාන්තය යි. (ii) ශ්‍රද්ධාව යි.

(iii) දියබිඳුවේ වටිනාකම යි. (iv) කැටයම් කලාව යි.

13. ශ්‍රී ලාංකික සමාජය නියෝජනය කරන ප්‍රධාන ජාතීන් අයත් වරණය කුමක්ද?

A සිංහල B මැලේ

C මුස්ලිම් D දෙමළ

(i) A, B, C (ii) B, C, D (iii) A,C, D (iv) B, D,A

14. ධනවාදී ආකල්ප ගොඩනැගීමෙහිලා ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම වැදගත් වූ ආකාරය පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා වන්නේ,

(i) කාල් මාක්ස් ය. (ii) එමිල් ඩුර්කයිම් ය.

(iii) හර්බට් ස්පෙන්සර් ය. (iv) මැක්ස් වේබර් ය.

15. ඉස්ලාම් ආගමේ අනිවාර්ය වගකීම් අයත් පිළිතුර කුමක් ද?

A කලීමාව B සලාතය

C ගීතිකා D සකාතය

(i) A, B, C (ii) B, C, D (iii) C,D, A (iv) A, B,D

16. විජයාගමනය සිදු වූයේ කිනම් සියවසේදී ද?

(i) ක්‍රි. පූ. 3 වන සියවසේ දී ය. (ii) ක්‍රි. පූ. 2 වන සියවසේ දී ය.

(iii) ක්‍රි. පූ. 5 වන සියවසේ දී ය. (iv) ක්‍රි. පූ. 4 වන සියවසේ දී ය.

17. පණ්ඩුකාභය රජු සමයේ කන්න තුනක් ගොවිතැන් කළ බව සඳහන් වන්නේ කුමන සෙල්ලිපියෙහි ද?

(i) තෝණිගල සෙල්ලිපිය (ii) රජගල සෙල්ලිපිය

(iii) සංගමුව සෙල්ලිපිය (iv) ගල්පොත සෙල්ලිපිය

18. මහ රටක් ආසන්නයේ තිබෙන කුඩා රටක සංස්කෘතිය ප්‍රධාන ලක්ෂණ දෙකක් ඇසුරින් සාකච්ඡා කළ සමාජ විද්‍යාඥයා කවුද?

(i) හර්බට් ස්පෙන්සර් (ii) නන්දසේන රත්නපාල

(iii) කේ. විට්ෆෝගල් (iv) කාල් මාක්ස්

19. ක්‍රි.ව 10 වන සියවසේ දී ශ්‍රී ලංකාව ආක්‍රමණය කරනු ලැබුවේ,

(i) පෘතුගීසි ආක්‍රමණිකයෝ ය. (ii) මුස්ලිම් ආක්‍රමණිකයෝ ය.

(iii) ලන්දේසි ආක්‍රමණිකයෝ ය. (iv) දකුණු ඉන්දීය ආක්‍රමණිකයෝ ය.

20. ලන්දේසීන් පනවා <u>නොතිබුණු</u> බදු වර්ගය කුමක්ද?

(i) ඔරු බද්ද (ii) බලු බද්ද

(iii) කුළුබඩු බද්ද (iv) ඇඟ බද්ද

21. ලංකාවේ පාසල්වල අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වාගෙන යා යුතු බව නිර්දේශ කරන ලද්දේ කිනම් වර්ෂයකදී ද?

(i) ක්‍රි. ව. 1818 (ii) ක්‍රි.ව. 1833

(iii) ක්‍රි. ව. 1820 (iv) ක්‍රි.ව. 1815

22. සදිසා නමස්කාරය මගින් සංවිධානාත්මකව අන්තර් පුද්ගල සම්බන්ධතා සිදු කළ හැකි බව දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(i) සිඟාලෝවාද සූත්‍රය (ii) කූටදන්ත සූත්‍රය

(iii) වසල සූත්‍රය (iv) ධම්මික සූත්‍රය

23. රාජ්‍ය පාලනය පිළිබඳ විස්තර වන සූත්‍රය වනුයේ,

(i) පරාභව සූත්‍රය යි. (ii) රතන සූත්‍රය යි.
(iii) චක්කවත්ති සීහනාද සූත්‍රය යි. (iv) කාලාම සූත්‍රය යි.

24. 'මුරුගන්' වන්දනා කරන්නේ කුමන භක්තිකයන් ද?

(i) කතෝලික (ii) හින්දු
(iii) ඉස්ලාම් (iv) බෞද්ධ

25. වර්තමාන ශ්‍රී ලංකාවේ ගම්වල ජීවත්වන ජනගහන ප්‍රතිශතය වනුයේ,

(i) 90% ක් පමණ ය. (ii) 30% ක් පමණ ය. (iii) 80% ක් පමණ ය. (iv) 50% ක් පමණ ය.

26. පංච මහාවාදයට නායකත්වය ලබා දුන්නේ කිනම් භික්ෂූන් වහන්සේ ද?

(i) රත්මලානේ ධම්මාලෝක හිමි (ii) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
(iii) බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි (iv) වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි

27. මහනුවර මගුල් මඩුවේ දී ඉංග්‍රීසි කතිර කොඩිය බිම දමා සිංහ කොඩිය එස වූ භික්ෂූන් වහන්සේ කවුද?,

(i) හික්කඩුවේ සුමංගල හිමි (ii) වාරියපොළ සුමංගල හිමි
(iii) වස්කඩුවේ ශ්‍රී සුභූති හිමි (iv) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

28. කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා,

(i) ඕස්ට්‍රේලියානු ජාතිකයෙකි. (ii) බ්‍රිතාන්‍ය ජාතිකයෙකි.
(iii) ඇමෙරිකානු ජාතිකයෙකි. (iv) ජර්මන් ජාතිකයෙකි.

29. ඉස්ලාම් භක්තිකයෙකුගේ ජීවිතය හා සම්බන්ධ වූ සිරිත් විරිත් ගොඩනැගීම සඳහා පදනම්වන අනිවාර්ය වගකීම් කීයක් තිබේ ද?

(i) දෙකකි. (ii) තුනකි. (iii) හතරකි. (iv) පහකි.

30. මිහිඳු හිමියන් ලංකාවට වැඩම කළේ,

(i) ක්‍රි. පූ. 236 දී ය. (ii) ක්‍රි. පූ. 235 දී ය.
(iii) ක්‍රි. පූ. 234 දී ය. (iv) ක්‍රි. පූ. 237 දී ය.

අංක 31 සිට අංක 35 දක්වා ප්‍රශ්නවලට දක්වා ඇති A,B,C,D යන ප්‍රතිචාර හතර අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක සඳහන් පිළිතුර තෝරන්න.

31. නගරයේ ඇති ආකර්ෂණීය සාධක හේතුවෙන් නාගරීකරණය වේගවත් වී ඇත. ඒ සඳහා බලපාන ප්‍රධාන සාධක දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

A ආගමික සංවිධාන
B මානව හිමිකම් සංවිධාන
C ප්‍රවාහන පහසුකම්
D අධ්‍යාපන පහසුකම්

(i) A හා B (ii) B හා C (iii) B හා D (iv) C හා D

32. ශ්‍රී ලාංකීය සමාජය තුළ එක ම භාෂාව මව් භාෂාව ලෙස භාවිත කරන ජාතීන් දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A දෙමළ
B සිංහල
C මුස්ලිම්
D බර්ගර්

(i) A හා B (ii) B හා C (iii) C හා D (iv) A හා C

33. සෑම ආගමකම දක්නට ඇති පොදු ලක්ෂණ දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?

A ආගමික සංවිධාන
B ආගමික පුදපූජා
C ආගමික යාඥා
D ආගමික විශ්වාස

(i) A හා B (ii) B හා C (iii) B හා D (iv) A හා D

34. ව්‍යග්ගපජ්ජ සූත්‍රයට අනුව මෙලොව පරලොව ජීවිතය යහපත් කර ගැනීමට හේතුවන කරුණු දෙකක් සඳහන් පිළිතුර තෝරන්න.

A සුභරතා
B සමජීවිකතා
C ආරක්ඛ සම්පදා
D අප්පිච්ඡතා

(i) A හා D (ii) B හා D (iii) A හා C (iv) B හා C

35. කාර්මීකරණයේ මූලික ලක්ෂණ දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A මහා පරිමාණ කර්මාන්තශාලා බිහිවීම
B ජනගහන වැඩිවීම
C මුඩුක්කු නිවාස නොපැවතීම
D සංකීර්ණ ශ්‍රම විභජනයක් තිබීම

(i) A හා C (ii) A හා D (iii) B හා C (iv) C හා D

අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශන දෙක බැගින් දී ඇත. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලය හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවේ I, II, III, IV යන කවර ප්‍රකාශන යුගල දැයි තෝරා ඊට අදාළ පිළිතුරු සහිත අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| අංකය | පළමු වන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| I | නිවැරදිය | නිවැරදිය |
| II | නිවැරදිය | වැරදිය |
| III | වැරදිය | වැරදිය |
| IV | වැරදිය | නිවැරදිය |

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | ඉතිහාසය මගින් ඓතිහාසික සංසිද්ධි තුළින් සමාජ හැසිරීම් අධ්‍යයනය කරයි. | සමාජ මනෝවිද්‍යාව මිගින් ප්‍රාථමික සමාජයේ මිනිසාගේ සමාජ සම්බන්ධතා ගැන කතා කරයි. |
| 37 | මිනිසා හා ඔහුගේ සමාජය පිළිබඳව අධ්‍යයනය කරන විද්‍යාවන් ස්වාභාවික විද්‍යාව වේ. | සමාජ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජීය විද්‍යා ගණයට අයත්ය. |
| 38 | 'ජෝන් ස්ටුවට් මිල්' සමාජ විද්‍යාව මානව වංශ විද්‍යාව වශයෙන් හඳුන්වා ඇත. | සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳව අධ්‍යයනය කරන විද්‍යාව යි' මෙම නිර්වචන එමිර් ඩුර්කයිම්ගේ ය. |
| 39 | බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර බෙදීම සිදු කර ඇත්තේ වෛශ්‍ය වංශිකයන් ය. | පුරාවිද්‍යාත්මක සාධක හා භූ විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සම්බන්ධතා පැවැති බව සනාථ කර ඇත. |
| 40 | අගහස්දානය යනු ආගන්තුක සත්කාරය යි | ආරුමුග නාවලර්තුමා ඉස්ලාම් භක්තිකයෙකි. |

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

**04 ශ්‍රේණිය/**Grade **04**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology I, II

**සමාජ විද්‍යාව** II

**සැලකිය යුතුයි**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. 'සමාජ විද්‍යාව බිහි කිරීමට මුල් වූ දාර්ශනිකයා කවුද?

II. ''ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ හරය'' කෘතියේ කර්තෘ කවුද?

III. මදිරාබාධය යනු කුමක් ද?

IV. දේවවාදී අවදිය, පාර භෞතික අවධිය හා යථානුභූත අවධිය ඔස්සේ සමාජ පරිණාමය සිදුවන බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

V. හර්බට් ස්පෙන්සර් දැක්වූ පරිණාමයේ අවධි දෙක නම් කරන්න.

VI. සමාජ පාලනයක් අවශ්‍යවීම සඳහා බලපෑ හේතු දෙකක් ලියන්න.

VII. නගර ආශ්‍රිතව දක්නට ලැබෙන සමාජ ගැටලු දෙකක් දක්වන්න.

VIII. මව්කුසේ දී දරුවා කලලයේ සිට මවගෙන් කායිකව හා මානසිකව පෝෂණය ලබන බවට විස්තර වන බෞද්ධ සූත්‍රය කුමක් ද?

IX. ලන්දේසි පාලනය හේතුවෙන් දේශීය සංස්කෘතියට සිදු වූ බලපෑම් දෙකක් ලියන්න.

X. ස්වයං විනයක් ඇති කර ගැනීමට හේතුවන කරුණු දෙකක් සඳහන් කරන්න.

( ලකුණු 2 x 10 = 20 )

02. I. සමාජ විද්‍යා විෂය පිළිබඳව නිර්වචනයක් ලියන්න.

II. දහනම වන සියවසේ දී බටහිර සමාජය විවිධ හේතුන් නිසා විපර්යාසයන්ට බඳුන් විය. එයට බලපෑ සාධක තුනක් ලියන්න.

III. නවීන සමාජයක් බිහිවීමෙහිලා කාර්මික විප්ලවයේ දායකත්වය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

04. I. මනෝ විද්‍යාව මගින් සිදුකරන කාර්යය කුමක් ද?

II. සමාජ විද්‍යාව හා සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර තුනක් සඳහන් කරන්න.

III. පංචශීල ප්‍රතිපත්තියේ දක්නට ලැබෙන සමාජ අගය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

04. I. සමාජ පරිණාමය පිළිබඳ කරුණු ඉදිරිපත් කළ සම්භාව්‍ය විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

II. සමාජ පරිණාමය පිළිබඳ කාල් මාක්ස් පෙන්වා දුන් අවධි තුනක් ලියන්න.

III. සමාජ පරිණාමය කෙරෙහි නවීකරණයේ බලපෑම කරුණු දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

05. I. සමාජ සංවර්ධනයේ ප්‍රධාන අවධි දෙක ලියන්න.

II. නාගරීකරණයේ මූලික ලක්ෂණ තුනක් ලියන්න.

III. සමාජ පරිණාමය බුදු දහමේ විග්‍රහ කර ඇති අයුරු අනිත්‍ය සංකල්පය අනුව හඳුන්වන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

06. I. සංස්කෘතියට නිර්වචනයක් ලියා දක්වන්න.

II. මිනිසා ආගම ඇදහීමෙන් බලාපොරොත්තුවන ලෞකික අපේක්ෂා තුනක් ලියන්න.

III. සමාජ පැවැත්මට සංස්කෘතියේ දායකත්වය ලබා ගත හැකි අයුරු පහදන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

07. I. සමාජයක් යනු කුමක් ද?

II. බහු සංස්කෘතික සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න.

III. සමාජ පාලනය සඳහා බුදු දහම යොදා ගත හැකි ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පෙන්වා දෙන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

08. I. 'අධ්‍යාපනය' පිළිබඳ නිර්වචනයක් සපයන්න.

II. අධ්‍යාපනය තුළින් බිහි කරන පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න.

III. පිරිවෙන් අධ්‍යාපනයේ වැදගත්කම නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**NEW**

| 08 | S | I, II |
|---|---|---|

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

පැ තුනයි

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test - 2022

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

**04 ශ්‍රේණිය**

## (08) සමාජ විද්‍යාව - I, II

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව 1 පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

(ලකුණු 01×40=40 යි)

1. සමාජ විද්‍යාව විෂය බිහිවීම කෙරෙහි ප්‍රබල ලෙසම බලපෑම් කළ සමාජ පසුබිම ගොඩනැගුනේ,
   (1) ආසියාතික සමාජ තුළයි. (2) අප්‍රිකානු සමාජ තුළයි.
   (3) ලතින් ඇමරිකානු සමාජ තුළයි. (4) බටහිර සමාජ තුළයි.

2. 'සමාජ විද්‍යාව' විෂයයක් වශයෙන් සමාජගත වූයේ,
   (1) ක්‍රි.ව 1838 වර්ෂයේ දී ය. (2) ක්‍රි.ව 1883 වර්ෂයේ දී ය.
   (3) ක්‍රි.ව 1938 වර්ෂයේ දී ය. (4) ක්‍රි.ව 1983 වර්ෂයේ දී ය.

3. යුරෝපා සමාජයේ ආගමික පිබිදීමක් ඇතිවීම කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කළ 'ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික නිකාය" හඳුන්වාදීමේ පුරෝගාමියා වූයේ,
   (1) ජෝන් කැල්වින් ය. (2) ජෝන් ලොග් ය. (3) මැක්ස් වේබර් ය. (4) මාටින් ලූතර් කිං ය.

* පහත සඳහන් කෘතීන් සැලකිල්ලට ගෙන ප්‍රශ්න අංක 04 සහ 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  (A) යථානුභූත දර්ශනය. (B) සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතීන්.
  (C) ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හා ධනවාදයේ සාරය. (D) ආත්ම ඝාතනය.

4. එමිල් ඩූර්කයිම් විසින් රචිත කෘතීන් පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න,
   (1) A හා B ය. (2) B හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

5. ධනවාදී ආකල්ප බටහිර සමාජයන් තුළ ගොඩනැගුණු ආකාරය අන්තර්ගත කරමින් කරුණු විස්තර කරනුයේ,
   (1) A කෘතිය මගිනි. (2) B කෘතිය මගිනි. (3) C කෘතිය මගිනි. (4) D කෘතිය මගිනි.

[2 වැනි පිටුව බලන්න.

6. මාටින් ලූතර් සමාජ විද්‍යාව විෂය සම්බන්ධයෙන් වැදගත් වන්නේ,
   (1) දේශපාලන ප්‍රතිසංස්කරණ සිදුකිරීම හේතුවෙනි.
   (2) කාර්මික නිෂ්පාදන නිර්මාණය කිරීම හේතුවෙනි.
   (3) ආගමික ප්‍රතිසංස්කරණ සඳහා පුරෝගාමී වීම හේතුවෙනි.
   (4) කිතුණු ආගමික පූජකවරයෙකු වීම හේතුවෙනි.

7. සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත්වන දේශපාලන ප්‍රතිසංස්කරණ ආරම්භ වීම කෙරෙහි බලපෑම් කළ ආසන්නත ම සාධකය නම්,
   (1) දහතුන්වන ලුවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.
   (2) පහළොස්වන ලුවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.
   (3) දහසයවන ලුවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.
   (4) දහඅටවන ලුවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.

8. සමාජ විද්‍යාඥයාගේ ප්‍රධාන විෂය පථය වන්නේ,
   (1) සමාජ ලෝකය අධ්‍යයනය කිරීමයි. (2) සමාජ ප්‍රශ්න අධ්‍යයනය කිරීමයි.
   (3) සමාජ කරුණ අධ්‍යයනය කිරීමයි. (4) සමාජ සංස්ථා අධ්‍යනය කිරීමයි.

9. සමාජ විද්‍යාඥයින්ගේ ඉගැන්වීම්වලට අනුව 'මානව සමාජය' යන සංකල්පය වඩාත් හොඳින් නිරූපණය වන්නේ මින් කවර අවස්ථාවේදී ද?
   (1) ගුවන් යානයක ගමන් ගන්නා මගීන් පිරිස
   (2) විහාරස්ථානයකට සම්බන්ධ දායක පිරිස
   (3) දුම්රිය පොළක සිටින මගීන් පිරිස
   (4) නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂක පිරිස

10. ' මානව පරිසරය මිනිසා හා ඒ සියල්ල අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාව හදාරණ විෂය සමාජ විද්‍යාවයි." මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
   (1) එලිසබෙත් ජේ.විල්කින්ස් ය. (2) එල්.ටී හොබ්හවුස් ය. (3) එම්.ජී ෆෙයාචයිල්ඩ් ය. (4) ජෝන් ස්ටුවට් මිල් ය.

* ප්‍රශ්න අංක 11 සහ 12 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සමාජ විද්‍යාඥයින්ගේ නම් උපයෝගි කර ගන්න.

(A) ඔගස්ට් කොම්ට් (B) එමිල් ඩූර්කයිම්
(C) කාල් මාක්ස් (D) හර්බට් ස්පෙන්සර්

11. සමාජ වෙනස්වීම පිළිබඳව පරිණාමවාදී ප්‍රවේශය ඔස්සේ අදහස් ඉදිරිපත් කළ මුල්කාලීන සමාජ විද්‍යාඥයින්ගේ නම් ඇතුළත් වරණය කුමක්ද?
   (1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) C හා D ය.

12. ගැටුම්වාදී න්‍යාය ඔස්සේ සමාජ විකාශනය පිළිබඳව අදහස් ඉදිරිපත් කළේ කවුද?
   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

13. එමිල් ඩූර්කයිම්ට අනුව මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවධිය වන්නේ,
   (1) ප්‍රාග් කොමියුනිස්ට් සමාජය යි. (2) දේවවාදී සමාජය යි.
   (3) රණකාමී සමාජය යි. (4) යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජය යි.

14. ප්‍රංශයේ පැවති වැඩවසම් සමාජ ක්‍රමය බිඳවැටී ලිබරල්වාදී පාලන ක්‍රමයක් බිහි වූයේ,
(1) 1689 දී ය. (2) 1789 දී ය. (3) 1889 දී ය. (4) 1989 දී ය.

15. නිෂ්පාදන ක්‍රියාවලිය නවීකරණයට ප්‍රබල සාධකයක් වූ කාර්මික විප්ලවය ආරම්භ වූයේ,
(1) 14 හා 15 වන සියවස්වලය. (2) 15 හා 16 වන සියවස්වලය.
(3) 16 හා 17 වන සියවස්වලය. (4) 18 හා 19 වන සියවස්වලය.

16. ආර්ථික සාධකය පමණක් ප්‍රමුඛ කර ගනිමින් සමාජ පරිණාමය ඉදිරිපත් කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා වන්නේ,
(1) මැක්ස් වේබර් ය. (2) කාල් මාක්ස් ය.
(3) ඔගස්ට් කොම්ට් ය. (4) හර්බට් ස්පෙන්සර් ය.

17. ඕනෑම පුද්ගලයෙකුගේ ක්‍රියාව මත, ඔහු හොඳ හෝ නරක පුද්ගලයෙකු බවට පත් වන බව විස්තර කෙරෙන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක්ද?
(1) කාලාම සූත්‍රය. (2) කූටදන්ත සූත්‍රය. (3) අස්සලායන සූත්‍රය. (4) වසල සූත්‍රය.

18. පුද්ගලාන්තර සබඳතා ගොඩනගා ගත යුතු ආකාරය විග්‍රහාත්මක ව දේශිත බෞද්ධ සූත්‍ර දේශනාව නම්,
(1) සිඟාලෝවාද සූත්‍රයයි. (2) පරිනිබ්බාන සූත්‍රයයි.
(3) පරාභව සූත්‍රයයි. (4) දම්සක් පැවතුම් සූත්‍රයයි.

19. සෑම මිනිසෙකුම හැකිතාක් ධනය උත්පාදනය කර ඒ දෙස බලා සිටින දෙවියන් වහන්සේ සතුටු කළ යුතු බව,
(1) මැක්ස් වේබර්ගේ අදහසයි. (2) කාල් මාක්ස්ගේ අදහසයි.
(3) ෆෙඩ්රික් එංගල්ස්ගේ අදහසයි. (4) ජෝන් කැල්වින්ගේ අදහසයි.

20. සමාජ ප්‍රභවය, විකාශනය, දියුණුව හා පිරිහීම, රාජ්‍ය බිහිවීම, සමාජ බෙදීම ආදී අවස්ථා පිළිබඳව ඉතා කදිමව විස්තර සපයන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?
(1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය. (2) සාමඤ්ඤඵල සූත්‍රය. (3) අරියපරියේසන සූත්‍රය. (4) අග්ගඤ්ඤ සූත්‍රය.

21. අරාබිකරයේ සිට පැමිණි වෙළෙඳුන්ගෙන් මෙරටට ව්‍යාප්ත වූ සංස්කෘතිය වන්නේ මින් කුමක්ද?
(1) ඉස්ලාම් සංස්කෘතිය (2) ක්‍රිස්තියානි සංස්කෘතිය
(3) හින්දු සංස්කෘතිය (4) අභිකුණ්ඨික සංස්කෘතිය

22. අභෞතික සංස්කෘතියට අයත් **නොවන** අංගය මින් කුමක්ද?
(1) සිරිත් විරිත් (2) කුට්ටම් පොකුණ (3) විශ්වාස (4) ධර්මතා

23. කිසියම් දුර්වල සංස්කෘතියක අංගයන් යටපත් කර ගෙන බලවත් සංස්කෘතියක ලක්ෂණ ව්‍යාප්තවීම සමාජ විද්‍යාවේ දී හඳුන්වන්නේ,
(1) සංස්කෘතික ව්‍යාප්තිය වශයෙනි. (2) සංස්කෘතික පරිණාමය වශයෙනි.
(3) සංස්කෘතික සම්පර්කය වශයෙනි. (4) සංස්කෘතික ගැටුම වශයෙනි.

24. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස අගය කරනුයේ,
(1) රැල්ෆ් ලින්ටන් ය. (2) රේමන්ඩ් ෆර්ත් ය. (3) ඇල්බට් කොහෙන් ය. (4) ඊ.බී ටයිලර් ය.

25. දරුවෙකු උපත ලැබීමට පෙර කළල අවධියේ සිට ම මව් කුස තුළ දී කායිකව හා මානසිකව පෝෂණය වන බව විවරණය කෙරෙන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක්ද?
(1) ඉන්දක සූත්‍රය (2) කාලාම සූත්‍රය
(3) සිඟාලෝවාද සූත්‍රය (4) කසීභාරද්වාජ සූත්‍රය

[4 වැනි පිටුව බලන්න.

* පහත සඳහන් කරුණු අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) සොරකම් නොකිරීම.　　(B) මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම.
(C) පරදාර සේවනයෙන් වැළකීම.　　(D) කුල භේදය පිටුදැකීම.

26. බෞද්ධ හා හිංදු යන ආගම් තුළ එන සමාන ඉගැන්වීම් පමණක් අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) A , B හා C ය.　(2) A , B හා D ය.　(3) A , C හා D ය.　(4) B , C හා D ය.

27. බයිබලය යනු,

(1) ඉස්ලාම් දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි.　(2) ක්‍රිස්තියානි දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි.
(3) හින්දු දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි.　(4) බමුණු දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි.

28. සාමාජියෙකු මිය ගොස් ශරීර උෂ්ණත්වය අවසන්වීමට පෙර වළලා දැමීම සිදු කරනුයේ,

(1) බෞද්ධ සමාජය තුළයි.　(2) ඉස්ලාම් සමාජය තුළයි.
(3) ක්‍රිස්තියානි සමාජය තුළයි.　(4) ජෛන සමාජය තුළයි.

29. ඉස්ලාම් ආගමික ඉගැන්වීමක් වන "පොහොසත් අය විසින් දිළිඳු අයට තමා සතු දෙයින් ප්‍රධානය කිරීම අනිවාර්ය අංගයකි." මෙම සංකල්පය හඳුන්වන්නේ,

(1) කලිමාව ලෙසයි.　(2) සලාතය ලෙසයි.　(3) හජ් ලෙසයි.　(4) සකාතය ලෙසයි.

30. ශ්‍රී ලාංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යන අංශයන් වෙනස්වීම කෙරෙහි හේතු සාධකයක් **නොවූයේ** මින් කුමක් ද?

(1) විජයාගමනය　(2) මහින්දාගමනය
(3) මැගලන් ලොව වටා ගමන් කිරීම　(4) බටහිර ආක්‍රමණ එල්ලවීම

31. දරුවෙකුට මව් කිරි දීමේදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත ඔහුගේ කායික හා මානසික පෞරුෂ වර්ධනය කෙරෙහි පිටිවහල් වන බව පෙන්වා දෙනු ලැබූ මානව විද්‍යාඥයින් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) රැල්ෆ් ලින්ටන් හා මාග්‍රට් මීඩ්　(2) මාග්‍රට් මීඩ් හා රූත් බෙනඩික්ට්
(3) රේමන්ඩ් ෆර්ත් හා රූත් බෙනඩික්ට්　(4) රැල්ෆ් ලින්ටන් හා රූත් බෙනඩික්ට්

* පහත සඳහන් සිදුවීම් උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

(A) දිසාපති, උප දිසාපති හා කච්චේරි ක්‍රමය හඳුන්වා දීම

(B) ඇඟ බද්ද, ඔරු බද්ද හා බලු බද්ද ආදී බදු හඳුන්වා දීම

(C) අපනයන බෝග වගාවන් සඳහා ඉන්දීය ශ්‍රමිකයින් බඳවා ගැනීම

D) ඉඩම් හා භූමිය විධිමත්ව පවත්වාගෙන යාමට තෝම්බු ක්‍රමය හඳුන්වා දීම

32. ඉංග්‍රීසි පාලන සමයේ දී ක්‍රියාත්මක වූ සිදුවීම් පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B　(2) A හා C .　(3) B හා C　(4) C හා D

33. අපගාමී චර්යාවලින් පුද්ගලයාටත් සමාජයටත් වන හානිය වඩාත් පුළුල්ව හා ගැඹුරු ලෙස අර්ථ දක්වා ඇති බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක්ද?

(1) අග්ගඤ්ඤ සූත්‍රය.　(2) කාලාම සූත්‍රය.　(3) පරාභව සූත්‍රය.　(4) මහා මංගල සූත්‍රය.

* පහත සඳහන් කරුණු උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) ආගමික සහයෝගීතාව

(B) ආගමික ගරුත්වය

(C) ආගමික බිය

(D) අන්තර් ආගමික සබැඳියාව

34. වර්තමාන ශ්‍රී ලාංකීක සමාජය තුළ දන්සල් දීම, වෙසක් තොරණ ඉදිකිරීම, පහන් පූජා, භක්ති ගීත ආදී කාර්යයන් සඳහා විවිධ ආගමික බැතිමතුන් සහභාගි වන බව කැපී පෙනෙන ලක්ෂණයකි. මේ තුළින් නිරූපිත සමාජ විද්‍යාත්මක වටිනාකම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A , B හා C ය. (2) A , B හා D ය. (3) A , C හා D ය. (4) B , C හා D ය.

35. ශ්‍රී ලාංකාවේ බෞද්ධ සමාජයක් නිර්මාණය වීමට බලපෑ ප්‍රබල සංසිද්ධිය වූයේ,

(1) දුමින්දාගමනය යි. (2) මහින්දාගමනය යි. (3) විජයාගමනය යි. (4) ශාක්‍යසිංහාගමනය යි.

36. අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) උගත් මානවයෙකු නිර්මාණය කිරීමයි.

(2) මෘදු හදවතක් ඇති මානවයෙකු නිර්මාණය කිරීමයි.

(3) පූර්ණ පෞරුෂයකින් හෙබි මිනිසෙකු නිර්මාණය කිරීමයි.

(4) වැඩ කිරීමට සමත් මානවයෙකු නිර්මාණය කිරීමයි.

* පහත සඳහන් ආගමික උත්සව උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) හජ්ජි උත්සවය. (B) දීපවාලී උත්සවය.

(C) රාමලාන් උත්සවය. (D) මහ සිකුරාදා.

37. ඉස්ලාම් ආගමිකයින්ගේ ආගමික උත්සව පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා D

38. ගැටුමකින් තොරව සමාජ පාලනය ගෙන යෑම උදෙසා දස පනත සම්මතයක් වශයෙන් අගය කරන්නේ කුමන ආගමිකයින් ද?

(1) කතෝලික (2) ශිව

(3) සුන්නි නිකායික (4) බ්‍රාහ්මණ

39. මානව විද්‍යා පර්යේෂණයන්හි නිරත වන පුද්ගලයාගේ පර්යේෂණාගාරය බවට පත්වන්නේ,

(1) සමාජය යි. (2) විද්‍යාගාරය යි. (3) ශල්‍යාගාරය යි. (4) කෞතුකාගාරය යි.

40. මානව සමාජය අධ්‍යයනය කරන විෂයයන් අතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) ජීව විද්‍යාව හා සමාජ විද්‍යාව. (2) මානව විද්‍යාව හා රසායන විද්‍යාව.

(3) භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව. (4) සමාජ විද්‍යාව හා මානව විද්‍යාව.

* * *

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All rights reserved

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

| 08 | S | I, II |
|---|---|---|

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test - 2022

(08) සමාජ විද්‍යාව - I, II

**04 ශ්‍රේණිය**

**සමාජ විද්‍යාව II පත්‍රය**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක් ද** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1.

(i) නාගරීකරණය හේතුවෙන් සමාජය තුළ ඇති වූ ගැටළු **දෙකක්** ලියන්න.

(ii) මානව චර්යාවන් අධ්‍යයනය කරන චර්යාමය විද්‍යා විෂයයන් **දෙකක්** නම් කරන්න.

(iii) එමිල් ඩූර්කයිම්ගේ විග්‍රහයට අනුව සමාජ පරිණාමය සිදු වූ ප්‍රධාන ආකාරයන් **දෙක** නම් කරන්න.

(iv) හර්බට් ස්පෙන්සර්ට අනුව රණකාමී සමාජයේ පැවති ලක්ෂණ **දෙකක්** ලියන්න.

(v) සමාජ පාලනයට මග පෙන්වන දේවධර්ම **දෙක** නම් කරන්න

(vi) සංස්කෘතියේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

(vii) ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතීන් **දෙකක්** සඳහන් කරන්න.

(viii) ශ්‍රී ලංකාව ආක්‍රමණයට පැමිණි බටහිර ජාතීන් **දෙකක්** නම් කරන්න.

(ix) පරිපූර්ණ අධ්‍යාපනයකින් බිහි කරන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(x) නාගරික ප්‍රදේශ තුළ ජනගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 10 = 20)

2.

(i) ඔබ අධ්‍යයනය කරන සමාජ විද්‍යාව හා සම්බන්ධ උප විෂය ක්ෂෙත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාජ විද්‍යාව බිහිවීම කෙරෙහි බලපෑම් කළ ප්‍රබල සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සමාජ අන්තර් සම්බන්ධතා පවත්වාගෙන යා යුතු ආකාරය සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ඉගැන්වීම **දෙකක්** ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05 යි)

3.

(i) සමාජ ගතික බව පිළිබඳ අවධානය යොමු කළ මුල් කාලීන සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකුගේ** නම් ලියන්න. (ලකුණු 02 යි)

(ii) "යථානුභූත අවධියේ" සමාජයේ පැවති ලක්ෂණයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලාංකේය ගොවි සමාජයේ දක්නට ලැබෙන 'කයිය' හා 'පංගුව' යන සංකල්ප දෙකෙහි ඇති සමාජ විද්‍යාත්මක වැදගත්කම පැහැදිළි කරන්න. (ලකුණු 05 යි)

[7 වැනි පිටුව බලන්න.

4.

(i) කාල් මාක්ස් පෙන්වා දුන් 'ධනවාදී' සමාජ අවධියේ සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) නවීකරණයට බඳුන්වූ සමාජයක් තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්‍ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) නාගරික සමාජය තුළ දක්නට ලැබෙන යහපත් ලක්‍ෂණයක් හා අයහපත් ලක්‍ෂණයක් සමාජ විද්‍යාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

5.

(i) ශ්‍රී ලංකේය සමාජයේ දක්නට ලැබෙන උප සංස්කෘතීන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) භෞතික සංස්කෘතිය තුළ දක්නට ලැබෙන අංගයන් සඳහා නිදසුන් **තුනක්** සපයන්න. (ලකුණු 03 යි)

(iii) ඉස්ලාම් ආගමිකයින් විසින් අනුගමනය කරන අනිවාර්ය ආගමික සංකල්පවල ඇති වැදගත්කම කරුණු **දෙකක්** ඔස්සේ විවරණය කරන්න. (ලකුණු 05 යි)

6.

(i) ආරෝපිත දිශානතිය සඳහා නිදසුන් **දෙකක්** සපයන්න. (ලකුණු 02 යි)

(ii) බහුවිධ සමාජයක දක්නට ලැබෙන ලක්‍ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) 'අගහස්දානය' හා 'කුරුළු පාළුව' යන සංකල්පවල ඇති සමාජ විද්‍යාත්මක අගය විමසීමට ලක් කරන්න. (ලකුණු 05 යි)

7.

(i) සමාජ පාලනය පිළිබඳව තොරතුරු අන්තර්ගත බෞද්ධ සූත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාජ පාලනයේදී උපයෝගී වන විධිමත් සමාජ පාලන ආයතන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ස්වයං පාලනයක් ගොඩනගා ගැනීමේදී වැදගත් වන බුදු දහමේ දැක්වෙන ඉගැන්වීම් **දෙකක්** අගය කරන්න. . (ලකුණු 05 යි)

8.

(i) පුද්ගලයා සමාජානුයෝජනය කරන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාජ සමූහයක දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සමාජ අපගාමී චර්යා අවම කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාට සිදු කළ හැකි කාර්යයන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

| 08 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2023**

පැය තුනයි

**04 ශ්‍රේණිය**

**(08) සමාජ විද්‍යාව - I, II**

අමතර කියවීම් කාලයය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**සමාජ විද්‍යාව I පත්‍රය**

**සැලකිය යුතුයි :**

- * ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
- * අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- * **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- * එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "සමාජ විද්‍යාව මිනිසාගේ සකල සමාජ ජීවිතය විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නකි." මෙය කාගේ නිර්වචනයක් ද?
   (1) එලිසබත් ජේ. විල්කින්ස්  (2) එල්. ටී. හොබ්හවුස්
   (3) ජෝන් ස්ටුවට් මිල්  (4) එමිල් ඩුර්කයිම්

2. සමාජ විද්‍යාව විෂයක් වශයෙන් ප්‍රංශයේ ආරම්භ වූයේ කුමන වර්ෂයේ දී ද?
   (1) 1838  (2) 1848  (3) 1858  (4) 1868

3. ජෝර්ජ් රිට්සර්ට අනුව බටහිර සමාජය වෙනස්වීමට බලපෑ සාධකයක් **නොවන්නේ** කුමක් ද?
   (1) විද්‍යාවේ වර්ධනය  (2) ආගමික ප්‍රතිසංස්කරණය
   (3) ගෝලීයකරණය  (4) නාගරීකරණය

- පහත කරුණු හොඳින් අධ්‍යයනය කර අංක 4 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

  A - නිල සංවිධාන සහ ආයතන පිහිටු වීම.
  B - වැටුප් ලබන ශ්‍රමික පිරිසක් බිහි වීම.
  C.- නාගරික සමාජය තුළ විවිධ ස්තර බිහි වීම.
  D - සාම්ප්‍රදායික සමාජයක් බිහි වීම.

4. කර්මාන්තශාලා බිහි වීමත් සමග ඒ ආශ්‍රිතව නගර නිර්මාණය වීම නිසා සමාජයේ සිදු වූ වෙනස්කම් පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) A, B හා C  (2) A, B හා D  (3) A, C හා D  (4) B, C හා D

- පහත කරුණු හොඳින් අධ්‍යයනය කර අංක 4 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

  A - මානසික අසහනය
  B - බුද්ධි ගලනය
  C.- ගණිකා වෘත්තිය
  D - අපරාධ

5. දහනවවන සියවස වන විට බටහිර සමාජය තුළ ඇති වූ විපර්යාසයන් නිසා එම රාජ්‍යයන්හි බහුලව දක්නට ලැබුණු සමාජ ගැටලු පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
   (1) A, B හා C  (2) A, B හා D  (3) A, C හා D  (4) B, C හා D

6. සමාජීය විද්‍යාවන් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර මින් කුමක් ද?
   (1) ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව
   (2) මනෝ විද්‍යාව, මානව විද්‍යාව, සමාජ විද්‍යාව
   (3) දේශපාලන විද්‍යාව, රසායන විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව
   (4) ජීව විද්‍යාව,මානව විද්‍යාව, තාරකා විද්‍යාව

[2 වැනි පිටුව බලන්න.

7. පුද්ගලයා සමාජයට අනුව හැඩගැසීමේ ක්‍රියාවලිය ................................ ලෙස හැඳින්වේ.
(1) සංස්කෘතික සංපර්පය (2) සමාජ ස්තරායණය
(3) සමාජ අන්තර් ක්‍රියාව (4) සමාජානුයෝජනය

8. "ලොව සියල්ල වෙනස් වේ" මෙය වඩාත් හොඳින් විග්‍රහ කෙරෙන්නේ බුදුදහමේ කුමන සංකල්පයෙන් ද?
(1) අනාත්ම සංකල්පය (2) අනිත්‍ය සංකල්පය
(3) දුක්ඛ සංකල්පය (4) කර්ම සංකල්පය

9. පුද්ගල හැකියාව අනුව ගොඩනගා ගන්නා තත්ත්වය හැඳින්වෙන්නේ,
(1) සාධිත තත්ත්වය ලෙස ය. (2) ආරෝපිත තත්ත්වය ලෙස ය.
(3) ගතික තත්ත්වය ලෙස ය. (4) ස්ථිතික තත්ත්වය ලෙස ය.

- පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කර 10 සිට 12 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - ප්‍රශ්න කිරීමට පෙළඹීම.
  B - විමර්ශනශීලී නොවීම.
  C - ලෝකය විද්‍යාත්මක ව පසක් කර ගැනීම.
  D - බියමුසු ගෞරවයක් තිබීම.
  E - දේව නිර්මාණයක්ය යන අදහසින් මිදීම.
  F - විශ්වාසය මත නොව දැනුම මත ක්‍රියා කිරීම.

10. දේවවාදී සමාජ අවධියේ ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද ?
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

11. පාර භෞතික සමාජ අවධියේ ලක්ෂණ නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
(1) A හා B ය. (2) A හා E ය. (3) B හා C ය. (4) E හා F ය.

12. යථානුභූත සමාජ අවධියේ ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(1) A හා B (2) A හා C (3) B හා F (4) C හා F

- පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කර 13 සහ 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - සරල බව හා ඒකාකාරී බව
  B - පෞද්ගලික අරමුණු ඇති බව
  C - අපි යන හැඟීමෙන් ක්‍රියා කිරීම
  D - සාරධර්ම පිළිබඳ සැලකිල්ල අඩු වීම
  E - පොදු අරමුණු ඇති බව
  F - සංකීර්ණ සමාජයක් තිබීම

13. යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජවල ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A, B හා D (2) A, C හා E (3) B, C හා E (4) D, E හා F

14. ඓන්ද්‍රීය ඒකාබද්ධතාව සහිත සමාජවල ලක්ෂණ පමණක් සඳහන් වරණය වන්නේ,
(1) A, B හා C ය. (2) B, C හා D ය. (3) B, D හා F ය. (4) C, E හා F ය.

15. රණකාමී සමාජ අවධියක සිට කාර්මික සමාජ අවධියක් දක්වා සමාජය පරිණාමය වූ බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා වන්නේ,
(1) ඔගස්ට් කොම්ට් ය. (2) හර්බට් ස්පෙන්සර් ය.
(3) එමිල් ඩුර්කයිම් ය. (4) මැක්ස් වෙබර් ය.

16. ප්‍රංශයේ වැඩවසම් රාජ්‍ය පාලනය බිඳ දමා ලිබරල්වාදී ධනේශ්වර පාලන ක්‍රමයක් ඇති කර ගන්නා ලද්දේ,
(1) ක්‍රි. ව. 1489 දී ය. (2) ක්‍රි. ව. 1589 දී ය. (3) ක්‍රි. ව. 1689 දී ය. (4) ක්‍රි. ව. 1789 දී ය.

17. කාර්මීකරණයේ ගාමක බලවේගය වූ දුම්රිය එන්ජිම සොයා ගනු ලැබුයේ කවුරුන් විසින් ද?
(1) ජේම්ස් වොට් (2) ජෝර්ජ් ස්ටීවන්සන් (3) ජෝන් කේ (4) එඩ්මන් කාට්රයිට්

- පහත සඳහන් A, B, C හා D යන සිද්ධි යුගල අධ්‍යයනය කර අංක 18 සහ 19 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A - (i) නාගරික ජනගහනය
  (ii) මුඩුක්කු නිවාස

  B - (i) දේශපාලන නවීකරණය
  (ii) වැඩවසම් පාලන සංවිධාන

  C - (i) කාර්මීකරණය
  (ii) අතිරික්ත නිෂ්පාදන

  D - (i) ජනමාධ්‍ය නවීකරණය
  (ii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම

18. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) B සහ D ය.

19. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක තෝරන්න.
(1) A සහ B (2) A සහ C (3) B සහ D (4) C සහ D

20. කාර්මීකරණය හේතු කොට ගෙන සාම්ප්‍රදායික ගැමි ආර්ථිකය වෙනුවට ගොඩනැගුණු නව ආර්ථිකය වන්නේ,
(1) ස්වයංපෝෂිත ආර්ථිකයයි. (2) කෘෂි ආර්ථිකයයි.
(3) සමාජවාදී ආර්ථිකයයි. (4) නාගරික ආර්ථිකයයි.

21. බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් උපත ලැබූ සමාජ ස්තරය කුමක් ද?
(1) ක්ෂත්‍රිය 2) වෛශ්‍ය (3) බමුණු (4) ශුද්‍ර

22. රජු දෙවියන්ගේ නියෝජිතයෙකු නොවන බවත් මහජන එකඟත්වය නැතහොත් මහා සම්මතයෙන් බිහි වන බවත් දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?
(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) කූටදන්ත සූත්‍රය (3) මහාමංගල සූත්‍රය (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

23. "දෙන ලද ජීවන රටාවක් ඇතුළත පුද්ගලයන් සමූහයක් සංවිධානය වී ඇති ආකාරය සංස්කෘතියයි." මෙම අදහස ඉදිරිපත් කළ මානව විද්‍යාඥයා කවුරුන් ද?
(1) රේමන්ඩ් ෆර්ත් (2) ඊ. බී. ටයිලර් (3) රැල්ෆ් ලින්ටන් (4) බී. මැලිනොවුස්කි

- පහත ප්‍රකාශ හොඳින් අධ්‍යයනය කර අංක 24 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

  A - සංස්කෘතිය කාලාන්තරයක් තිස්සේ හැඩගැසෙමින් සකස් වන්නකි.
  B - තමා අවට පරිසරයට අනුව ජීවත්වීමට ඉගෙන ගන්නේ සංස්කෘතියෙනි.
  C.- සංස්කෘතිය එකවර ම පහළ වන දෙයකි.
  D - සංස්කෘතිය අපගේ චර්යාවන්ට මඟපෙන්වයි.

24. සංස්කෘතිය සම්බන්ධව නිවැරදි ප්‍රකාශ පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

25. මව හා දරුවා අතර කළල අවස්ථාවේ සිට ම කායිකව හා මානසිකව මවගෙන් පෝෂණය ලබන බව දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?
(1) පරාභව සූත්‍රය (2) වසල සූත්‍රය (3) කාලාම සූත්‍රය (4) ඉන්දක සූත්‍රය

26. ශ්‍රී ලාංකේය සමාජයේ පැවති කුලය මත පදනම් වූ රාජකාරි ක්‍රමය අහෝසි කරන ලද්දේ,
(1) පෘතුගීසීන් විසිනි. (2) ද්‍රවිඩයන් විසිනි. (3) ඉංග්‍රීසීන් විසිනි. (4) ලන්දේසීන් විසිනි.

27. නොඉඳුල් ශෂ්‍යයේ අග්‍ර කොටස බුදුන්වහන්සේට පිදීමේ චාරිත්‍රය හැඳින්වෙන්නේ,
(1) අගහස්දානය ලෙසයි. (2) බුද්ධ පූජාව ලෙසයි.
(3) පේරු දානය ලෙසයි. (4) සාංඝික දානය ලෙසයි.

28. "යමෙකු තුළ ශරීරයෙහි, සිතෙහි සහ අධ්‍යාත්මයෙහි ඇති හොඳ ම දෙය පිටතට ඇද ගැනීම" අධ්‍යාපනය ලෙස ප්‍රකාශ කරනු ලැබුයේ කවුරුන් විසින් ද?
(1) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා (2) අනගාරික ධර්මපාලතුමා
(3) හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා (4) මහත්මා ගාන්ධිතුමා

- පහත දැක්වෙන කරුණු ඇසුරින් 29 හා 30 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
  A - අදහස්
  B - තත්ත්වය හා කාර්යභාරය
  C - විශ්වාස හා ඇදහිලි
  D - ආකල්ප
  E - ධර්මතා හෙවත් ප්‍රතිමාන
  F - සමාජ සංස්ථා

29. චර්යාවන් අනුව කටයුතු කරන ආකාරය විවෘත ව නොපෙනෙන ආවෘත සංස්කෘතියට අයත් අංග පමණක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) A, B හා C (2) A, C හා D (3) B, C හා D (4) B, E හා F

30. චර්යාව අනුව විවෘත ව තේරුම් ගැනීමට හැකියාව ඇති විවෘත සංස්කෘතියට අයත් සංකල්ප පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) A, C හා E ය. (2) B, C හා F ය. (3) B, E හා F ය. (4) C, D හා F ය.

31. ශ්‍රී ලංකාවේ පැරණි ගම් පිළිබඳ තොරතුරු දැක්වෙන "එදා හෙළ දිව" කෘතියේ කතුවරයා කවුද?
(1) නිව්ටන් ගුණසිංහ (2) නූර් යාල්මාන් (3) ඊ. ආර්. ලීච් (4) රොබට් නොක්ස්

- පහත දැක්වෙන ස්වයං පාලනයට උපකාරී වන බෞද්ධ සංකල්ප අධ්‍යයනය කර 32 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1.අප්පිච්ඡතා | A - ලද දෙයින් සතුටු වීම. |
| 2.සන්තුට්ඨිතා | B - පෝෂණය පහසු වීම. |
| 3.සල්ලේකතා | C - අල්පේච්ඡ බව |
| 4.සුභරතා | D - සැහැල්ලු පැවතුම් ඇති බව |

32. ඉහත 'අ' තීරුවේ කරුණුවලට අදාළව 'ආ' තීරුව ගැළපූ විට නිවැරදි වන්නේ කුමන පිළිතුර ද?
(1) A, B, C හා D (2) C, A, D හා B (3) C, B, A හා D (4) C, D, A හා B

- පහත සඳහන් ආගමික ඉගැන්වීම් හොඳින් අධ්‍යයනය කර 33 – 34 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
  A - පොහොසත් අය දුප්පත් අයට අනිවාර්යයෙන් දන් දිය යුතු ය.
  B - ප්‍රාණඝාතය නොකළ යුතු ය.
  C.- නිරතුරුව ම ප්‍රණාමයේ යෙදිය යුතු ය.
  D - කාමයෙහි වරදවා නොහැසිරය යුතු ය.
  E.- අදත්තාදානය නොකළ යුතු ය.

33. කතෝලික ආගමේ දැක්වෙන දසපනතේ ඇතුළත් කරුණු පමණක් නිවැරදිව සඳහන් වරණය තෝරන්න.
(1) A, B හා C (2) B, C හා D (3) B, D හා E (4) C, D හා E

34. ඉස්ලාම් භක්තිකයින්ගේ සිරිත් විරිත් ගොඩනැගීමට පාදක වූ මූලික ආගමික ඉගැන්වීම් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A හා C ය. (2) B හා C ය. (3) C හා D ය. (4) D හා E ය.

35. සාධිත තත්ත්වය හා සම්බන්ධ නිදසුන් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සිංහල, බෞද්ධ, ගුරුවරයා (2) නීතිඥ, නිළිය, ගුරුතුමිය
(3) දෙමළ, වෙල්ලාල, ගායකයා (4) මුස්ලිම්, පුරුෂයා, ඉස්ලාම්

36. පුද්ගලයෙකුට අධ්‍යාපනය ලබා ගත හැකි ක්‍රම අතුරින් වඩාත් ම වැදගත් වන්නේ,
(1) තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනයයි. (2) තමාට වැඩිහිටියන්ගෙන් ලැබෙන අධ්‍යාපනයයි.
(3) තමාට මාධ්‍යයෙන් ලැබෙන අධ්‍යාපනයයි. (4) තමාට පොතපතෙන් ලැබෙන අධ්‍යාපනයයි.

37. ප්‍රබල සංස්කෘතියක බලපෑමෙන් දුබල සංස්කෘතියක් වෙනස් කිරීම,
(1) සංස්කෘතික විසරණයයි. (2) සංස්කෘතික සම්පර්කයයි.
(3) සංස්කෘතික ගැටුමයි. (4) සංස්කෘතික කම්පනයයි.

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  ජයමග පිරිවෙනේ පහ ශ්‍රේණියේ ඉගෙනුම ලබන නන්ද හිමියන් ශ්‍රී ලංකාවේ නගර පාලනය පිළිබඳ ගවේෂණය කර වාර්තාවක් සකසන ලදී. එහි සඳහන් මූලික තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

  A - පණ්ඩුකාභය රජු නගර පාලනය සඳහා තනතුරක් ඇති කළ බව
  B - රාජධානි සමයේ ඇතුළු නුවර හා පිටි නුවර ලෙස නගරය කොටස් දෙකකට බෙදී තිබූ බව
  C.- වර්තමාන නගර පාලනය සම්බන්ධ පාරිපාලන ව්‍යුහය සැකසී ඇත්තේ ඉංග්‍රීසි පාලන සමයේ සිට බව

38. නන්ද හිමියන් A අක්ෂරය යටතේ සොයා ගත් තොරතුරුවලට අදාළව නගර පාලනයට පත් කළ නිලධාරියාගේ තනතුරු නාමය කුමක් ද?

    (1) නගර ගුත්තික (2) ගාමිණී (3) නගරාධිපති (4) ආරච්චිරාළ

39. B අක්ෂරයට අනුව ඇතුළු නුවර නම් නගර කොටසේ ඉදි කර තිබූ අංගයක් **නොවන්නේ** මින් කුමක් ද?

    (1) රාජ සභාව (2) නගර සේවකයන්ගේ නිවාස
    (3) ආගමික සිද්ධස්ථාන (4) ප්‍රභූ නිවාස

40. C අක්ෂරයට අනුව නගරයේ පරිපාලනය සම්බන්ධව පිහිටුවා ඇති ප්‍රධාන ආයතනය වන්නේ,

    (1) නගර සභාව (2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
    (3) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (4) ප්‍රාදේශීය සභාව

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

| 08 | S | I, II |
|---|---|---|

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

**මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2023**

**04 ශ්‍රේණිය**

**(8) සමාජ විද්‍යාව - II**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. i. සමාජ විද්‍යාව හා සම්බන්ධ උපවිෂය ක්ෂේත්‍ර **දෙකක්** ලියන්න.
ii. සමාජ සමූහයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
iii. පැරණි ශ්‍රී ලාංකික ගොවි සමාජයේ දක්නට ලැබුණු සංකල්ප **දෙකක්** ලියන්න
iv. බුදු දහමට අනුව දියුණුව **දෙයාකාර** වේ. ඒ මොනවා ද?
v. සෑම ආගමක ම පොදුවේ දැක ගත හැකි ලක්ෂණ **දෙක** කුමක් ද?
vi. සංස්කෘතියේ ප්‍රධාන කොටස් **දෙක** සඳහන් කරන්න.
vii. ශ්‍රී ලාංකේය ජන සමාජයේ සාමූහිකව පවත්වන ආගමික උත්සව **දෙකක්** සඳහන් කරන්න.
viii. බෞද්ධ සාරධර්ම විදහා දැක්වෙන තේමා ඔස්සේ රචිත සාහිත්‍ය කෘති **දෙකක්** නම් කරන්න.
ix. පෘතුගීසීන් පෙරදිගට පැමිණීමේ ප්‍රධාන පරමාර්ථ **දෙක** මොනවා ද?
x. හින්දු ආගමිකයින්ගේ දැඩි ආගමික භක්තිය පෙන්වන ආගමික චාරිත්‍ර විධි **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20යි)

2. i. පෞරාණික කතෝලික ආගම අභියෝගයට ලක් කර ආගමික ප්‍රතිසංස්කරණයක් ඇති කළ පූජකවරුන් **දෙදෙනා** නම් කරන්න. (ලකුණු 02යි)
ii. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
iii. සමාජයේ යහ පැවැත්ම සඳහා අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීමේ වටිනාකම සිගාලෝවාද සූත්‍රයේ සදිසා සංකල්පයේ කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

3. i. සමාජ සංස්ථාවල මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)
ii. මානව පවුලේ මූලික කෘත්‍යයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
iii. බෞද්ධ පංචශීලයේ සමාජ විද්‍යාත්මක වටිනාකම කරුණු **දෙකක්** ඇසුරින් අගයන්න. (ලකුණු 05යි)

4. i. සමාජ පරිණාමය යනු කුමක් ද? (ලකුණු 02යි)
ii. නූතන සමාජවල දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03යි)
iii. සමාජ පරිණාමය සිදු වූ ආරය අග්ගඤ්ඤ සූත්‍රයේ කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

5. i. සමාජ වෙනස් වීම අධ්‍යයනය කරන ප්‍රධාන න්‍යායන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)
ii. නවීකරණයේ යහපත් ප්‍රතිඵල **තුනක්** ලියන්න. (ලකුණු 03යි)
iii. පිරිවෙන් අධ්‍යාපනය සමාජ වෙනස්වීමට දායක වන බව සාධක **දෙකක්** ඇසුරින් තහවුරු කරන්න. (ලකුණු 05යි)

6. i. සංස්කෘතිය සඳහා නව නිර්වචනයක් සපයන්න. (ලකුණු 02යි)
ii. අවමංගල්‍ය අවස්ථාවක දී සිදු කෙරෙන සංස්කෘතික ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
iii. බුදු දහම කේන්ද්‍ර කරගෙන ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

7. i. ශ්‍රී ලාංකේය සමාජය සංවර්ධනයට අහිතකර ලෙස බලපාන ප්‍රධාන සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)
ii. බහුවිධ සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
iii. සමාජ ජීවිතය පහසු කරවන බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

8. i. ග්‍රාමීය සමාජ පාලනය සඳහා දායක වන තත්ත්වධාරීන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02යි)
ii. නාගරික සමාජ පාලනය සඳහා විධිමත් සංවිධාන ව්‍යුහයක් අවශ්‍ය වන්නේ ඇයි? හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
iii. සමාජ පාලනය සඳහා භික්ෂූන් වහන්සේගේ දායකත්වය කෙසේ සිදු විය යුතු ද? කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

* * *

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]
අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / fy;tp mikr;R - gpupntdhf;; fy;tpg; gpupT

# පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

04 ශ්‍රේණිය

(08) සමාජ විද්‍යාව - I, II

| 08 | S | I, II |
|---|---|---|

පැය තුන යි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## සමාජ විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. **"න්‍යාය හා සංකල්පවලින් ඔබ්බට ගොස් සමාජයේ අවශ්‍යතා ඉටු කරන ප්‍රායෝගික විෂයක් බවට සමාජ විද්‍යාව පත් ව ඇත"** මෙම අදහසට වඩාත් සමීප වන්නේ පහත කුමන අදහසක් ද?
   (1) සමාජ විද්‍යාව පැරණි විෂයක් බව යි. (2) සමාජ විද්‍යාව නව විෂයක් බව යි.
   (3) සමාජ විද්‍යාව ගැඹුරු විෂයක් නො වන බව යි. (4) සමාජ විද්‍යාව න්‍යායන් ද හඳාරන ප්‍රායෝගික විෂයක් වන බව යි.

2. සමාජ විද්‍යාව පිළිබඳ **එල්. ටී. හොබ්හවුස්ගේ** අදහස අනුව වඩාත් ම ගැළපෙන ප්‍රකාශය මින් කුමක් ද?
   (1) සියලු ම සමාජ විද්‍යාවන්ගේ මව යි.
   (2) සමාජ විද්‍යාව මානව වංශ විද්‍යාවකි.
   (3) මිනිසාගේ සමස්ත සමාජ ජීවිතය විෂය කොට ගත් විෂයකි.
   (4) සමාජ විද්‍යාවන් අතර සුවිශේෂ විෂය සමාජ විද්‍යාව යි.

3. **"සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ ව අධ්‍යයනය කරන විද්‍යාව යි."** යනුවෙන් දක්වා ඇත්තේ,
   (1) ඔගස්ට් කොම්ට් ය. (2) එමිල් ඩුර්කයිම් ය. (3) ජෝන් ස්ටුවර්ට් මිල් ය. (4) ඇන්තනී ගිඩ්න්ස් ය.

4. සමාජ විද්‍යාව විෂයේ ආරම්භ සම්බන්ධව නිවැරදි වරණය මින් කුමක් ද?
   (1) 18 වන සියවසේ මැද භාගයේ දී ප්‍රංශයේ දී ආරම්භ විය.
   (2) 19 වන සියවසේ මැද භාගයේ දී ප්‍රංශයේ දී ආරම්භ විය.
   (3) 19 වන සියවසේ මැද භාගයේ දී ජර්මනියේ දී ආරම්භ විය.
   (4) 20 වන සියවසේ මැද භාගයේ දී එංගලන්තයේ දී ආරම්භ විය.

5. බටහිර සමාජය විපර්යාසයට හේතු වූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ,
   (1) මාටින් ලූතර් හා මැක්ස් වේබර් විසිනි. (2) සෙන්ට් සිමෝන් හා ජෝන් කැල්වින් විසිනි.
   (3) මාටින් ලූතර් හා ජෝන් කැල්වින් විසිනි. (4) මැක්ස් වේබර් හා ජෝන් කැල්වින් විසිනි.

6. සමාජීය විද්‍යාවන් පමණක් සඳහන් නිවැරදි පිළිතුර මින් කුමක් ද?
   (1) මානව විද්‍යාව, මනෝවිද්‍යාව, ඉතිහාසය (2) මානව විද්‍යාව, පරිසර විද්‍යාව, ඉතිහාසය
   (3) රසායන විද්‍යාව, මනෝවිද්‍යාව, ඉතිහාසය (4) මානව විද්‍යාව, මනෝවිද්‍යාව, ජීව විද්‍යාව

7. යුරෝපීය සමාජයේ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි විපර්යාසයක් ඇති කිරීමට හේතු වූ ප්‍රධානතම සාධකය කුමක් ද?
   (1) දුම්රිය එන්ජිම නිපදවීම (2) බලවේග යන්ත්‍රය නිපදවීම
   (3) මියුල් යන්ත්‍රය නිපදවීම (4) හුමාල එන්ජිම නිපදවීම

8. වර්ෂ 1789 දී සිදු වූ ප්‍රංශ විප්ලවයේ වඩාත් ම වැදගත් සමාජ ප්‍රතිඵලය මින් කුමක් ද?
   (1) දඟසයවන ලුවී රජු පාලන බලයෙන් නෙරපීම
   (2) කතෝලික පල්ලියේ ආධිපත්‍යයෙන් නිදහස් වීම
   (3) රාජාණ්ඩු පාලන ක්‍රමය බිඳවැටීම
   (4) පුද්ගල නිදහස පදනම් කර ගත් දේශපාලන දර්ශනයකට මග පෑදීම

[2 වැනි පිටුව බලන්න.

9. ආරෝපිත තත්ත්වයට අදාළ **නො වන්නේ** පහත කුමන තත්ත්ව කුලකය ද ?
(1) කුලය (2) ජාතිය (3) ගුරු වෘත්තිය (4) ස්ත්‍රී පුරුෂ භාවය

- පහත සඳහන් සමාජ ලක්ෂණ ඉතා හොඳින් අධ්‍යයනය කර 10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - විමර්ශනශීලී නො වීම
B - නෛතික සම්බන්ධතා දක්නට ලැබීම
C - බිය මුසු ගෞරවයක් තිබීම
D - නිෂ්පාදන අතිරික්තයක් පැවතීම
E - ලෝකය දෙස විමර්නාත්මක ව බැලීම
F - ප්‍රාථමික ලක්ෂණ ඇති සමාජයක් තිබීම

10. ඔගස්ට් කොම්ට්ට අනුව දේවවාදී අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, C හා F (3) B, D හා E . (4) D, E හා F

11. ඔගස්ට් කොම්ට් දැක්වූ ලෙස පාර භෞතික අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,
(1) A, B හා C ය. (2) A, C හා F ය. (3) B, D හා E ය. (4) D, E හා F ය.

- පහත සඳහන් සමාජ ලක්ෂණ ඉතා හොඳින් අධ්‍යයනය කර 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දේපළ පිළිබඳ පොදු අයිතියක් තිබීම
B - නිෂ්පාදන සාධකවල වැඩි අයිතිය ධනපතියා සතු ව තිබීම
C - ලාභය පදනම් කර ගෙන නිෂ්පාදනයන් සිදු වීම
D - පන්ති ස්තරායණයක් නොමැති වීම
E - ශ්‍රම සූරාකෑමක් නො වීම
F - සමාජයේ පන්ති ගැටුම් නිර්මාණය වීම

12. කාල් මාක්ස්ට අනුව ධනවාදී අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, C හා F (3) B, C හා F . (4) D, E හා F

13. කාල් මාක්ස් දැක්වූ ලෙස සමාජවාදී අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,
(1) A, B හා C ය. (2) A, D හා E ය. (3) B, D හා E ය. (4) D, E හා F ය.

14. හර්බට් ස්පෙන්සර් දැක්වූ ලෙස සමාජ පරිණාම සිදු වූයේ,
(1) රණකාමී අවධියේ සිට කාර්මික අවධිය දක්වා ය. (2) කාර්මික අවධියේ සිට රණකාමී අවධිය දක්වා ය.
(3) රණකාමී අවධියේ සිට ඓන්ද්‍රීය අවධිය දක්වා ය. (4) යාන්ත්‍රික අවධියේ සිට කාර්මික අවධිය දක්වා ය.

15. ඔගස්ට් කොම්ට් දැක්වූ මානව සමාජ ප්‍රගතියේ උසස් ම අවධිය වූ යථානුභූත අවධියේ සමාජ ලක්ෂණක් **නො වන්නේ** මින් කුමක් ද ?
(1) විශ්වාසය මත නො ව දැනුම මත ක්‍රියා කිරීම
(2) ලෝකය විද්‍යාත්මක ව තේරුම් ගැනීම
(3) නිර්මාණාත්මක ව අලුත් තත්ත්වයන්ට මුහුණ දීම
(4) ස්වාභාවික සංසිද්ධීන්ට දේව බලයක් ආරෝපණය කිරීම

- පහත සඳහන් වගකීම් හොඳින් අධ්‍යයනය කර 16 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - රටවැසියන්ගේ ද පරිසරයේ ද ආරක්ෂාව සැලසීම
B - රටේ සාමය පවත්වා ගැනීම
C - දේව නියමයන්ට අනුව රාජ්‍ය පාලනය කිරීම
D - සාධාරණ ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

16. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ඉගැන්වීම්වලට අනුව රාජ්‍ය පාලකයාගේ වගකීම් පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

17. කාර්මීකරණයේ මූලික ලක්ෂණය **නො වන්නේ** මින් කුමක් ද ?
(1) තරඟකාරී ආර්ථික ක්‍රමයක් තිබීම
(2) දියුණු ප්‍රවාහන පද්ධතියක් තිබීම
(3) සරල ආර්ථික ක්‍රමයක් තිබීම .
(4) සංකීර්ණ ශ්‍රම විභජනයක් තිබීම

- පහත සඳහන් සාධක හොඳින් අධ්‍යයනය කර 18 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - නවීකරණය
B - කාර්මීකරණය
C - නාගරීකරණය
D - දේශපාලනීකරණය

18. දීර්ඝ කාලීන සමාජ වෙනස් වීම කෙරෙහි බලපාන මූලික සාධක පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

- ආධිපත්‍ය සම්බන්ධ පහත සඳහන් සාධක හොඳින් අධ්‍යයනය කර 19වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - සාම්ප්‍රදායික ආධිපත්‍යය
B - අනුභාසාත්මක ආධිපත්‍ය
C - අධි ස්වාභාවික ආධිපත්‍යය
D - නෛතික ආධිපත්‍යය

19. මැක්ස් වෙබර් නම් සමාජ විද්‍යාඥයාගේ අධිපත්‍ය වර්ගීකරණයට අයත් සංකල්ප තුන අයත් වරණය වනුයේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

20. පැරණි ශ්‍රී ලාංකේය ගොවි සමාජයේ දක්නට ලැබුණු **'කයිය'** යන සංකල්පයේ සමාජ විද්‍යාත්මක වටිනාකම දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) සියලු දෙනා එකට වැඩ කිරීම (2) අස්වැන්න සියලු දෙනා අතර බෙදා ගැනීම
(3) කන්නයට අනුව වැඩ ඇරඹීම (4) අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතු ව වැඩ කිරීම

21. "මිනිසාගේ මනෝකායික අවශ්‍යතාවන් සපුරා ගැනීමට ඇති කරගත් දෙය සංස්කෘතිය" යනුවෙන් සංකෘතිය යන්න නිර්වචනය කරන ලද්දේ,
(1) බ්‍රැනිස්ලෝ මැලිනොවුස්කි ය. (2) රේමන්ඩ් ෆර්ත් ය.
(3) රැල්ෆ් ලින්ටන් ය. (4) ඒ. ආර්. රැඩ්ක්ලිෆ් බ්‍රවුන් ය.

22. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස සැලකෙනුයේ,
(1) රේමන්ඩ් ෆර්ත් ය. (2) ඇල්බට් කොහෙන් ය. (3) සිග්මන් ෆ්‍රොයිඩ් ය. (4) ඊ. බී. ටයිලර් ය.

23. ඉංග්‍රීසින් විසින් මුළු දිවයින ම යටත් විජිත පාලනය යටතට පත් කර ගන්නා ලද්දේ,
(1) 1815 දී ය. (2) 1818 දී ය. (3) 1833 දී ය. (4) 1948 දී ය.

- ප්‍රශ්න අංක 24 - 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක උපයෝගී කර ගන්න.

A - කුල භේදය
B - අදහස්
C - සමාජ පන්ති
D - විශ්වාස
E - ඇදහිලි
F - ආගමික බෙදීම්

24. ආවෘත්ත සංස්කෘතික ස්වභාවය තේරුම් ගැනීමට අවශ්‍ය කරුණු පමණක් නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද ?
(1) A, B හා C ය. (2) A, B හා E ය. (3) B, D හා E ය. (4) C, E හා F ය.

25. විවෘත්ත සංස්කෘතික ලක්ෂණ පමණක් දක්නට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A, B හා C (2) A, C හා F (3) B, D හා E (4) C, E හා F

26. අතීත ශ්‍රී ලාංකේය සමාජයේ කන්න තුනක් ගොවිතැන් කළ බව දැක්වෙන සෙල්ලිපිය කුමක් ද ?
(1) මිහින්තලා සෙල්ලිපිය (2) තෝණිගල සෙල්ලිපිය
(3) දිඹුලාගල සෙල්ලිපිය (4) රජගල සෙල්ලිපිය

27. රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ඇඟ බද්ද, ඔරු බද්ද, බලු බද්ද, සෙරෙප්පු බද්ද වැනි බදු වර්ග මෙරටට හඳුන්වා දෙන ලද්දේ කුමන පාලන යුගයේ දී ද?
(1) ලන්දේසි පාලන යුගය (2) ඉංග්‍රීසි පාලන යුගය
(3) චෝල පාලන යුගය. (4) පෘතුගීසි පාලන යුගය

[4 වැනි පිටුව බලන්න.

- පහත සඳහන් සිද්ධි යුගල ඉතා හොඳින් අධ්‍යයනය කර 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A - (i) අටලෝදහමින් අකම්පිත වීම
  (ii) මානව හිතවාදී චර්යා

  B - (i) පාප මිත්‍ර සේවනය
  (ii) පුද්ගල දියුණුව

  C - (i) මව්පිය දූ දරු සම්බන්ධතා
  (ii) මානව පවුලේ දියුණුව

  D - (i) තෘෂ්ණාව
  (ii) පරිත්‍යාගශීලී භාවය

28. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) වැඩි වීම කෙරෙහි බලපාන නිවැරදි සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

29. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) අඩු වීම කෙරෙහි බලපාන වඩාත් නිවැරදි සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) C සහ D ය. (3) A සහ C ය. (4) B සහ D ය.

30. **"සාරධර්මවල බලපෑම තුළින් සමාජය වෙනස් වන බව"** පෙන්වා දෙමින් සාරධර්මවල වටිකම පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුරුන් ද ?
(1) ඒස්. පාර්ක් (2) එච්. පී. ෆෙයාවයිල්ඩ් (3) හැරී ඒම්. ජොන්සන් (4) ටැල්කොට් පාසන්ස්

- පහත සඳහන් සංක්‍රමණ හා ආක්‍රමණ හොඳින් අධ්‍යයනය කර 31වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - විජයාගමනය
B - එළාර ආක්‍රමණය
C - මහින්දාගමනය
D - ඉංග්‍රීසි ආක්‍රමණය

31. ශ්‍රී ලාංකේය සමාජයේ දීර්ඝ කාලීන හා පරිවර්තනීය සමාජ වෙනස් වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

32. "අගහස් දානය" ලෙස හැඳින්වෙන්නේ,
(1) අලුත් අවුරුදු උත්සවය යි. (2) තෛපොන්ගල් උත්සවය යි.
(3) වප්මගුල් උත්සවය යි. (4) අලුත්සහල් මංගල්‍යය යි.

- පහත සඳහන් සාධක හොඳින් අධ්‍යයනය කර 33වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - පරිපාලන කේන්ද්‍රස්ථාන
B - කර්මාන්ත පුරවර
C - සෞඛ්‍ය පහසුකම්
D - මුඩුක්කු නිවාස

33. ශ්‍රී ලාංකේය සමාජයේ නාගරීකරණය වේගවත් වීම කෙරෙහි බලපාන සාධක පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

34. ඉතිහාසඥ, **ගිබන්**ට අනුව පුද්ගලයෙකුට අධ්‍යාපනය ලබා ගත හැකි ක්‍රම අතුරින් වඩාත් වැදගත් ක්‍රමය කුමක් ද ?
(1) ගුරුවරුන්ගෙන් ලැබෙන අධ්‍යාපනය (2) තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනය
(3) දෙමාපියන්ගෙන් ලැබෙන අධ්‍යාපනය (4) වැඩිහිටියන්ගෙන් ලැබෙන අධ්‍යාපනය

35. **"යමෙකු තුළ ශරීරයෙහි, සිතෙහි සහ අධ්‍යාත්මයෙහි ඇති හොඳ ම දෙය පිටතට ඇද ගැනීම"** අධ්‍යාපනය ලෙස හඳුන්වන ලද්දේ,
(1) මහත්මා ගාන්ධිතුමා ය. (2) අනගාරික ධර්මපාලතුමා ය.
(3) ජවහර්ලාල් නේරුතුමා ය. (4) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය.

36. අතීතයේ දී ගම පාලනය කිරීම සඳහා 'ගමික' නමින් පිහිටුවන ලද තනතුරෙහි වර්තමාන නිල නාමය කුමක් ද?
(1) ග්‍රාම සේවක (2) ගම්මුලාදෑනි (3) ආරච්චිරාල (4) ග්‍රාම නිලධාරී

37. හින්දු ආගමික ඉගැන්වීම් අනුව **අධර්මානුකූල වූවන්ගේ නැසීම** සිදු කරනු ලබන්නේ,
   (1) විෂ්ණු දෙවියන් විසිනි. (2) මහාබ්‍රහ්මයා විසිනි.
   (3) ගණේෂ දෙවියන් විසිනි. (4) ශිව දෙවියන් විසිනි.

38. ඉස්ලාම් ආගමික සිරිත් විරිත් ගොඩනැගීමෙහි ලා මූලික වූ ආගමික ධර්මයක් වන **සලාතය** යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
   (1) නිරතුරුව ම නැමදීමෙහි යෙදීම යි. (2) දුප්පතුන් වෙනුවෙන් අනිවාර්ය දන් දීම යි.
   (3) දිවා කාලයේ ආහාරයෙන් වැළකී සිටීම යි. (4) මක්කම වන්දනාවේ යෙදීම යි.

39. කතෝලික ආගමිකයින්ගේ සමාජ පාලනයේ පදනම වන **දස පනතට** අයත් කරුණක් **නො වන්නේ** මින් කුමක් ද?
   (1) ප්‍රාණඝාතය නො කරව යන්න යි. (2) කාමයයෙහි වරදවා නො හැසිරෙව යන්න යි.
   (3) අදත්තාදානය නො කරව යන්න යි. (4) තාගේ මවුපියන්ට ගෞරව පූජා නො කරව යන්න යි.

40. බුදු දහමේ ඉගැන්වීම් අනුව සමාජ පාලනයේ මූලික අඩිතාලම වනුයේ,
   (1) පඤ්චශීලයට අනුගත ව ජීවත් වීම යි. (2) දහම් අධ්‍යාපනයට යොමු වීම යි.
   (3) නිරතුරු ව ධර්මය ශ්‍රවණය කිරීම යි. (4) ආමිස පූජාවන් සිදු කිරීම යි.

* * *

[ සියලුම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / fy;tp mikr;R - gpupntdhf; fy;tpg; gpupT

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024

## 04 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - II

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරා ගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1.
(i) පවුල් ජීවිතයේ බිඳ වැටීම නිසා ඇති වන ප්‍රධාන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
(ii) ලෝකයේ පවතින විද්‍යාවන් වර්ග කළ හැකි ප්‍රධාන කොටස් **දෙක** මොනවා ද?
(iii) සමාජ විද්‍යාඥයින් සමාජ සංවර්ධනය ප්‍රධාන අවධි **දෙකකට** ගොනු කර ඇත. ඒවා මොනවා ද?
(iv) බුදු දහමට අනුව දියුණුව **දෙයාකාර** වේ. ඒ මොනවා ද?
(v) සංස්කෘතියේ ප්‍රධාන කොටස් **දෙක** ලියන්න.
(vi) සමාජ විද්‍යාඥයින්ට අනුව සෑම ආගමක ම පොදුවේ දැක ගත හැකි ලක්ෂණ **දෙක** සඳහන් කරන්න.
(vii) ශ්‍රී ලාංකේය සමාජය තුළ ජීවත් වන ජනවර්ග **දෙකක්** සඳහන් කරන්න.
(viii) රාජ්‍ය පාලනය සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ මූල ධර්ම දෙකක් ලියන්න.
(ix) සමාජ පාලනයක් අවශ්‍ය වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න.
(x) සමාජ පාලන කාර්ය සඳහා නායකත්වය සපයන භික්ෂුවක් තුළ තිබිය යුතු ගුණාංග **දෙක** ලියන්න.

(ලකුණු 02 × 10 = 20යි)

2.
(i) සමාජ විද්‍යාව පිළිබඳ ව අර්ථකථනයක් සපයන්න. (ලකුණු 02 යි)
(ii) බටහිර සමාජය විපර්යාසයන්ට ලක් වීමට බලපෑ හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
(iii) බුදු දහමේ සමාජ සම්බන්ධතා පිළිබඳ දැක්වන ආකල්පය, සිගාලෝවාද සූත්‍රයේ කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3.
(i) ප්‍රාථමික සමාජ සමූහයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ii) සමාජ විද්‍යාවේ උපවිෂය ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) මානව පවුලේ කාර්යභාරයන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4.
(i) සමාජ පරිණාම අධ්‍යයනය කිරීමට උපයොගි කර ගත හැකි සමාජයානුබද්ධ සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) නවීකරණයේ අංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) ශීලය පදනම් ව ගොඩනැගී ඇති බෞද්ධ සමාජ පන්ති ක්‍රමයේ වටිනාකම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

5.
(i) සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් සපයන්න. (ලකුණු 02 යි)
(ii) සංස්කෘතිය මගින් සිදු වන සේවාවන් තුනක් ලියන්න. (ලකුණු 03 යි)
(iii) බුදු දහම නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[7 වැනි පිටුව බලන්න.

6.

(i) සමාජයක් යනු කුමක් දැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) බටහිර ආක්‍රමණ නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) යහපත් රාජ්‍ය පාලන ක්‍රමයක් ගොඩනැගීම සඳහා දසරාජධර්ම උපයෝගි කර ගැනීමේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

7.

(i) තත්ත්වයෙහි කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සරල හෙවත් ග්‍රාමීය සමාජවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) යහපත් සමාජ ජීවිතයක් සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න.(ලකුණු 05 යි)

8.

(i) නගරික සමාජය තුළ දක්නට ලැබෙන සමාජ ගැටලු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පූර්ණ අධ්‍යාපනයක් තුළින් බිහි කෙරෙන පුරවැසියෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලාංකේය සමාජ පාලනය සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට සිදු කළ හැකි කාර්යභාරයන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

# සමාජ විද්‍යාව

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය 2018

## Primary Piriven Year End Tearm Test - 2018

### 04 ශ්‍රේණිය/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II — කාලය : පැය තුන යි

Sociology I, II — Time : Three Hours

සමාජ විද්‍යාව I

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ).
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. සමාජ විද්‍යාව මානව වංශ විද්‍යාව ලෙස නම් කළේ කවුරුන් ද?

i. ජෝන් ස්ටුවට් මිල්   ii. කාල් මාක්ස්
iii. එලිසබත් ජේ විල්කින්ස්   iv. හර්බර්ට් ස්පෙන්සර්

02. ''සමාජ ශාස්ත්‍රවල රැජිණ සමාජ විද්‍යාව යි'' මෙය කාගේ ප්‍රකාශයක් ද?

i. මාටින් ලූතර්   ii. මැක්ස් වේබර්
iii. ජේම්ස් වොට්   iv. ඔගස්ට් කොම්ට්

03. සමාජ විද්‍යාව විෂයයක් ලෙස ආරම්භ වූයේ,

i. 1899 දී ය.   ii. 1942 දී ය.   iii. 1974 දී ය.   iv. 1838 දී ය.

04. කර්මාන්ත ක්ෂේත්‍රයෙහි විපර්යාසයක් ඇති කළ වාෂ්පබල එන්ජිම කාගේ නිර්මාණයක් ද?

i. ජේම්ස් වොට්   ii. ජෝර්ජ් රිට්සර්
iii. ජෝන් කැල්වින්   iv. මාර්ටින් ලූතර්

05. ස්වභාවික විද්‍යා විෂය ක්ෂේත්‍රයට ඇතුළත් නොවන්නේ,

i. වාස්තු විද්‍යාව යි.   ii. භූගර්භ විද්‍යාව යි.
iii. ගණිතය යි.   iv. දේශපාලන විද්‍යාව යි.

06. පහත සඳහන් අය අතරින් සමාජ විද්‍යාඥයෙකු නොවන්නේ,

i. ඔගස්ට් කොම්ට් ය.   ii. හර්බට් ස්පෙන්සර් ය.
iii. කාල් මාක්ස් ය.   iv. චාල්ස් ඩාවින් ය.

07. මැක්ස් වේබර් නම් සමාජ විද්‍යාඥයාගේ සමාජ පරිණාමය පිළිබඳ කියැවෙන සංකල්ප තුන අයත් වරණය වනුයේ,

A සාම්ප්‍රදායික ආධිපත්‍යය   C බල ආධිපත්‍යය
B අනුභාසාත්මක ආධිපත්‍යය   D නෛතික ආධිපත්‍යය

i. A, B, C යි.   ii. A, C, D යි.   iii. A, B, D යි.   iv. B, C, D යි.

08. දිගුකාලීන සමාජ වෙනස්වීම කෙරෙහි බලපාන මූලික සාධකයක් නොවන්නේ,

i. නවීකරණය යි.
ii. කාර්මීකරණය යි.
iii. දේශපාලනීකරණය යි.
iv. නාගරීකරණය යි.

09. ප්‍රංශයේ එතෙක් පැවති වැඩවසම් රාජ්‍ය පාලනය බිඳ දැමූ වර්ෂය කුමක් ද?

i. 1789
ii. 1875
iii. 1753
iv. 1821

10. සංස්කෘතිය පිළිබඳ කතා කිරීමේ දී නිතර යොදාගන්නා එළඹුම් තුනකි.

A සමාජ විද්‍යාත්මක එළඹුම
C මානව විද්‍යාත්මක එළඹුම
B රසායන විද්‍යාත්මක එළඹුම
D සෞන්දර්යාත්මක එළඹුම

i. B, C, D
ii. A, C, D
iii. D, C, B
iv. A, B, D

11. ''දෙන ලද ජීවන රටාවක් ඇතුළත පුද්ගලයන් සමූහයක් සංවිධානය වී ඇති ආකාරය සංස්කෘතිය යි'' යන්න කාගේ නිර්වචනයක් ද?

i. ඊ.බී. ටයිලර්
ii. රේමන්ඩ් ෆර්ත්
iii. රුල්ෆ් ලින්ටන්
iv. බි. මැලිනොව්ස්කි

12. සෑම ආගමක් ම පොදු ලක්ෂණ හතරක් මත පදනම් වී ඇත. එයට අයත් නොවන්නේ කුමක් ද?

i. ආගමික චාරිත්‍ර විධි
ii. ආගමික විශ්වාස
iii. ආගමික විභජනය
iv. ආගමික සංවිධාන

13. සලාතය අයත් වන්නේ,

i. හිංදු සංස්කෘතියට ය.
ii. ඉස්ලාම් සංස්කෘතියට ය.
iii. ක්‍රිස්තියානි සංස්කෘතියට ය.
iv. ජෛන සංස්කෘතියට ය.

14. ඉංග්‍රීසීන් විසින් මුළු දිවයින ම යටත් විජිත පාලනය යටතට පත් කර ගන්නා ලද්දේ,

i. 1815 දී ය.
ii. 1850 දී ය.
iii. 1905 දී ය.
iv. 1822 දී ය.

15. ''බොහෝ කාලයක් ජීවත් වූ පුද්ගල එකතුව සමාජය'' යනුවෙන් ප්‍රකාශ කළ මානව විද්‍යාඥයා වනුයේ,

i. මැක්ස් වේබර් ය.
ii. ඔගස්ට්ට් කොම්ට් ය.
iii. රැල්ෆ් ලින්ටන් ය.
iv. කාල් මාක්ස් ය.

16. මව් කුසේ දී දරුවා කළලයේ සිට මවගෙන් කායිකව හා මානසිකව පෝෂණය ලබන බව සඳහන් සූත්‍රය වනුයේ,

i. සිගාලෝවාද සූත්‍රය යි.
ii. මංගල සූත්‍රය යි.
iii. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
iv. ඉන්දක සූත්‍රය යි.

17. බටහිර මනෝ විද්‍යාවේ පියා ලෙස සැළකෙනුයේ,

i. කාල් මාර්ක්ස් ය.
ii. හොබ්ස් හවුස් ය.
iii. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් ය.
iv. මැක්ස් වේබර් ය.

18. පුද්ගලයන්ගේ පෞරුෂ වර්ධනයට සමාජය හා සංස්කෘතිය බොහෝ සේ බලපාන බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනා වන්නේ,

i. හොබ්ස් හවුස් සහ මැක්ස් වේබර් ය. ii. මාග්‍රට් මීඩ් සහ රූත් බෙනඩික් ය.

iii. හොබ්ස් හවුස් සහ කාල් මාර්ක්ස් ය. iv. ඔගස්ට් කොම්ට් සහ එමිල් ඩුර්කයිම් ය.

19. ඉංග්‍රීසීන් මෙරටට පැමිණි වර්ෂය වනුයේ,

i. 1796 දී ය. ii. 1802 දී ය.

iii. 1977 දී ය. iv. 1505 දී ය.

20. සමාජ පාලනයට උපයෝගි වන දේවධර්ම අයත් වන්නේ පහත සඳහන් කිනම් පිළිතුරට ද?

i. සීල - සමාධි ii. හිරි - ඔතප්

iii. සැප - දුක . iv. නින්දා - ප්‍රසංසා

21. මානව වර්ගයාගේ ආරම්භයෙන් පසු ක්‍රමයෙන් තෘෂ්ණාව, ආහාර පිළිබඳ ලෝභය, කාමසේවනය, හොරකම, මුසාව, ප්‍රජා ඝාතනය ඇති වූ බව සඳහන් සූත්‍රය වන්නේ

i. සිඟාලෝවාද සූත්‍රය යි. ii. කූටදන්ත සූත්‍රය යි.

iii. අග්ගඤ්ඤ සූත්‍රය යි. iv. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.

22. ක්ලිෆර්ඩ් ගියට්ස්ගේ පැහැදිලි කිරීමට අනුව ලෝකයේ ප්‍රථම ගම්මානය බිහිවූයේ,

i. ඉරාකයේ ය. ii. රුසියාවේ ය.

iii. අප්‍රිකාවේ ය. iv. ඇමරිකාවේ ය.

23. වර්තමාන ලංකාවේ ජනගහනයෙන් 80%ක් පමණ ජීවත් වන්නේ,

i. මහ නගරවල ය. ii. කුඩා නගරවල ය.

iii. ගම්වල ය. iv. මධ්‍යම නගරවල ය.

24. ශ්‍රී ලංකාවේ උඩරට රාජධානියේ වසර 20ක් පමණ සිරකරුවෙකු සිට ''එදා හෙළ දිව'' කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

i. මැක්ස් වේබර් විසින් ය. ii. බ්‍රවුන්ඩ්‍රික් විසින් ය.

iii. කෝල් බෘක් විසින් ය. iv. රොබට් නොක්ස් විසින් ය.

25. ඉංග්‍රීසි ආණ්ඩුව විසින් හඳුන්වා දුන් (village Hedman) ගම් ප්‍රධානියා යන තනතුර වර්තමානයේ හඳුන්වනු ලබන්නේ,

i. ගමික ලෙස ය. ii. ගමරාළ ලෙස ය.

iii. ආරච්චිරාළ ලෙස ය. iv. ග්‍රාම නිලධාරි ලෙස ය.

26. ලෝකයේ ඇති වූ ශිෂ්ටාචර අතුරින් දෙගම්මැදි ශිෂ්ටාචාරය ලෙස සලකනුයේ,

i. නයිල් නිම්න ශිෂ්ටාචාරයට ය. ii. යුප්‍රටීස් ටයිග්‍රීස් ශිෂ්ටාචාරයට ය.

iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට ය. iv. ගංගා නිම්න ශිෂ්ටාචාරයට ය.

27. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කළේ ක්‍රිස්තු පූර්ව කිනම් සියවසේ දී ද?

i. ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේ දී ය. ii. ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේ දී ය.

iii. ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ දී ය. iv. ක්‍රිස්තු පූර්ව 2 වන සියවසේ දී ය.

28. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත පහත ඉගැන්වීම් අතරින් 'තම ජීවිතය පහසුවෙන් පෝෂණය කළ හැකි' බව සඳහන් පාඨය කුමක් ද?

i. සුභරතා
ii. සල්ලේතා
iii. අප්පිච්ඡතා
iv. සන්තුට්ඨිතා

29. ''බෞද්ධයන්ගේ අත් පොත ලෙස'' හඳුන්වන ග්‍රන්ථය කුමක් ද?

i. පිරිත්පොත
ii. ධම්ම පදය
iii. ජාතකපොත
iv. ත්‍රිපිටකය

30. මහසඟරුවනේ අනුශාසනාව ලැබ දිග් විජය වෙනුවට ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කළ රජතුමා වන්නේ,

i. දේවානම්පියතිස්ස රජතුමා ය.
ii. අජාසත්ත රජතුමා ය.
iii. අශෝක රජතුමා ය.
iv. බිම්බිසාර රජතුමා ය.

31. සමාජ ප්‍රශ්නයක් වශයෙන් සමාජ විද්‍යාත්මකව පිළිගත නොහැක්කේ මෙයින් කුමක් ද?

i. ආත්ම ඝාතනය
ii. ගණිකා වෘත්තිය
iii. අපරාධ
iv. අඹු සැමි ආරවුල්

32. මදිරාබාධය යනුවෙන් විස්තර වන්නේ,

i. විරැකියාව යි.
ii. ජනවාර්ගික අර්බුදාය යි.
iii. මත්පැන් පානය යි.
iv. ඒඩ්ස් රෝගය යි.

33. දිවි නසා ගැනීම වීර ක්‍රියාවක් සේ සලකන නොදියුණු ගෝත්‍රයක් වන නන්දිස්වරු ජීවත් වන්නේ,

i. බටහිර රටවල ය.
ii. මධ්‍යම අප්‍රිකාවේ ය.
iii. උතුරු ඇමෙරිකාව ආශ්‍රිතව ය.
iv. බෝර්නියෝවල ය.

34. සමාජ විෂමතාව වැඩිවන විට සියදිවි හානිකර ගන්නා ප්‍රමාණය ද වැඩි වන බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

i. ආර්. ජේ. හැවිගාර්ට්
ii. රැලිෆ් ලින්ටන්
iii. එමිල් ඩුර්කයිම්
iv. බී. මැලිනොව්ස්කි

35. HIV වෛරසය ශරීරගත වූ මුල්ම ආසාදිතයා හමු වූයේ කිනම් රටකින් ද?

i. ජර්මනියෙන් ය
ii. දකුණු අප්‍රිකාවෙන් ය
iii. ඇමෙරිකාවෙන් ය
iv. ශ්‍රී ලංකාවෙන් ය

36. ''නිශ්චිත ක්‍රමයකට අනුව තොරතුරු ගවේෂණය කිරීම විද්‍යාත්මක කලාවකි'' මේ ප්‍රකාශය කාගේ ද?

i. කොතාරිගේ ය.
ii. ක්ලිෆඩ් වූඩ්ගේ ය.
iii. මැක්ස් වේබර්ගේ ය.
iv. පි.වි. යන්ග්ගේ ය.

37. උපන්‍යාසයක සත්‍ය අසත්‍යතාව සොයා බැලීමට පර්යේෂණ ක්‍රමවේදයක් සැලසුම් කිරීමේ අනුපිළිවෙල සඳහන් පිළිතුරු තෝරන්න.

A තමන් අධ්‍යයනය කරන ක්ෂේත්‍රයට අනුව දත්ත රැස් කිරීම.

B පර්යේෂණයට අදාළ නියැදිය තෝරා ගැනීම

C දත්ත රැස්කර ගැනීමට අදාළ ආකෘති, මෙවලම්, ප්‍රශ්නාවලි සකස් කර ගැනීම

i. A, B, C
ii. B, C, A
iii. B, A, C
iv. C, B, A

38. ගුරුවරයෙක් උගන්වන ආකාරය පන්තියේ පිටුපසින් වාඩි වී නිරීක්ෂණය කිරීම යනු,

i. පොදු නිරීක්ෂණය වේ.
ii. සහභාගිත්ව නිරීක්ෂණය වේ.
iii. වක්‍ර නිරීක්ෂණය වේ.
iv. ඍජු නිරීක්ෂණය වේ.

39. ''පුද්ගලයන් සමග සාකච්ඡා හෝ ප්‍රශ්න කිරීම සම්මුඛ සාකච්ඡා නම් වේ'' මෙම නිර්වචනය කිනම් විද්‍යාඥයාගේ ද?

i. මැනියන්ගේ ය.
ii. බ්ලැක්ස්ටර්ගේ ය.
iii. කොහෙන්ගේ ය.
iv. නන්දසේන රත්නපාලගේ ය.

40. සම්මුඛ සාකච්ඡාවල දුබලතාවක් වන්නේ, මින් කුමක් ද?

i. අදාළ ප්‍රශ්නයට පිළිතුරු ලැබීමට වැඩි ඉඩක් ලැබීම.
ii. දත්තවල ක්‍රමවත් බව අඩු වීම හා විස්තීර්ණ වීම.
iii. පුද්ගලයා කේන්ද්‍රකර ගෙන සාකච්ඡා කළ හැකිවීම.
iv. පරීක්ෂකයාට නිරීක්ෂණය කිරීම ද කළ හැකිවීම.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

## Primary Piriven Year End Tearm Test - 2018

**04 ශ්‍රේණිය/Grade 04**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව **I, II**

**Sociology I, II**

සමාජ විද්‍යාව **II**

**සැලකිය යුතුයි :**

i. පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

ii. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

iii. මෙම කොටසට ලකුණු 60ක් හිමි වේ.

**A** කොටස

01)

i. පහළොස්වන සියවසේ දී යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණයට මුල් වූ පූජකයන් දෙදෙනා නම් කරන්න.

ii. සදිසා නමස්කාරයේ සඳහන් බටහිර දිසාවට අයත් වන්නේ කවුරුන් ද?

iii. එමිල් ඩුර්කයිම්ගේ සමාජ පරිණාමයේ අවධි දෙක ලියන්න.

iv. ශ්‍රම සංචලතාව යනු කුමක් ද?

v. පැරණි ශ්‍රී ලාංකික කෘෂිකාර්මික ගොවි සමාජයේ දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් ලියන්න.

vi. රසයට තණ්හාව ඇති කර ගැනීමෙන් ඔවුන් තුළ වූ දිව්‍යමය ලක්ෂණ ඉවත් ව ගොරෝසු ශරීර ඇති වූ බව සඳහන් සූත්‍රය කුමක් ද?

vii. අධ්‍යාපනය තුළින් බිහි කරන පුද්ගලයකු තුළ තිබි යුතු ගුණාංග දෙකක් ලියන්න්.

viii. මූලික බෞද්ධ සමාජ සංස්ථා දෙක නම් කරන්න.

ix. සමාජ අනෝමීය තත්ත්වය යනු කුමක් ද?

x. සමාජ විද්‍යා පර්යේෂණවල අරමුණු මූලික වශයෙන් කොටස් දෙකට බෙදිය හැකි ය. ඒ මොනවාද?

(ලකුණු 2x10 = 20)

**B** කොටස

02)

i. සමාජ විද්‍යාව පිළිබඳ ඉදිරිපත් ව ඇති නිර්වචනයක් ලියා දක්වන්න. (ලකුණු 02)

ii. ජෝර්ජ් රිට්සර් විසින් බටහිර සමාජය විවිධ හේතූන් මත වෙනස් වූ බව කියයි එම හේතූන් අතුරින් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. බෞද්ධ පංචශීල ප්‍රතිපත්තියේ සමාජ විද්‍යාත්මක අගය පහදන්න. (ලකුණු 05)

03)

i. සමාජ පරිණාමය පිළිබඳ මත ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

ii. පැරණි සමාජය නූතන නාගරික සමාජය දක්වා පරිණාමය වීමට බලපෑ සමාජානුබද්ධ සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

iii. කාර්මීකරණයේ මූලික ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04)

i. සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් සපයන්න. (ලකුණු 02)

ii. ලාංකීය සංස්කෘතිය තුළ ඇති උප සංස්කෘතීන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. ලාංකීය සංස්කෘතිය හැඩගැස්වීමෙහිලා ඉන්දියාවට ආසන්නව පිහිටීම කොතරම් බලපෑවේ දැයි නිදර්ශන දෙකක් ඇසුරින් විමසන්න. (ලකුණු 05)

05)

i. සමාජයක් යනු කුමක් ද නිර්වචනයක් සපයන්න. (ලකුණු 02)

ii. පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාව තුළ පැවැති ආගම් තුනක් තහනම් කරන ලදී. එම ආගම් තුන මොනවාද? (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාව තුළ බෞද්ධ සමාජයක් ගොඩනගා ගැනීමට ත්‍රිපිටක සාහිත්‍යයේ එන සූත්‍ර ධර්ම හා සිංහල සාහිත්‍ය කෘතිවල විශිෂ්ටත්වය හේතු විය. නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

06)

i. පුද්ගල සංවර්ධනය උදෙසා මහා මංගල සූත්‍රයේ සඳහන් ධර්ම කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ග්‍රාමීය සමාජ පාලනය සිදු වූ ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)

iii. නගර ආශ්‍රිත ව ගැටලු නිර්මාණය වීමට බලපාන සාධක දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

07)

i. සමාජ ප්‍රශ්නයක් ඇති වීමට බලපාන හේතු දෙකක් දක්වන්න. (ලකුණු 02)

ii. දුගී බවින් මිදීම සඳහා රජය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ඒඩ්ස් රෝගයෙන් මිදීමට බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

08)

i. සමාජ විද්‍යා පර්යේෂණවල අරමුණු මූලික කොටස් දෙකකට බෙදේ. ඒ මොනවාද? (ලකුණු 02)

ii. නිරීක්ෂණයේ ප්‍රභේද තුන නම් කරන්න. (ලකුණු 03)

iii. සම්මුඛ සාකච්ඡාවේ දී සැලකිය යුතු කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Tearm Test - 2019

### 04 ශ්‍රේණිය/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

## සමාජ විද්‍යාව I

සැලකිය යුතුයි .

i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරු අතරින් ඔබ තෝරාගත් පිළිතුර අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. මෙම පිළිතුරු පත්‍රයේ පිටුපස ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. සමාජ විද්‍යා විෂය බිහිවූයේ කුමන සමාජ ප්‍රභේදය පදනම් කරගෙන ද?

i. ගෝත්‍රික සමාජය ii. වහල් සමාජය

iii. ගැමි සමාජය iv. නාගරික සමාජය

02. "සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳව අධ්‍යයනය කිරීම යි" යනුවෙන් නිර්වචනය කළ විද්‍යාඥයා වන්නේ,

i. එලිසබත් ජේ. විල්කින්ස් ය. ii. එල්. ටී. හොබ්හවුස් ය.

iii. ඔගස්ට් කොම්ට් ය. iv. ජෝන් ස්ටුවට් මිල් ය.

03. මිනිසාගේ සමස්ත සමාජ චර්යාව විද්‍යාත්මකව අධ්‍යයනය කරනු ලබන විෂය කුමක් ?

i. සමාජ විද්‍යාව ii. ආර්ථික විද්‍යාව

iii. මනෝ විද්‍යාව iv. මානව විද්‍යාව

04. ප්‍රංශ විප්ලවය ඇති වීමට හේතුවක් නොවන්නේ,

i. රදළවාදය ii. රාජාණ්ඩු පාලනය

iii. ප්‍රභූරුදය iv. විවිධ පාරිසරික සාධක

05. ඉතිහාසය ⟶ A ..............................

මනෝ විද්‍යාව ⟶ B සමාජ මනෝ විද්‍යාව

ආර්ථික විද්‍යාව ⟶ C සමාජ ආර්ථික විද්‍යාව

මානව විද්‍යාව ⟶ D සමාජ මානව විද්‍යාව

දේශපාලන විද්‍යාව ⟶ E දේශපාලන මනෝ විද්‍යාව

ඉහත A සඳහා සුදුසු පිළිතුර වන්නේ කුමක් ද?

i. සමාජ ඉතිහාස විද්‍යාව ii. සමාජ විද්‍යා ඉතිහාසය

iii. ඉතිහාසය සමාජ විද්‍යාව iv. ඓතිහාසික සමාජ විද්‍යාව

| | |
|---|---|
| දෙමාපිය - දූදරු සබඳතා | A බටහිර |
| ගුරු - සිසු සබඳතා | B උඩ |
| අඹු - සැමි සබඳතා | C නැගෙනහිර |
| මිතු - මිතු සබඳතා | D උතුර |
| ගිහි - පැවිදි සබඳතා | E යට |
| ස්වාමි - සේවක සබඳතා | F දකුණ |

06. ඉහත සඳහන් සම්බන්ධතාවලට අදාළව සිඟාලෝවාද සූත්‍රයේ දක්වෙන සදිසාව නිවැරදිව ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

i. A B C D E F　　　ii. C F A E D B

iii. C F A D B E　　　iv. C F A D E B

පහත සඳහන් තොරතුරු අධ්‍යයනය කරන්න. 7 හා 8 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

- ප්‍රාථමික ගති ලක්ෂණ මුල් බැසගෙන ඇත
- "සියල්ලම දේව නිර්මාණයක් ය" යන විශ්වාසය මත පදනම්ව ඇත
- මියගිය ගෞරවයක් හිමිම
- විමර්ශීලි නොවීම

07. ඉහත ලක්ෂණ දක්නට ලැබෙන අවධිය වන්නේ,

i. පාරභෞතික අවධිය යි.　　　ii. දේවවාදී අවධිය යි.

iii. යථාභූත අවධිය යි.　　　iv. යටත් විජිත අවධිය යි.

08. සමාජ පරිණාමයේ එක් අවධියක් පිළිබඳ ඉහත අදහස් ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

i. මැක්ස් වෙබර් ය.　　　ii. කාල් මාක්ස් ය.

iii. හර්බට් ස්පෙන්සර් ය.　　　iv. ඔගස්ට් කොම්ට් ය.

09. කාල් මාක්ස්ට අනුව සමාජ සංවර්ධනයේ ප්‍රධාන අවධි ගණන,

i. 02 කි.　　　ii. 03 කි.

iii. 04 කි.　　　iv. 05 කි.

10. කාර්මීකරණයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?

i. මම සංකල්පයට වඩා අපි ඇති සංකල්පය ඉස්මතු වීම

ii. භෞතික සම්බන්ධතා වෙනුවට සමාජ සම්බන්ධතා ශක්තිමත් වීම

iii. සංකීර්ණ ශ්‍රම විභජනය

iv. සමාජය පාලනය සිරිත් විරිත් සාරධර්ම මත පදනම් වීම

11. උච්ඡාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා යන මෙලොව, පරලොව ජීවිතයට යහපත සලසන සඳහා කරුණු 04ක් පෙන්වා දෙයි. එම කරුණු ඇතුළත් බෞද්ධ සූත්‍රය වන්නේ,

i. වසල සූත්‍රය යි.
ii. ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි.
iii. සිගාලෝවාද සූත්‍රය යි.
iv. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.

12. "දෙන ලද ජීවන රටාවට අනුව සාමාජිකයන් සමූහයක් සංවිධානය වී ඇති ආකාරය සංස්කෘතිය යි" යන්න ප්‍රකාශ කළේ.

i. බ්‍රොනිස්ලෝ මැලිනොවුස්කි ය.
ii. රේමන්ඩ් ෆර්ත් ය.
iii. ඊ. බී. ටයිලර් ය.
iv. රැල්ෆ් ලින්ටන් ය.

13. ඉස්ලාම් සංස්කෘතියට අදාළ වන්දනාමාන පද්ධතියට අයත් නොවන්නේ මින් කුමක් ද?

i. කලිමාව
ii. මුජබර්
iii. සකාතය
iv. රාමලාන්

14. විවෘත සංස්කෘතිය යන්නෙන් අදහස් කරනු ලබන්නේ,

i. බාහිරව දක්නට ලැබෙන ලක්ෂණ ය.
ii. අභ්‍යන්තරව දක්නට ලැබෙන ලක්ෂණ ය.
iii. ඇදහිලි හා විශ්වාස පිළිබඳව ය.
iv. සමාජ [illegible] පිළිබඳව ය.

15. හින්දු ආගමේ මූලික ලක්ෂණයක් වන්නේ,

i. බහුදේව වාදය යි
ii. උච්ඡේද වාදය යි
iii. ඒකදේව වාදය යි
iv. ශාශ්වත වාදය යි

16. "බටහිර මනෝ විද්‍යාවේ පියා" ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?

i. ඊ. බී. ටයිලර්
ii. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්
iii. ඔගස්ට් කොම්ට්
iv. රැල්ෆ් ලින්ටන්

17. සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක දී දක්නට <u>නොලැබෙන්නේ,</u>

i. නිරීක්ෂණ
ii. පර්යේෂණ
iii. සමපරීක්ෂණ
iv. අත්හදා බැලීම

18. ශ්‍රී ලංකාවට විවෘත ආර්ථිකය හඳුන්වා දෙන ලද්දේ,

i. 1977 දී ය.
ii. 1980 දී ය.
iii. 1956 දී ය.
iv. 1982 දී ය.

19. කුලය මත පදනම් වූ රාජකාරී ක්‍රමයෙන් සමාජයට සේවයක් වූ බව පවසන්නේ,

i. එමිල් ඩුර්කයිම් ය.
ii. වස්කෝ ද ගාමා ය.
iii. ඊ. ආර්. ලීච් ය.
iv. රූත් බෙනඩික්ට් ය.

20. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි අදහසක් දක්වෙන ප්‍රකාශය තෝරන්න

i. ඕනෑම සාමාජිකයෙකු හොබවන තත්ත්වයට අදාළ කාර්යභාරයක් ද පැවරේ.

ii. නව යටත් විජිතකරණයත් සමග විශ්ව ගම්මාන සංකල්පය වර්ධනය විය.

iii. ක්‍රි.ව. 1505 පෘතුගීසි ආක්‍රමණය ලංකා සමාජයේ ප්‍රගමනයට හේතු විය.

iv. 1656 ලන්දේසීන් විසින් කෝට්ටේ රාජධානියේ සමාජ පසුබිම වියවුල් කරන ලදී.

21. මානවයාගේ ආරම්භය පිළිබඳ කරුණු දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

i. චක්කවත්තිසීහනාද සූත්‍රය
ii. අග්ගඤ්ඤ සූත්‍රය
iii. කූටදන්ත සූත්‍රය
iv. සිගාලෝවාද සූත්‍රය

22. ගම පිළිබඳ ඓතිහාසික විවරණයක් ඇතුළත් ග්‍රන්ථයක් වන්නේ මින් කුමක් ද?

i. [illegible]
ii. [illegible]
iii. තම්බපණ්ණි
iv. සිලොන්

23. නාගරික ප්‍රදේශවල ජනයා ඒකරාශී වීමේ ක්‍රියාවලිය,

i. නාගරීකරණය යි
ii. ජනාකීර්ණ වීම යි
iii. ජනශූන්‍ය වීම යි
iv. අර්ධ සමාජය යි

24. අප්පිච්ඡතා - අල්පේච්ඡ බව
සන්තුට්ඨිතා - ලද දෙයින් සතුටු වීම
සල්ලේඛතා - සැහැල්ලු පැවතුම් ඇති බව
සුභරතා - පෝෂණය පහසු වීම
ඉහත ඉගැන්වීම් වලින් සාමාජිකයාගේ ජීවිතයෙහි,

i. ස්වං විනයක් ඇති වේ.

ii. නෛතිකව පාලනයක් ඇති වේ.

iii. සංස්කෘතික හර ස්ථාපනය වේ.

iv. පන්සිල් සුරක්ෂිත වේ.

25. ඉස්ලාම් ආගමේ නිර්මාතෘවරයා වන්නේ,

i. ආල්ලාහ් දෙවියන් ය. ii. මුහම්මද් නබිනායකතුමා ය.

iii. සුන්නිවරු ය. iv. ෂියාවරු ය.

26. අධ්‍යාපනය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න

i. ස්වියත්වය හා පෞරුෂ වර්ධනය කිරීම යනු අධ්‍යාපනය යි.

ii. පුද්ගල ප්‍රතික්‍රියාවෙහි වෙනස්කම් ඇති කිරීම අධ්‍යාපනය වේ.

iii. පොත පතෙහි හා පුවත් පත්වල ඇති දැනුම අධ්‍යාපනය නම් වේ.

iv. චිරාගත සිරිත් විරිත් අනුව හැසිරීම අධ්‍යාපනය යි.

27. ශ්‍රී ලංකාව තුළ සියදිවි නසා ගැනීමට හෙවත් ආත්ම ඝාතනයට බලපානු ලබන්නේ,

i. විභාගවලින් සමත් වීම යි.

ii. රැකියාවන්හි නිරත වීම ය.

iii. ඉච්ඡාභංගත්වය යි.

iv. මානසික නීරෝගීතාව යි.

28. ලංකාව තුළ ආත්ම ඝාතනයට වැඩි පිරිසක් නැඹුරුවන වයස් සීමාව වන්නේ,

[illegible]5 - 50 අතර ය. ii. 50 - 55 අතර ය

iii. 20 - 30 අතර ය. iv. 18 - 40 අතර

29. HIV අසාදිත පළමු ශ්‍රී ලාංකිකයා හමු කුමන දිස්ත්‍රික්කයෙන් ද?

i. කොළඹ ii. මාතර

iii. රත්නපුර iv. ගාල්ල

30. ඒඩ්ස් වැනි ලිංගාශ්‍රිත රෝග නිවාරණයට බුදු දහමෙන් ලබා දිය හැකි ප්‍රශස්ත නිර්දේශය වන්නේ,

i. දස පාරමිතා සම්පූර්ණ කිරීම ය.

ii. අටලෝ දහමින් අකම්පිත වීම.

iii. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම යන ශික්ෂා පදයට අනුව ජීවිතය ගොඩනගා ගැනීම

iv. පොහෝ දින පෙහෙවස් සමාදන් වීම යි

31. සමාජ ගැටලු නිවාරණය සඳහා ගත හැකි වඩාත් සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ

i. නීතිය ශක්තිමත් කිරීම යි

ii. දඬුවම් වැඩි කිරීම යි

iii. සමාජ ගැටලුවට අදාළ විද්‍යාත්මක පිළියම් යෙදීම යි

iv. සමාජ ගැටලු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම යි

32. සමාජ විද්‍යාත්මක පර්යේෂණයක දී අරමුණු මුදුන්පත් කර ගැනීමට වැදගත් <u>නොවන්නේ.</u>

i. විෂය ප්‍රවීණත්වය
ii. විධික්‍රම පිළිබඳ සැලකිලිමත් නොවීම
iii. කාර්යක්ෂමතාව
iv. පුහුණු ශ්‍රමය

33. පර්යේෂකයා ද ක්ෂේත්‍රයෙහි ජීවත් වෙමින් තොරතුරු ලබා ගැනීම ............................ නම් වේ.

i. පරීක්ෂණය
ii. සහභාගීත්ව නිරීක්ෂණය
iii. ගවේෂණය
iv. සමපරීක්ෂණය

34. නිරීක්ෂණය යනු

i. සජීවීව තොරතුරු ලබා ගැනීමේ ක්‍රමයකි.
ii. අරමුණු රහිත කටයුත්තකි.
iii. අවිධිමත් කාර්යයකි.
iv. අසම්මත ක්‍රමයකි.

35. නිරීක්ෂණයේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ මින් කුමක් ද?

i. නිරීක්ෂණ සැලැස්මක් පිළියෙළ කිරීම.
ii. නිරීක්ෂණ දත්ත ක්‍රමවත්ව වාර්තා කිරීම.
iii. නිරීක්ෂණය කළ යුතු විෂය කරුණු ක්ෂණිකව තීරණය කිරීම.
iv. ඉහත පදගත් සියල්ලම.

36. සමාජ විද්‍යාත්මක නිරීක්ෂණයේ ප්‍රධාන ප්‍රභේද කීය ද?

i. 2 යි
ii. 3 යි
iii. 4 යි
iv. 5 යි

37. "එක් තැනැත්තෙකු තවත් කෙනෙකු හා සමග මුහුණට මුහුණලා කරනු ලබන වාචික අන්තර් සබඳතාව සම්මුඛ සාකච්ඡාව නම් වේ" මෙම නිර්වචනය කාගේ ද?

i. මාග්‍රට් මීඩ්
ii. ඩෙන්සින්
iii. ඇල්බට්. කේ කොහෙන්
iv. බෙස්ට්

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Term Test - 2019

**04 ශ්‍රේණිය/Grade 04**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

සමාජ විද්‍යාව II

සැලකිය යුතුයි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

01.

i නාගර නිර්මාණය නිසා ඇති වූ සමාජ වෙනස්කම් දෙකක් ලියන්න.

ii. සමාජ සංවරධනයේ ප්‍රධාන අවධි දෙකක් නම් කරන්න.

iii. සෑම ආගමකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් නම් කරන්න.

iv. ශ්‍රී ලංකා සමාජයේ සංවර්ධනයට බුදු දහමෙන් ලැබුණු දායාද දෙකක් සඳහන් කරන්න.

v මුස්ලිම සංස්කෘතිය තුළ දක්නට ලැබෙන ඉගැන්වීම් දෙකක් සඳහන් කරන්න.

vi සියදිවි නසා ගැනීමට තුඩු දෙන හේතු දෙකක් දක්වන්න.

vii නිරීක්ෂණ ක්‍රමයේ අවාසි දෙකක් සඳහන් කරන්න.

viii කාල් මාක්ස්ගේ පරිණාමවාදී ආකෘතියට අයත් අවධි දෙකක් නම් කරන්න.

ix සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ දී උද්ගත වන ගැටලු දෙකක් සඳහන් කරන්න.

x ඔගස්ට් කොම්ටගේ අවධි තුනේ රීතියෙහි අන්තර්ගත අවධි තුන නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

### II කොටස

02

i ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර වෙනස්කම් දෙකක් ලියන්න.

ii සමාජීය විද්‍යාවන් තුනක් සඳහන් කරන්න.

iii බෞද්ධ සමාජ විද්‍යාත්මක චින්තනය කරුණු දෙක යටතේ පැහැදිලි කරන්න

(ලකුණු 2 + 3+ 5 = 10)

03

i පරිණාමවාදී අදහස් ඉදිරිපත් කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න.

ii නවීකරණයේ අංග ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

iii කාර්මීකරණයේ මූලික ලක්ෂණ කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

04

i බුදු දහමේ ඉගැන්වෙන දෙයාකාර දියුණුව දක්වන්න.

ii සංස්කෘතිය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී යොදා ගනු ලබන එළැඹුම් තුනක් දක්වන්න.

iii යම් සමාජයක පැවැත්ම උදෙසා සංස්කෘතියේ බලපෑම කවරාකාර ද යන්න පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05

i සමාජය යනු කවරක් දැයි කෙටියෙන් පහදන්න.

ii ශ්‍රී ලංකා සමාජයේ විවිධත්වයට හේතු වන සාධක තුනක් ඉදිරිපත් කරන්න.

iii ශ්‍රී ලාංකික ජන සමාජය පෝෂණය වීම සඳහා මහින්දාගමනයෙන් ලැබුණු දායකත්වය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06

i නගර හා සම්බන්ධ වර්ගීකරණයේ දක්වෙන නගර වර්ග දෙකක් සඳහන් කරන්න.

ii කතෝලික සමාජ පාලනයෙහිලා මඟ පෙන්වන දස පනතෙන් කරුණු තුනක් දක්වන්න.

iii සමාජ පාලනයට බුදු දහමෙන් ලැබී ඇති දායකත්වය කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07

i සමාජ ගැටලුවක් යනු කුමක් ද?

ii සමාජ ගැටලු තුනක් නම් කරන්න.

iii සමාජ ගැටලු නිරාකරණය සඳහා බුදු දහමෙන් නිර්දේශිත ඉගැන්වීම් විග්‍රහ කරන්න

(ලකුණු 2 + 3 + 5 = 10)

08

i පර්යේෂණයක් යනු කුමක් ද?

ii සහභාගී නිරීක්ෂණය යන්න හඳුන්වන්න.

iii නිරීක්ෂණ ක්‍රමයේ වාසි පහක් දක්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020**<br>**Primary Piriven Year End Test - 2020**<br>**04 ශ්‍රේණිය/Grade 04**<br>සමාජ විද්‍යාව I, II — කාලය : පැය තුන යි<br>**sociology Science** I, II — **Time : Three Hours** |

**සමාජ විද්‍යාව I**

සැලකිය යුතු යි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. සමාජ විද්‍යාව සියලු ම සමාජීය විද්‍යාවන්ගේ මව බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා වන්නේ,

1. ජේ. විල්කින්ස් ය.
2. එමිල් ඩුර්කයිම් ය.
3. මැක්ස් වේබර් ය.
4. ඇන්තනී ගිඩින්ස් ය.

02. විපර්යාසයන්ට භාජනය වන සමාජය අධ්‍යයනය කිරීමේ විෂයයක් ලෙස සමාජ විද්‍යාව හඳුන්වා දෙනු ලැබූයේ,

1. එල්.ටී. හොබ්හවුස් ය.
2. මැක්ස් වේබර් ය.
3. ජෝර්ජ් රිට්සර් ය.
4. ඔගස්ට් කොම්ට් ය.

03. ස්වාභාවික විද්‍යා ක්ෂේත්‍රයට ඇතුළත් විෂයයක් නොවන්නේ මින් කුමක් ද?

1. වාස්තු විද්‍යාව
2. පරිසර විද්‍යාව
3. දේශපාලන විද්‍යාව
4. භූගර්භ විද්‍යාව

04. බටහිර සමාජය වෙනස් වීමට බලපෑ ප්‍රංශ විප්ලවය වූ වර්ෂය කුමක් ද?

1. 1780
2. 1784
3. 1787
4. 1789

05. "සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳ ව අධ්‍යයනය කිරීම යි." යන නිර්වචනය ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා කවුරුන් ද?

1. ජේ. විල්කින්ස් ය.
2. කාල් මාක්ස් ය.
3. ජෝන් ස්ටුවට් මිල් ය.
4. එල්. ටී. හොබ්හවුස් ය.

06. කර්මාන්ත ක්ෂේත්‍රයෙහි විපර්යාසයක් ඇති කළ, වාෂ්ප බල එන්ජිම කාගේ නිර්මාණයක් ද?

1. ජෝන් කැල්වින්ගේ ය.
2. ජෝර්ජ් රිට්සර්ගේ ය.
3. ජෝර්ජ් ස්ටීවන්සන්ගේ ය.
4. ජේම්ස් වොට්ගේ ය.

07. සමාජය පිළිබඳ විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා විද්‍යාත්මක ක්‍රමවේදය නිවැරදිව සඳහන් පිළිතුර කුමක් ද?

1. පර්යේෂණ, නිරීක්ෂණ, නිගමන
2. නිරීක්ෂණ, නිගමන, පර්යේෂණ
3. නිරීක්ෂණ, සම්පරීක්ෂණ, පර්යේෂණ
4. සම්පරීක්ෂණ, පර්යේෂණ, නිරීක්ෂණ

08. සමාජ පරිණාමය වීමට බලපානු ලබන මූලික හේතුව සාමජය තුළ පවතින,

1. ගතික ස්වභාවය යි.
2. ස්ථිතික ස්වභාවය යි.
3. සංකීරණ ස්වභාවය යි.
4. අනාත්ම ස්වභාවය යි.

09. පැරණි සමාජවල සාමාජිකයින් සාම්ප්‍රදයානුකූල ජීවිතයක් ගත කිරීමට බලපෑ ප්‍රධාන සාධකය මින් කුමක් ද?

1. සාධිත තත්ත්වය
2. ආරෝපිත තත්ත්වය
3. ගතික ස්වභාවය
4. සංකීර්ණ ස්වභාවය

10. වෙනස්වීම සඳහා හට ගැනීම බුදුදහමේ හඳුන්වනු ලබන්නේ,

1. පියෙහි විප්පයෝග දුක්ඛ ලෙස ය.
2. ජාතිපි දුක්ඛ ලෙස ය.
3. අප්‍රිය සම්පයෝග දුක්ඛ ලෙස ය.
4. විපරිණාම දුක්ඛ ලෙස ය.

11. පූර්ව කාර්මික යුගයේ සිට කාර්මික යුගය දක්වා පරිණාමය වීම සඳහා මූලික **නොවූ** සාධකය කුමක් ද?

1. කාර්මිකරණය
2. ග්‍රාමියකරණය
3. නවීකරණය
4. නාගරීකරණය

12. ප්‍රංශයේ ලිබරල්වාදි ධනේශ්වර පාලන ක්‍රමයක් බිහි කරන ලද්දේ කිනම් වර්ෂයේ ද?

1. ක්‍රිːවː 1718 දී ය
2. ක්‍රිːවː 1789 දී ය
3. ක්‍රිːවː 1816 දී ය
4. ක්‍රිːවː 1948 දී ය

13. කාර්මීකරණයේ මූලික ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

1. මහා පරිමාණ කර්මාන්ත ශාලා බිහිවීම
2. තරගකාරී අර්ථ ක්‍රමයක් පැවැතීම
3. භාණ්ඩ හුවමාරු ක්‍රමයක් පැවතීම
4. සංකීර්ණ ශ්‍රම විභජනයක් තිබීම

14. පංචසීලය, අෂ්ටාංග සීලය, දස සීලය ආදි සීල ප්‍රතිපත්තියේ හික්මීම උතුම් පූජාව බව සඳහන් බෞද්ධ සූත්‍රය වන්නේ,

1. කුටදන්ත සූත්‍රය යි.
2. දසධම්ම සූත්‍රය යි.
3. වසල සූත්‍රය යි.
4. මංගල සූත්‍රය යි.

15. ව්‍යග්ගපජ්ජ සූත්‍රයට අනුව මෙලොව පරලොව ජීවිතය යහපත් කර ගැනීමට උපකාරී වන කරුණක් වන්නේ,

1. මව්පියන්ට සැලකීම යි.
2. උත්සාහයෙන් කටයුතු කිරීම යි.
3. යුතුකම් ඉටුකිරීම යි.
4. ගුරු ගෞරවය යි.

16. "ප්‍රාථමික සංස්කෘතිය" (Primitive culture) කෘතියේ කතුවරයා කවුද?

1. රේමන්ඩ් ෆර්ත් ය.
2. ඊ. බී. ටයිලර් ය.
3. කාල් මාක්ස් ය.
4. එමිල් ඩුර්කයිම් ය.

17. සංස්කෘතිය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී බහුලව යොදා ගන්නා එළඹුම් තුන නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

A සෞන්දර්යාත්මක එළඹුම
B මානව විද්‍යාත්මක එළඹුම
C මනෝ විද්‍යාත්මක එළඹුම
D සමාජ විද්‍යාත්මක එළඹුම

1. A, B, C　2. A, B, D　3. A, C, D　2. B, C, D

18. සංස්කෘතියට අදාළ කරුණු නිවැරදි ව සඳහන් පිළිතුර තෝරන්න.

A. එය මිනිසාගේ සමාජ උරුමය යි

B. එය සමාජ ජන කොටස් අතර දක්නට නොමැත

C. එය ජන කොටසක් තවත් ජන කොටසකින් වෙන් කොට හඳුනා ගනී

D. එය පරම්පරාවෙන් පැවරෙයි

1. A, B, C　2. A, B, D　3. A, C, D　4. B, C, D

19. ශිව ආගමික සම්ප්‍රදාය අනුව ඔවුන් අදහන දෙවිවරුන් නිවැරදි ව සඳහන් පිළිතුර ලියන්න.

A. පුල්ලෙයාර්　B. පාර්වතී　C. මුරුගන්　D. අල්ලා

1. A, B, C　2. A, B, D　3. A, C,D　4. B, C, D

20. පෘතුගීසීන්ගේ හා ඉංග්‍රීසින්ගේ මෙරටට පැමිණි වර්ෂ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

A. 1505　B. 1658　C. 1796　D. 1818

1. A, B,　2. A, C　3. B, C　4. B, D

21. ශ්‍රී ලංකා සමාජයේ ආගමික සංයුතිය අනුව ඉස්ලාම් ආගමට අයත් ජනතා ප්‍රතිශතය මින් කුමක් ද?

1. 6.1%
2. 9.7%
3. 11.2%
4. 12.6%

22. රාජ්‍යයක ජනාවාස අතර කුඩාම ඒකකය කුමක් ද?

1. ගම
2. නගරය
3. දිස්ත්‍රිකය
4. පළාත

23. සාධිත තත්ත්වය යනුවෙන් හැඳින්වෙනුයේ,

1. පුද්ගල හැකියාවන් මත ගොඩනගා ගන්නා තත්ත්වය යි.
2. පුද්ගල තේරීමකින් තොරව ලැබෙන තත්ත්වය යි.
3. පුද්ගලයාට උපතින් ම හිමි වන තත්ත්වය යි.
4. පුද්ගල මනාපයකින් තොරව සම්ප්‍රේෂණය වන තත්ත්වය වේ.

24. පුද්ගල සමාජානුයෝජනය සිදු වන මූලික සමාජානුයෝජනා කාරකය කුමක් ද?

1. ජනමාධ්‍ය
2. පවුල
3. පාසල
4. පන්සල

25. ධනවාදී අර්ථ ක්‍රමයක් තුළ ධානපතියා විසින් නිර්ධනයන් පීඩනයට ලක් කරන බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

1. ඔගස්ට් කොම්ට් ය.
2. එමිල් ඩුර්කයිම් ය.
3. කාල් මාක්ස් ය.
4. මැක්ස් වේබර් ය.

26. පහත සඳහන් ප්‍රකාශ අතරින් අග්ගඤ්ඤ සූත්‍රය සම්බන්ධ ව වඩාත් නිවැරදි ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?

A සමාජ ප්‍රභවය හඳුනා ගත හැකි ය.
B සමාජ විකාශනය හඳුනා ගත හැකි ය.
C සමාජ ස්ථිතිකත්වය හඳුනා ගත හැකි ය.
D සමාජ ගතිකත්වය හඳුනා ගත හැකි ය.

1. A, B, C
2. A, B, D
3. A, C, D
4. B, C, D

27. ග්‍රාමීය සමාජ පාලන කාර්යය සඳහා නිල බලයෙන් පත්ව ඇති සාමාජිකයා කවු ද?

1. විහාරාධිපති ස්වාමීන් වහන්සේ
2. පාසලේ විදුහල්පතිතුමා
3. ග්‍රාමසේවක මහතා
4. ගමෙ වෙද මහතා

28. පහත ප්‍රකාශ අතුරින් මුස්ලිම් ජාතිකයන් සම්බන්ධ ව දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

A ස්ලාම් භක්තිකයෙකු නොවී මුස්ලිම් ජාතිකයෙකු විය නොහැකි ය.
B ෂර්යාත් නීතියට අනුව සමාජ පාලනය සිදු වේ.
C ප්‍රධාන ආගමික ග්‍රන්ථය කුරාණය වේ.
D යෙහොවඃ නම් සර්ව බලධාරි දෙවියන් වන්දනාව සිදු කරයි.

1. A, B, C
2. A, B, D
3. A, C, D
4. B, C, D

29. ශාසනික සම්ප්‍රදායයත් ථේරවාදී බුදු දහම ආරක්ෂාවත් වෙනුවෙන් ඇති වූ පංචමහා වාදයට නායකත්වය දෙනු ලැබ්යේ,

1. හික්කඩුවේ සුමංගල හිමියන් ය.
2. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් ය.
3. වස්කඩුවේ සුභූති හිමියන් ය.
4. බුලත්ගම ධම්මාලංකාර හිමියන් ය.

30. මාඝාත ආඥාව යනු,

1. කාමය වරදවා හැසිරීම යි.
2. සතුන් නොමැරීම යි.
3. සොරකම් නොකිරීම යි.
4. බොරු නොකීමයි යි.

අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශන දෙක බැගින් දී ඇත. ඒ ඒ ප්‍රශ්නවලට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලයන්ට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශන යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | නිවැරදි ය. |
| 4 | වැරදි ය. | වැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 31. | පැරණි සමාජවල සමාජ ගැටලු ඇති නොවී ය | එක් පුද්ගලයකුට පෞද්ගලිකව ඇතිවන ගැටලුවක් සමාජ ගැටලුවක් වේ. |
| 32. | සමාජය විසංවිධානය වීමට සමාජ අනෝමීය තත්ත්වය බලපායි. | ආත්ම ඝාතනය යනු සතුන් මැරීම යි. |
| 33. | කුමන සියදිවි නසා ගැනීමක දී වුව ද ආත්මීය හුදකලා භාවයකට පුද්ගලයා ලක්වන බව සත්‍යයකි. | ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට HIV වෛරසය ශරීරගත වූ ආසාදිතයෙකු සොයා ගනු ලැබුවේ 1986 දී ය. |
| 34. | දකුණු ආසියාතික රටවල ජනයා දිවිනසා ගැනීම ශ්‍රේෂ්ඨ වීර ක්‍රියාවක් ලෙස සලකති. | දුගී බව, විරැකියාව ආදී බහුවිධ හේතු සියදිවි නසා ගැනීම කෙරෙහි බලපායි. |
| 35. | "ඒකපති - ඒකපතිනි" සංකල්පය ප්‍රායෝගිකව භාවිතයෙන් සමාජ ගැටලු රැසකට විසඳුම් ලැබේ. | කාමයෙහි වරදවා හැසිරීම සමාජ රෝග සම්ප්‍රේෂණයට හේතු වේ. |

36. පර්යේෂණයක් ලෙස හැඳින්වෙනුයේ,

1. තොරතුරු එක්රැස් කිරීම යි.
2. නව දැනුම බිහිකර ගැනීම සඳහා විද්‍යාත්මකව තොරතුරු ගවේෂණය යි.
3. එක් තැනක ඇති තොරතුරු තවත් තැනකට ගෙන යෑම යි.
4. යම් මාතෘකාවක් සම්බන්ධව තොරතුරු එක් රැස් කිරීම යි.

37. පහත සඳහන් ඒවායින් සමාජ ගැටලුවක් නොවන්නේ කුමක් ද?

1. දුගීභාවය 2. තරුණ අසහනය

3. සියදිවි නසා ගැනීම 4. එක ගෙයි වාසය

38. පර්යේෂණයක දත්ත රැස් කිරීමේ උපකරණයක් ලෙස නිරීක්ෂණය ඵලදායී ව සිදු කිරීම සඳහා නිරීක්ෂණයක දී සැලකිය යුතු කරුණක් **නොවන්නේ** මින් කුමක් ද?

1. නිරීක්ෂණ දත්ත ක්‍රමවත්ව වාර්තා කිරීම.
2. නිරීක්ෂණය සැලසුමකට අනුව සිදු කිරීම.
3. නිරීක්ෂණ දත්ත වෙනත් අවශ්‍යතා සඳහා යොදා ගැනීම.
4. නිරීක්ෂණයේ දී දැන ගැනීමට අවශ්‍ය තොරතුරු තීරණය කිරීම

39. පර්යේෂණයක් සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමයක් ලෙස සම්මුඛ සාකච්ඡාව සඳහා,

1. විශාල නියැදියක් යොදා ගත හැකි ය.
2. විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවේ.
3. වැඩි කාලයක් ගත වේ.
4. පෙර සූදානමක් අවශ්‍ය නොවේ.

40. සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් ඔස්සේ අනාවරණය කර ගන්නා නව දැනුම,

1. ප්‍රතිපත්ති සම්පාදන කාරය සඳහා ප්‍රයෝජනවත් වේ.
2. නව ව්‍යවසායික අවස්ථා හඳුනා ගැනීමට ප්‍රයෝජනවත් වේ.
3. ව්‍යාපෘතියක සමාජ බලපෑම හඳුනා ගැනීමට ප්‍රයෝජනවත් වේ.
4. ඉහත දැක්වූ ප්‍රයෝජන පර්යේෂණ කිරීමෙන් ලබා ගත හැකි වේ.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

## Primary Piriven Year End Test - 2020

### 04 ශ්‍රේණිය/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

සමාජ විද්‍යාව II

සැලකිය යුතුයි :

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝර ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01.
i සමාජීය විද්‍යාවන් හා ස්වාභාවික විද්‍යාවන් සඳහා උදාහරණය බැගින් ලියන්න.

ii සමාජ පරිණාමය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ මුල් කාලීන සමාජයීය විද්‍යාඥයින් දෙදෙනෙකුගේ නම් ලියන්න.

iii ශ්‍රී ලාංකේය සමාජයේ දැකිය හැකි උප සංස්කෘතීන් දෙකක් නම් කරන්න.

iv බටහිර ජාතීන්ගේ ආක්‍රමණ නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

v ශ්‍රී ලංකාවේ ජීවත්වන මානව වර්ග 4ක් නම් කරන්න.

vi එමිල් ඩුර්කයිම් පෙන්වා දුන්, සියදිවි හානිකර ගැනීම කෙරෙහි බලපාන හේතු දෙකක් ලියන්න.

vii සමාජ විද්‍යා පර්යේෂණවල අරමුණු බෙදෙන මූලික කොටස් දෙක කුමක් ද?

viii සම්මුඛ සාකච්ඡාවල දක්නට ඇති දුබලතා දෙකක් ලියන්න.

ix බෞද්ධ සාහිත්‍යයේ එන ඇතැම් කතන්දර මගින් අඹුසැමියන් පිළිබඳ තොරතුරු දැක ගත හැකි ය. ආත්ම ගණනාවක් එකම අඹුසැමියන් ලෙස ජීවත් වූ චරිත දෙක නම් කරන්න.

x නිරීක්ෂණයේ ප්‍රභේද දෙකක් දක්වන්න.

## II කොටස

02. i සමාජ විද්‍යාව පිළිබඳ ව අර්ථකථනයක් දක්වන්න.

ii සමාජයක් බිහිවීමට පදනම් වන සාධක තුනක් ලියන්න.

iii බුද දහමේ දක්වෙන සමාජ විද්‍යාත්මක සංකල්ප දෙකක් නිදසුන් සහිත ව පහදන්න.

03. i සමාජ පරිණාමය පිළිබඳ ව නිර්වචනයක් ලියන්න.

ii කාල් මාක්ස් සමාජ පරිණාමය පිළිබඳ ව දක්වා ඇති සංකල්ප තුනක් ලියා දක්වන්න.

iii බුදු දහමේ දක්නට ඇති සමාජ පරිණාමය පිළිබඳ අදහස් දෙකක් පැහැදිලි කරන්න.

04. i "මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දායාදයක් වශයෙන් ගෙන යන ජීවන රටා සමුදාය සංස්කෘතිය වේ. "මේ නිර්වචනය ඉදිරිපත් කර ඇති විද්‍යාඥයා කවුද?

ii ත්‍රිවිධ ශාසනය නම් කරන්න.

iii සමාජයේ පැවැත්ම සඳහා සංස්කෘතියේ අවශ්‍යතාව නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

05. i ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ විදේශීය ජාතීන් දෙකක් සඳහන් කරන්න.

ii ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රධාන ජාතීන් තුනක් ලියා ඔවුන්ට ආවේණික සංස්කෘතික උත්සව එක බැගින් ලියන්න.

iii මහින්දාගමනයත් සමග ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් දෙකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

06. i සමාජ පාලනයේ දී භික්ෂුවගෙන් සිදු වන සේවාවන් දෙකක් ලියන්න.

ii පූර්ණ අධ්‍යාපනයකින් බිහි කරන රටවැසියකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න.

iii ස්වයං පාලනයක් ඇතිකර ගැනීම සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් දෙකක් විස්තර කරන්න.

07. i සමාජ ගැටලුවක මූලික ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

ii ඒඩ්ස් රෝගය හේතුවෙන් සමාජයට සිදු වන බලපෑම් තුනක් ලියන්න.

iii සමාජ ගැටලු නිවාරණය සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ මාර්ගෝපදේශ දෙකක් විස්තර කරන්න.

08. i සමාජ විද්‍යා පර්යේෂණ පිළිබඳ ව අර්ථකථනයක් සපයන්න.

ii සමාජ විද්‍යා පර්යේෂණවලින් ලබා ගත හැකි ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

iii සමාජ විද්‍යා පර්යේෂණයක් සඳහා ගැටලුවක් හඳුනා ගන්නා ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**සමාජ විද්‍යාව - I, II** **4 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - I

සැ.යු.

- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- ❖ අංක 01 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

(1) සමාජ විද්‍යා විෂයෙහි ආරම්භය සිදු වූයේ,
(1) ක්‍රි. ව. 1838 දී ය. (2) ක්‍රි. ව. 1840 දී ය. (3) ක්‍රි. ව. 1845 දී ය. (4) ක්‍රි. ව. 1848 දී ය.

(2) සමාජ විද්‍යාව ජනප්‍රිය විෂයක් වීමට බලපෑ ප්‍රධාන සාධකයක් වන්නේ මින් කුමක් ද?
(1) පිරිවෙන් විෂයමාලාවට අන්තර්ගත කර තිබීම.
(2) විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් තුළ ජනප්‍රිය වී තිබීම.
(3) සමාජ විද්‍යාව හැදෑරීමට සම්පත් බහුලව තිබීම.
(4) ප්‍රායෝගික පදනමක් සමාජ විද්‍යා විෂය තුළ අන්තර්ගත වී තිබීම.

- ප්‍රශ්න අංක 03 හා 04 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සමාජ විද්‍යාඥයින්ගේ නම් උපයෝගීකර ගන්න

A - ඔගස්ට් කොම්ට් B - එමිල් ඩුර්ක්හයිම්
C - මැක්ස් වේබර් D - කාල් මාක්ස්

(3) ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයින් පමණක් නිරූපිත වරණය තෝරන්න.
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

(4) සමාජ පන්ති පිළිබඳ අධ්‍යයනයන් සිදු කළ සමාජ විද්‍යාඥයින් පමණක් නිරූපිත වරණය කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

(5) සමාජය මැනවින් පවත්වාගෙන යාමට නම්, කරත්ත රෝදයක කඩ ඇණයක් සේ සමාජ සබැඳියාව පැවැත්විය යුතු බව පෙන්වා දෙමින් දේශිත බෞද්ධ සූත්‍රය කුමක් ද?
(1) මහා මංගල සූත්‍රය (2) චක්කවත්තිසීහනාද සූත්‍රය
(3) රතන සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

(6) යුරෝපා සමාජය ධනවාදී සමාජයක් ලෙස වේගවත් සංවර්ධනයක ඇරඹුම කෙරෙහි බලපෑ මූලික සාධකය වන්නේ,
(1) විද්‍යාවේ වර්ධනයි. (2) ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ප්‍රතිසංස්කරණයි.
(3) ප්‍රංශ විප්ලවයයි. (4) දේශපාලන ප්‍රතිසංස්කරණයි.

- ප්‍රශ්න අංක 7 හා 8 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සමාජ වර්ග උපයෝගීකර ගන්න

  A - පූර්ව කොමියුනිස්ට් යුගය  B - යාන්ත්‍රික ඒකාබද්ධතාව
  C - සමාජවාදී යුගය  D - ඓන්ද්‍රීය ඒකාබද්ධතාව

(7) එමිල් ඩුර්ක්හයිම් දැක්වූ සමාජ වර්ගීකරණය නිවැරදි ව සඳහන් පිළිතුර තෝරන්න.

(1) A හා B  (2) B හා C  (3) B හා D  (4) C හා D

(8) පන්ති ගැටුම් රහිත සමාජයක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A හා B  (2) A හා C  (3) B හා D  (4) C හා D

(9) ආර්ථික සාධක පමණක් මුල්කරගෙන සමාජ පරිණාමය වූ බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා කවුද?

(1) රැල්ෆ් ලින්ටන්  (2) ඔගස්ට් කොම්ට්  (3) කාල් මාක්ස්  (4) මැක්ස් වේබර්

(10) සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ දී අධ්‍යයනය කරන සාධිත තත්ත්ව සංකල්පයට නිදසුනක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) පැවිදි වීම  (2) උපසම්පදා වීම  (3) සකෘදාගාමී වීම  (4) පරම්පරාවෙන් රජකම උරුම වීම

(11) පෞරාණික කතෝලික පල්ලියේ බල ඒකාධිකාරයට එරෙහිව ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ව්‍යාපාරය ආරම්භ කරනු ලැබුයේ,

(1) මාටින් ලූතර් ය.  (2) මැක්ස් වේබර් ය.
(3) ජෝන් කැල්වින් ය.  (4) රොබට් පාර්ක් ය.

- ප්‍රශ්න අංක 12 හා 13 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන කරුණු උපයෝගීකර ගන්න

  A - භාණ්ඩ හුවමාරු ක්‍රමය
  B - ස්වයංපෝෂිත ආර්ථිකය
  C - භාණ්ඩ නිෂ්පාදනයේ දී යන්ත්‍ර සූත්‍ර භාවිතය
  D - වටිනාකම් මුදලින් තක්සේරු කිරීම
  E - ඒකාකාරී නිෂ්පාදන ලක්ෂණ පැවතීම

(12) ප්‍රාථමික සමාජවල පමණක් දක්නට ලැබෙන ලක්ෂණ නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) A, B හා C  (2) A, B හා E  (3) B, C හා D  (4) C, D හා E

(13) සමාජ වෙනස්වීම කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කළ සාධක පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B  (2) B හා C  (3) C හා D  (4) D හා E

(14) බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස පිළිගනු ලබන්නේ,

(1) බී.මැලිනොවුස්කි ය.  (2) ඊ.බී.ටයිලර් ය.
(3) රැල්ෆ් ලින්ටන් ය.  (4) රේමන්ඩ් ෆර්ත් ය.

- ප්‍රශ්න අංක 15 හා 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක උපයෝගීකර ගන්න

  A - කුල භේදය  B - අදහස්
  C - සමාජ පන්ති  D - විශ්වාස
  E - පුරුෂාර්ථ  F - තත්ත්වය හා කාර්යභාරය

(15) ආවෘත්ත සංස්කෘතියක පමණක් දක්නට ලැබෙන සාධක දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A, B හා C  (2) A, B හා E  (3) B, D හා E  (4) C, E හා F

(16) විවෘත්ත සංස්කෘතියක පමණක් දක්නට ලැබෙන සාධක දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A, B හා C  (2) A, C හා F  (3) B, D හා F  (4) C, E හා F

(17) ශ්‍රී ලාංකේය සමාජය තුළ බෞද්ධ සංස්කෘතිය ප්‍රභවය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය වන්නේ මින් කුමක් ද?

(1) දේවානම්පියතිස්ස රජු වෙහෙර විහාර ඉදිකිරීම. (2) බුදුරජාණන් වහන්සේගේ වැඩමවීම.

(3) මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩමවීම. (4) දුමින්දාගමනය සිදු වීම.

- ප්‍රශ්න අංක 18 හා 19 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක උපයෝගීකර ගන්න.

A - සිද්ධ ආයුර්වේද ක්‍රමය B - පාසල් අධ්‍යාපනය

C - තෝම්බුව D - පත්තිනිදේව වන්දනාව

(18) ඉන්දියානු සංස්කෘතියෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට එකතු වූ අංග පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

(19) ශ්‍රී ලාංකේය සංස්කෘතියට බටහිර සංස්කෘතියෙන් එකතු වූ අංග පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

(20) ප්‍රාථමික සමාජ අවධියේ විසූ මානවයා එකට ඒකරාශී වී ක්‍රියා කිරීමට පදනම් වූ ප්‍රධාන හේතුව වන්නේ,

(1) විනෝද කටයුතු සඳහා ය. (2) දඩයම් කටයුතු සඳහා ය.

(3) මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ය. (4) විවාහ කටයුතු සඳහා ය.

(21) ශ්‍රේෂ්ට ඉතිහාසඥයකු වන **''ගිබන්''** පෙන්වා දී ඇති පරිදි පුද්ගලයාට වඩාත් වැදගත් වන්නේ,

(1) තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනය යි. (2) ගුරුවරුන්ගෙන් ලැබෙන අධ්‍යාපනය යි.

(3) දෙමාපියන්ගෙන් ලැබෙන අධ්‍යාපනය යි. (4) පොතපතින් ලැබෙන අධ්‍යාපනය යි.

(22) දරුවකු මව් කුසයේ පිළිසිඳ ගැනීමෙන් පසුව කළල අවධියේ සිටම ඔහු මවගෙන් කායික ව හා මානසික ව පෝෂණය වන බව ප්‍රකාශිත බෞද්ධ සූත්‍රය කුමක් ද?

(1) සිඟාලෝවාද සූත්‍රය (2) චක්කවත්තිසීහනාද සූත්‍රය

(3) ඉන්දක සූත්‍රය (4) අංගුලිමාල සූත්‍රය

(23) ආක්‍රමණශීලී හා සුපහන් චර්යා රටාවන් ළමුන් තුළ ඇතිවීම කෙරෙහි සමාජානුයෝජනය ප්‍රබල සාධකයක් බව සමාජ විද්‍යා පර්යේෂණයකින් කරුණු තහවුරු කළේ,

(1) මාග්‍රට් මීඩ් හා රූත් බෙනඩික්ට් ය. (2) සිග්මන් ෆොයිඩ් හා ටයිලර්ය.

(3) ක්ලිෆඩ් ගියට්ස් හා මැලිනොවුස්කි ය. (4) රැල්ෆ් ලින්ටන් හා ඔග්බර්න් ය.

(24) බහුවිධ සමාජයන් තුළ උද්ගත වන්නාවූ ගැටුම් අවමකර යහපත් සමාජ සංවිධානයක් බිහිකර ගැනීම සඳහා වඩාත් උචිත ක්‍රියා මාර්ගය කුමක් ද?

(1) නීතිය කඩකරන පුද්ගලයින්ට දඬුවම් දීම

(2) සියලු ම සංස්කෘතික ඉගැන්වීම් විෂයමාලාවට එකතු කිරීම

(3) සියලු සංස්කෘතිකෘතීන්ට ගරු කිරීමට පුරුදු කිරීම

(4) බහුවිධ සංස්කෘතීන් පිළිබිඹු කෙරෙන උත්සව පැවැත්වීම

(25) විෂ්ණු හා ශිව වන්දනාව මූලික කරගත් ජන සමාජය කුමක් ද?

(1) ආදිවාසී ජන සමාජය (2) කතෝලික ජන සමාජය

(3) හින්දු ජන සමාජය (4) ඉස්ලාම් ජන සමාජය

(26) ''බෞද්ධයින්ගේ ආමිස පූජාවක් වන දන්සැල් දීම, වර්තමානය වන විට අන්‍ය ආගමිකයින් අතර ප්‍රචලිත වෙමින් පවතියි.'' මෙයින් ප්‍රකාශිත සමාජ විද්‍යාත්මක ලක්ෂණය වන්නේ,

(1) දන්සැල් දීම විනෝදාංශයක් කරගෙන ඇති බවයි.

(2) අන්‍ය ආගමිකයින් ද පින් කිරීමට කැමති බවයි.

(3) බහු සංස්කෘතික සමාජයක පවතින සබැඳියාවයි.

(4) අන්‍ය ආගමිකයින් බුදු දහම වැළඳගැනීමට කැමති බවයි.

(27) සමාජයක් තුළ අරගල, කෝලාහල, සාමය කඩවීම් හා විසංවිධානකාරී තත්ත්වයන් නිරතුරුව දැකිය හැකි ය. ඒ සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ මින් කුමක් ද?

(1) යහපත් චිත්තවේගයන් අනුව ක්‍රියා කිරීම. (2) ස්වයං පාලනයක් යුතුව ක්‍රියා කිරීම.

(3) සෘණාත්මක චිත්තවේගයන් අනුව ක්‍රියා කිරීම. (4) පංචශීල ප්‍රතිපදාව අනුගමනය කිරීම.

(28) මානව සමාජය ප්‍රභවයේ දී ම සමාජ පාලන ක්‍රමවේදයන් පැවති බවට තොරතුරු දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) චක්කවත්තිසීහනාද සූත්‍රය

(3) දසධම්ම සූත්‍රය (4) සාමඤ්ඤඵල සූත්‍රය

(29) රාමලාන් උපවාස මාසයේ දී ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ දිවා කාලයේ ආහාර ගැනීමෙන් වැලකී සිටීමේ චාරිත්‍රය අනුගමනය කරනුයේ,

(1) ආදිවාසී බැතිමතුන් ය. (2) හින්දු බැතිමතුන් ය.

(3) ඉස්ලාම් බැතිමතුන් ය. (4) කතෝලික බැතිමතුන් ය.

(30) ශ්‍රී ලංකාවේ බෞද්ධ දහම් පාසල් ආරම්භ කිරීමේ පුරෝගාමියා වන්නේ,

(1) අනගාරික ධර්මපාලතුමා ය. (2) එස්. මහින්ද හිමියන් ය.

(3) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාය. (4) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ය.

(31) විචාරශීලීව කල්පනා කර නිවැරදි තෝරාගැනීමක් සිදු කළ යුතු ආකාරය දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(1) චක්කවත්තිසීහනාද සූත්‍රය (2) මහාමංගල සූත්‍රය

(3) කාලාම සූත්‍රය (4) සිඟාලෝවාද සූත්‍රය

(32) රට, ජාතිය, ආගම හා භාෂාව ආදී සාධක මූලික කරගෙන සිදුකරන සියදිවි නසාගැනීම හැඳින්වෙන්නේ,

(1) ආත්මීය සියදිවි නසාගැනීම ලෙස ය. (2) අනෝමීය සියදිවි නසාගැනීම ලෙස ය.

(3) පරාර්ථකාමී සියදිවි නසාගැනීම ලෙස ය. (4) ආත්මාර්ථකාමී සියදිවි නසාගැනීම ලෙස ය.

(33) පහත වරණයන් අතුරින් සමාජ ගැටලුවක් නොවන වරණය කුමක් ද?

(1) ඒඩ්ස් රෝගය (2) කොවිඩ් රෝගය (3) කාන්තා හිංසනය (4) ස්වභාවික මරණ

(34) සමාජ තුළ ක්‍රියාත්මක "ඒකපති - ඒකපතිනී" සංකල්පය ක්‍රියාවට නැංවීම මගින්,

(1) සමාජ අපගමනය ඇති කරයි. (2) පවුල් සංස්ථාව ශක්තිමත් කරයි.

(3) සමාජ රෝග වර්ධනය කරයි. (4) සමාජ විසංවිධානය ඇති කරයි.

(35) ශ්‍රී ලාංකේය සමාජයේ සාමාජිකයින් සියදිවි නසාගැනීම සඳහා පෙළඹීමට බලපාන සාධකයක් නොවන්නේ,

(1) අනාගත අපේක්ෂාවන් බිඳවැටීම (2) විරැකියාව

(3) සතිපූජා පැවැත්වීම (4) තරුණ අසහනය

- **පහත සඳහන් සිද්ධිය ඇසුරින් 36 හා 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

කොරෝනා රෝගය ආසාදිතව සිටින සමිත පොඩි හාමුදුරුවන්ගේ හැසිරීම් විලාශය දෙස උඩු මහලේ ජනේලයකින් අමිත පොඩි හාමුදුරුවෝ සමිත හිමියන්ට නොදැනෙන ලෙස විපරම් කළහ. එහි දී දකනට ලැබුණු තොරතුරු අනුව සමිත හිමියන් අසාධ්‍ය තත්ත්වයකට පත්ව ඇති බව තීරණය කළ අමිත පොඩි හාමුදුරුවන් විගසින් ගොස් ඒ බව ලොකු හාමුදුරුවන්ට දැන්වීය.

(36) අමිත පොඩි හාමුදුරුවන් විසින් සමිත හිමියන්ගේ තත්ත්වය සොයා බැලීම පර්යේෂණ දත්ත රැස්කිරීමේ ක්‍රමයක් ලෙස හඳුන්වන්නේ,

(1) ඍජු නිරීක්ෂණය වශයෙනි. (2) වක්‍ර නිරීක්ෂණය වශයෙනි.
(3) සහභාගීත්ව නිරීක්ෂණය වශයෙනි. (4) ක්ෂේත්‍ර නිරීක්ෂණය වශයෙනි.

(37) අමිත හිමියන්ට ලැබුණු මූලික තොරතුරු අනුව සමිත හිමියන්ගේ තත්ත්වය පිළිබඳ ව එළඹුණු තීරණය පර්යේෂණ ක්‍රම විද්‍යාවේ දී හඳුන්වන්නේ,

(1) නිගමනය ලෙස ය. (2) උපන්‍යාසය ලෙස ය.
(3) අදහසක් ලෙස ය. (4) සාමාන්‍යනරණය ලෙස ය.

(38) දත්ත රැස්කිරීමේ දී සම්මුඛ සාකච්ඡා භාවිතයෙන් ලද හැකි වාසියක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) අනාවරණය නොවූ තොරතුරු මූලාශ්‍ර හඳුනාගත හැකිවීම
(2) රහස්‍ය තොරතුරු අනාවරණය කරගැනීමට හැකි වීම
(3) අමතර දත්ත අනාවරණය කරගැනීමට හැකි වීම
(4) විශාල නියැදියක් යොදාගත හැකි වීම

- පහත සඳහන් ක්‍රියා මාර්ග හොඳින් අධ්‍යයනය කරන්න.

A. ගැටලුවට අදාළ පර්යේෂණ අනාවරණ ප්‍රයෝජනයට ගෙන විසඳුම් යෝජනා කිරීම.
B. ගැටලුවට අදාළ ව බෞද්ධ මාර්ගෝපදේශන සේවාවන් ලබාදීමට යෝජනා කිරීම.
C. වරදකරුවන්ට මරණ දණ්ඩනය ලබාදීමට යෝජනා කිරීම.
D. ගැටලුවට අදාළ හේතුඵල සම්බන්ධතාව හඳුනාගෙන විසඳුම් යෝජනා කිරීම

(39) මත්ද්‍රව්‍ය භාවිතය නම් සමාජ ගැටලුවට සමාජ විද්‍යාත්මක ව ගතහැකි වඩාත් උචිත විසඳුම් යෝජනා අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හ D

- **පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.**

A. පිළිතුරු ලබා දීමට අවශ්‍ය කාලයක් ලබාදීම
B. ප්‍රශ්නයේ අරමුණු සරලව පැහැදිලි කිරීම
C. අවධානයෙන් ප්‍රතිචාරවලට සවන්දීම
D. එකවර ප්‍රශ්න කිහිපයක් ඇසීම

(40) ඉහත කරුණු අතුරෙන් සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස්කිරීමේ දී අනුගමනය කළයුතු කරුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**සමාජ විද්‍යාව - I, II** **4 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - II

**සැලකිය යුතුයි.**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) සමාජ විද්‍යාවේ න්‍යායාත්මක පසුබිම පෝෂණයට දායකවූ සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.
(ii) සමාජ විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර **දෙකක්** සඳහන් කරන්න.
(iii) සමාජ යහ පැවැත්මට උපයෝගී වන බුදු දහමේ ඉගැන්වෙන සාරධර්ම **දෙකක්** ලියන්න.
(iv) සමාජ විද්‍යාඥයින්ගේ මතවාදයන්ට අනුව සමාජ සංවර්ධනය වර්ග කළ හැකි ප්‍රධාන අවධි **දෙක** මොනවා ද?
(v) සී. එච්. කූලි දැක්වූ සමාජ සමූහ වර්ගීකරණය සඳහන් කරන්න.
(vi) මානව පවුලේ ප්‍රධාන කෘත්‍යයන් **දෙකක්** සඳහන් කරන්න.
(vii) සමාජ වෙනස්වීම පිළිබඳව අධ්‍යයනය කරන න්‍යායන් **දෙකක්** පෙන්වා දෙන්න.
(viii) සංස්කෘතියේ ප්‍රධාන කොටස් **දෙක** සඳහන් කරන්න.
(ix) සමාජ විවිධත්වය කෙරෙහි බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න.
(x) පර්යේෂණක දී දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයක් ලෙස අව්ධිමත් සම්මුඛ සාකච්ඡාවල ප්‍රබලතා **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) විද්‍යාවන් වර්ග කළ හැකි ප්‍රධාන කොටස් **දෙක** ලියන්න. (ලකුණු 02 යි)
(ii) දහනවවන සියවස පමණ වන විට බටහිර සමාජය විපර්යාසයන්ට පත් වීමට බලපෑ හේතු සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) සමාජ පාලනය සඳහා බෞද්ධ පංචශීල ප්‍රතිපත්තියේ වැදගත්කම අගය කරන්න. (ලකුණු 05 යි)

03. (i) හර්බට් ස්පෙන්සර් පෙන්වා දුන් සමාජ පරිණාමයේ යුග **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)
(ii) නවීකරණයේ අංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) ශ්‍රී ලාංකේය සමාජයේ වෙනස්වීම සඳහා පිරිවෙන් අධ්‍යාපනය බලපෑ ආකාරය සාධක **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

04. (i) ශ්‍රී ලාංකේය සමාජය තුළ විද්‍යමාන වන මහා සංස්කෘති **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සංස්කෘතිය පිළිබඳ සාකච්ඡා කිරීමට යොදා ගන්නා ප්‍රධාන එළඹුම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) "ශ්‍රී ලාංකේය සංස්කෘතියේ වෙනස්වීමට සංස්කෘතික සම්පර්කය බලපා ඇත." නිදසුන් **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

05. (i) නාගරික සමාජවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සුචරිත සමාජයකට මග පෙන්වන, බෞද්ධ සාර ධර්ම තේමා කර ගෙන රචනා කර ඇති සම්භාව්‍ය සාහිත්‍ය කෘති **තුනක** නම් ලියන්න. (ලකුණු 03 යි)

(iii) සමානාත්මතා සංකල්පය සඳහා බෞද්ධ සමාජ ව්‍යුහය බලපා ඇති ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

06. (i) මුස්ලිම් සමාජය පාලනයට උපකාරීවන ඉස්ලාම් ආගමික ධර්ම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාජ පාලනයට අධ්‍යාපනයෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) ස්වයං විනයක් ඇති කර ගැනීමට උපකාරීවන බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

07. (i) සිය දිවි නසා ගැනීම නම් සමාජ ගැටලුව වර්ධනය වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) සමාජ ගැටලුවක් හඳුනා ගැනීමට උපකාරීවන ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) ඒඩ්ස් වැනි සමාජ රෝග නිවාරණයට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

08. (i) පර්යේෂණයක් යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)

(ii) දත්ත රැස්කිරීමේ ක්‍රමයක් ලෙස නිරීක්ෂණ ක්‍රමයේ වාසි **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම රටක සංවර්ධනයට අවශ්‍ය බව කරුණු **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**සමාජ විද්‍යාව - I, II** **4 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - I

**සැ.යු.**

- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- ❖ අංක 01 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් වඩාත් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. සමාජ විද්‍යාව "මානව වංශ විද්‍යාව" ලෙස හඳුන්වන ලද්දේ,
    (1) එල්. ටී හොබ්හවුස් විසින් ය. (2) ජෝන් ස්ටුවට් මිල් විසින් ය.
    (3) ජේ. විල්කින්ස් විසින් ය. (4) එලිසබත් ජේ. විල්කින්ස් විසින් ය.

02. සමාජ විද්‍යාව බිහි වූයේ කුමන සමාජය පදනම් කර ගෙන ද?
    (1) බටහිර සමාජය (2) ආසියාතික සමාජය
    (3) ඇමරිකා සමාජය (4) අප්‍රිකා සමාජය

03. කාර්මික ක්ෂේත්‍රයෙහි විපර්යාසයක් ඇති කළ වාෂ්ප බලයෙන් ක්‍රියා කරන එන්ජිම නිපදවන ලද්දේ කවුරුන් විසින් ද?
    (1) සැමුවෙල් කොම්ප්ටන් (2) එඩ්මන් කාට්රයිට්
    (3) විලියම් සීමන්ස් (4) ජේම්ස් වොට්

04. මිනිසා හා සමාජය පිළිබඳ අධ්‍යයනය **නො කරන** විද්‍යාවක් වන්නේ මින් කුමක් ද?
    (1) දේශපාලන විද්‍යාව (2) මානව විද්‍යාව (3) පරිසර විද්‍යාව (4) ආර්ථික විද්‍යාව

05. යුරෝපා රාජ්‍යයන් ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වීමටත් ධනේශ්වර සමාජ ක්‍රමයකට ගමන් කිරීමටත් ඉවහල් වූ මූල සාධකය ප්‍රොතෙස්තන්ත්‍ර ධර්මය බව පෙන්වා දුන්නේ,
    (1) මැක්ස් වෙබර් ය. (2) ජෝර්ජ් රිට්සර් ය. (3) ජෝන් කැල්වින් ය. (4) මාටින් ලූතර් ය.

06. සත්තිගුම්භ ජාතකය හා සමාජ විද්‍යාව අතර සම්බන්ධය වඩාත් හොඳින් අධ්‍යයනය කළ හැකි සමාජ විද්‍යාවේ මූලික සංකල්පය මින් කුමක් ද?
    (1) සමාජ සංස්ථා (2) නිලබල ක්‍රමය (3) සමාජ ස්තරායනය (4) සමාජානුයෝජනය

07. "ලෝකය විද්‍යාත්මක ව පසක් කළ යුගය" ලෙස හැඳින්වෙන සමාජ පරිණාම අවධිය මින් කුමක් ද?
    (1) රණකාමී අවධිය (2) පාරභෞතික අවධිය
    (3) යථානුභූත අවධිය (4) දේවවාදී අවධිය

08. කාල් මාක්ස්ගේ අදහස්වලට අනුව සමාජවාදී අවධියට අයත් සමාජ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) ශ්‍රමය සූරාකෑමක් පැවතීම (2) සමාජ පන්ති පැවතීම

(3) පොදු දේපල අයිතියක් පැවතීම (4) සමාජ ගැටුම් පැවතීම

➢ අංක 9 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් කරුණු උපයෝගි කරගන්න.

(A) ආරෝපිත තත්ත්වයක් තිබීම (B) සාධිත තත්ත්වයක් තිබීම

(C) සරල ශ්‍රම විභජනයක් පැවතීම (D) දැඩි ශ්‍රම විභජනයක් පැවතීම

(E) නෛතික සමාජ පාලනය ප්‍රධාන වීම (F) අවිධිමත් සමාජ පාලනය ප්‍රධාන වීම

09. ඉහත ලක්ෂණ අතුරින් යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජ ලක්ෂණ පමණක් දක්නට ඇති පිළිතුර තෝරන්න.

(1) A , C හා E ය. (2) A , C හා F ය. (3) B , C හා E ය. (4) B , D හා E ය.

10. ඉහත ලක්ෂණ අතුරින් ඓන්ද්‍රිය ඒකාබද්ධතාව සහිත සමාජ ලක්ෂණ පමණක් දක්නට ඇති පිළිතුර කුමක් ද?

(1) A , C හා F ය. (2) A , D හා F ය. (3) B , C හා E ය. (4) B , D හා E ය.

➢ අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සමාජ ලක්ෂණ උපයෝගි කරගන්න.

(A) පරිත්‍යාගශීලී හා පරෝපකාරය මත ගොඩනැගුණු සම්බන්ධතා

(B) විශ්වය තරණයට යොමු වූ අධ්‍යාපනය

(C) මූල්‍යමය හා නෛතික තත්ත්වයන් මත ගොඩනැගුණ සම්බන්ධතා

(D) නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප මූලික කරගත් පාලනය

(E) අධ්‍යාත්මය තරණයට යොමු වූ අධ්‍යාපනය

(F) සිරිත් විරිත් වැනි සම්ප්‍රදායික සංකල්ප මූලික කරගත් පාලනය

11. ඉහත සමාජ ලක්ෂණ අතුරින් ශ්‍රී ලංකාවේ පැරණි සමාජයට අනන්‍ය වූ ලක්ෂණ පමණක් සඳහන් ව ඇති පිළිතුර තෝරන්න.

(1) A , B හා D ය. (2) A , E හා F ය. (3) B , C හා F ය. (4) B , D හා E ය.

12. ඉහත සමාජ ලක්ෂණ අතුරින් ශ්‍රී ලංකාවේ නූතන සමාජය තුළ ක්‍රියාත්මක ප්‍රධාන ලක්ෂණ පමණක් සඳහන් ව ඇති පිළිතුර කුමක් ද?

(1) A , B හා D ය. (2) A , D හා F ය. (3) B , C හා D ය. (4) B , D හා E ය.

13. නාගරික සමාජයේ දක්නට ලැබෙන ලක්ෂණයක් **නො වන්නේ** මින් කුමක් ද?

(1) ස්වයංපෝෂිත ආර්ථිකය (2) අධික ජනගහනය

(3) රැකියා වියුක්තිය (4) මුඩුක්කු නිවාස

➢ පහත සඳහන් කරුණු අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) ගොවිතැනට කැමති අයට බීජ ලබා දීම

(B) සොරුන් ආයුධවලින් මර්දනය කිරීම

(C) කර්මාන්ත කරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීම

(D) වෙළෙඳාමට කැමති අයට ප්‍රාග්ධනය ලබා දීම

14. චක්කවත්තිසීහනාද සූත්‍රයේ ඉගැන්වීම්වලට අනුව රාජ්‍ය පාලකයා විසින් සොරකමින් රට මුදවා ගැනීමට ගත යුතු ක්‍රියාමර්ග පමණක් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) A , B හා C ය. (2) A , B හා D ය. (3) A , C හා D ය. (4) B , C හා D ය.

15. බුදු දහමට අනුව දියුණුවේ ප්‍රධාන ආකාර **දෙක** වන්නේ,

(1) ලෞකික හා ආධ්‍යාත්මික දියුණුව යි.
(2) ලෞකික හා ආර්ථික දියුණුව යි.
(3) දේශපාලන හා ආර්ථික දියුණුව යි.
(4) ලෝකෝත්තර හා ආධ්‍යාත්මික දියුණුව යි.

16. සමාජ විද්‍යාත්මක එළඹුමට අනුව සංස්කෘතිය අධ්‍යයනය කරනු ලබන්නේ,

(1) සමාජයක ජීවත්වන මිනිසුන්ගේ චර්යා රටා ඇසුරිනි.
(2) මිනිස් සමාජයේ ආගමික චර්යා රටාවන් ඇසුරිනි.
(3) මිනිස් සමාජයක වින්දනාත්මක චර්යා රටා ඇසුරිනි.
(4) මිනිසාගේ ජීවන රටාව, චින්තන ක්‍රමය ආදිය ඇසුරිනි.

➢ පහත සඳහන් කරුණු අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) සංස්කෘතිය යනු මිනිසා විසින් ඉගෙන ගනු ලබන්නකි.
(B) සංස්කෘතිය කාලාන්තරයක් තිස්සේ හැඩගැසෙමින් සකස් වන්නකි.
(C) සංස්කෘතිය සමාජයෙන් සමාජයට ඒකාකාරී වේ.
(D) සංස්කෘතිය අපගේ චර්යාවන්ට මගපෙන්වයි.

17. සංස්කෘතියේ ස්වභාවය හා කාර්ය පිළිබඳ නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A , B හා C ය.
(2) A , B හා D ය.
(3) A , C හා D ය.
(4) B , C හා D ය.

18. ආවෘත සංස්කෘතියට අයත් අංගයක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) අදහිලි
(2) විශ්වාස
(3) සාරධර්ම
(4) දේවාල

➢ පහත සඳහන් කරුණු අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) උපසංස්කෘතිය ජාතික සංස්කෘතියක කොටසකි.
(B) යම් සමාජයක ජීවත්වන ජන වර්ගයකට අයිති සංස්කෘතියකි.
(C) ප්‍රධාන සංස්කෘතියක් ඇතුළත උපසංස්කෘති ගණනාවක් බිහි විය හැකි ය.
(D) මහා සංස්කෘතියට අයත් එහෙත් ඔවුන්ට ම සුවිශේෂී වූ ඇගයීම් හා චර්යාවන්ගෙන් යුතු සමූහයකි.

19. උප සංස්කෘතියේ ස්වභාවය පිළිබඳ නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A , B හා C ය.
(2) A , B හා D ය.
(3) A , C හා D ය.
(4) B , C හා D ය.

20. ඉස්ලාම් සංස්කෘතියට අනුව දෙවියන් වහන්සේ අනුමත කළ ජීවන දර්ශනය ඇතුළත් ආගමික ග්‍රන්ථය වන්නේ මින් කුමක් ද?

(1) අල් - කුරාණය
(2) භගවත් ගීතාව
(3) බයිබලය
(4) උත්තරාධ්‍යයනය

21. සිංහල රාජධානියේ පොදු අවශ්‍යතා ඉටු කර ගැනීමේ පදනම මත ගොඩනැගී තිබූ ශිල්පීය කුල තාක්ෂණය අහිමි වූයේ කෝල්බෲක් හා කැමරන් කොමිසමේ කුමන නිර්දේශය ක්‍රියාත්මක වීමෙන් පසු ව ද?

(1) ලංකාවේ පාසල්වල අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වාගෙන යාම
(2) බ්‍රිතාන්‍ය වැසියන්ට ලංකාවේ පෞද්ගලික ඉඩම් හිමි කර ගැනීමේ සීමාව ඉවත් කිරීම
(3) දිවයින පුරා ආගම ව්‍යාප්ත කිරීමේ නිදහස මිෂනාරීන්ට නීත්‍යානුකූල ව ලබා දීම
(4) රාජකාරී ක්‍රමය හෙවත් අනිවාර්ය සේවා ක්‍රමය අත්හිටුවීම

22. ශ්‍රී ලාංකේය සමාජයේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ප්‍රතිශතය ඉහළ යාම තුළින් අදහස් වන්නේ,
   (1) ආර්ථිකය සංවර්ධනය වී ඇති බව යි.
   (2) දුප්පත්කම වැඩි වී ඇති බව යි.
   (3) රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සාර්ථක වී ඇති බව යි.
   (4) රැකියා නියුක්තිය ඉහළ ගොස් ඇති බව යි.

23. සමාජ මානව විද්‍යාඥයින්ට අනුව පුද්ගල පෞරුෂ වර්ධනය කෙරෙහි වඩාත් ම බලපාන්නේ මින් කුමන සාධකය ද?
   (1) ජීව විද්‍යාත්මක සාධක
   (2) මනෝ විද්‍යාත්මක සාධක
   (3) සමාජ හා සංස්කෘතික සාධක
   (4) පාරිසරික සාධක

24. බහුවිධ සමාජයක දක්නට ලැබෙන යහපත් ලක්ෂණය වන්නේ මින් කුමක් ද?
   (1) තම ජන කොටසට ආවේණික ලක්ෂණ පවත්වා ගනිමින් සමස්ත සමාජය සමග එකට ජීවත් වීම
   (2) යම් ජන කණ්ඩායමකට ආවේණික ලක්ෂණ පහත් කොට සලකා කටයුතු කිරීම
   (3) තම ජන කණ්ඩායමකට ආවේණික ලක්ෂණ උතුම් ඒවා බව ප්‍රදර්ශනය කිරීම
   (4) තම ජන කොටසට ආවේණික ලක්ෂණ සමස්ත සමාජයට ම ආදේශ කිරීමට කටයුතු කිරීම

25. ශ්‍රී ලංකාවේ වෙසෙන සෑම පුද්ගලයෙකුට ම තමන්ගේ ආගම, සංස්කෘතිය හා තමන්ගේ අනන්‍යතාව පවත්වා ගෙන යාමට අවශ්‍ය නෛතික රැකවරණයට අදාළ මූලික නීති සඳහන් ව ඇත්තේ,
   (1) අධිකරණ නඩු වාර්තාවල ය.
   (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ය.
   (3) මානව හිමිකම් වාර්තාවල ය.
   (4) පළාත් සභා ප්‍රඥප්ති තුළ ය.

26. බෞද්ධ සාරධර්ම නිරූපණය වන සාහිත්‍ය කෘතියක් **නො වන්නේ** මින් කුමක් ද?
   (1) සුභාෂිතය (2) ලෝවැඩ සඟරාව (3) අමාවතුර (4) රාමායණය

27. “රාමලාන් මාසය තුළ දිවා කාලයේ ආහාරයෙන් වැළකී සිටීම “ ඉස්ලාම් ආගමේ සමාජ පාලනය විදහා දැක්වෙන ඉගැන්වීමකි. මෙය හඳුන්වනු ලබන්නේ,
   (1) සලාතය ලෙස යි. (2) සකාතය ලෙස යි. (3) උපවාසය ලෙස යි. (4) හජ්ජිය ලෙස යි.

28. අධ්‍යාපනය මගින් බිහි කරන පූර්ණ පෞරුෂයකින් යුතු මිනිසා යනු ස්වකීය සංස්කෘතික අනන්‍යතාව තුළ,
   (1) ගුණ නුවණින් හා හැකියාවෙන් යුතු අයෙකි.
   (2) ඥානවන්ත පුද්ගලයෙකි.
   (3) යහපත් ගුණධර්මවලින් හෙබි පුද්ගලයෙකි.
   (4) කුසලතාවෙන් යුතු අයෙකි.

29. සමාජ පාලනය සඳහා සෘජු දායකත්වයක් දහම් අධ්‍යාපනයෙන් සිදු වේ. ලක්දිව බොදු දරුවන් සඳහා ඉරුදින දහම් පාසල් ආරම්භ කිරීමට පුරෝගාමී වූයේ,
   (1) වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමි ය.
   (2) වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා ය.
   (3) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය.
   (4) වැලිගම ශ්‍රී සුමංගල නාහිමි ය.

30. භික්ෂූන් වහන්සේලා, සමාජයේ පාලක පාලිත දෙපක්ෂයට ම මග පෙන්වන පුරෝගාමී නායකයන් බවට පත්වීම සඳහා බලපාන ප්‍රධාන සාධකය මින් කුමක් ද?
   (1) පිරිවෙන් විහාරස්ථාන ආරම්භ කර ඉගෙනීම සඳහා පහසුකම් සැලසීම
   (2) අල්පේච්ඡතා ගුණයෙන් යුතු ව ආත්ම විමුක්තිය සඳහා මග පෙන්වීම
   (3) අපක්ෂපාතී ව පොදුජන යහපත සඳහා බෞද්ධ ඉගැන්වීම්වලට අනුව අනුශාසනා කිරීම
   (4) සමාජ සේවා ආයතන පිහිටුවා ඒවායේ සංවර්ධනය සඳහා කැපවීමෙන් යුතු ව කටයුතු කිරීම

➢ පහත සඳහන් කරුණු අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) සමාජයේ වැඩි පිරිසකට අයහපත් ලෙස බලපෑම

(B) සාමාජිකයින් විසින් විසඳුම් සෙවීමට උත්සාහ ගැනීම

(C) සමාජය තුළින් ම උපත ලැබීම හා විසඳුම් නිර්මාණය කර ගැනීමට හැකි වීම

(D) අධිස්වාභාවික බලවේග ඇසුරින් පමණක් විසඳුම් පැවතීම

31. සමාජ ගැටලුවක පවතින ලක්ෂණ පමණක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A , B හා C (2) A , B හා D (3) A , C හා D (4) B , C හා D

➢ පහත දැක්වෙන A , B, C හා D සිද්ධි යුගල හොඳින් අධ්‍යයනය කර අංක 32 සහ 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A (i) සමාජ අනෝමීය තත්ත්වය
(ii) සියදිවි නසා ගැනීම

B (i) කාමමිථ්‍යාචාරය
(ii) ඒඩ්ස් රෝග ව්‍යාප්තිය

C (i) අසීමිත ආශාවන් පාලනය
(ii) ඉච්ඡාභංගත්වය

D (i) තරුණ පරපුරේ නිරෝගී භාවය
(ii) සමාජ පරිහානිය

32. අංක (i) හි වැඩි වීම අංක (ii) හි වැඩිවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක මොනවා ද?

(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

33. අංක (i) හි වැඩි වීම අංක (ii) හි අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක සඳහන් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

34. මුඩුක්කු පැල්පත් වාසී සමාජයේ බහුල ව දක්නට **නො ලැබෙන** සමාජ විරෝධී ක්‍රියාව මින් කුමක් ද?

(1) මත්ද්‍රව්‍ය විකිණීම හා භාවිතය (2) ගණිකා වෘත්තියේ නියැලීම

(3) ජනවාර්ගික ගැටුම් (4) කුලියට මිණී මැරීම

35. සමාජ ගැටලු නිවාරණයෙහිලා මෛත්‍රී සහගත චර්යාව අතිශයින් වැදගත් වේ. එලෙස අවෛරී සමාජයක් නිර්මාණය කර ගැනීමට මග පෙන්වනු ලබන බෞද්ධ සූත්‍රය මින් කුමක් ද?

(1) රතන සූත්‍රය (2) පරාභව සූත්‍රය

(3) මහාමංගල සූත්‍රය (4) කරණීය මෙත්ත සූත්‍රය

➢ පහත සඳහන් අරමුණු ඇසුරින් අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) ශාස්ත්‍රීය අරමුණු (B) සමාජීය අරමුණු

(C) දේශපාලන අරමුණු (D) උපයෝගිතා අරමුණු

36. මූලික වශයෙන් සමාජ විද්‍යා පර්යේෂණවල අරමුණු වර්ග කළ හැකි කාණ්ඩ දෙක දැක්වෙන වරණය තෝරන්න.

(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා D

37. 'පර්යේෂණ ගැටලුව' සම්බන්ධ ව වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) පර්යේෂණයේ අරමුණු ගැන කරන ප්‍රකාශයකි.

(2) එදිනෙදා ජීවිතයේ දී හමුවන ප්‍රශ්නයක් පිළිබඳ ප්‍රකාශනයකි.

(3) සමාජ සිදුවීම් ඇසුරින් පර්යේෂණ ගැටලුවක් සකස් කර ගැනීම ඉතා පහසු කාර්යයකි.

(4) ශාස්ත්‍රීය ගවේෂණයකට වැදගත් වන සංකල්පමය විමර්ශනයක් පිළිබඳ ප්‍රකාශනයකි.

➢ **පහත සඳහන් සිද්ධිය ඇසුරින් 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පිරිවෙනේ සිටි දක්ෂ සිසුවෙකු වූ නිමල්ගේ හැසිරීම මාස කිහිපයක සිට අයහපත් පැත්තකට වෙනස් වී ඇත. ඔහුගේ චර්යාවට බලපා ඇති හේතු විද්‍යාත්මක ව සොයා බලා එම ගැටලුවලට විසඳුම් හඳුනා ගැනීමට සමාජ විද්‍යාව ඉගෙනුමෙන් ලබා ගත් දැනුම උපයෝගි කර ගැනීමට අජිත් තීරණය කළේ ය. අනතුරු ව නිමල්ගේ ක්‍රියාකලාපය පිළිබඳ නිරීක්ෂණ කර ඒ සඳහා බලපා ඇත්තේ යම් මත්ද්‍රව්‍යකට පුරුදු වීම බව අනුමාන කරන ලදී.

පසු ව අජිත් උපක්‍රමශීලී ව නිමල්ගේ කළණ මිතුරෙකු බවට පත් විය. අනතුරු ව ඔහු සමග කටයුතු කරමින් හා ඔහු ඇසුරු කරන මිතුරන් ඇසුරු කරමින් තොරතුරු සොයා බලා අවශ්‍ය කරුණු වාර්තා කර ගන්නා ලදී. එම තොරතුරු විශ්ලේෂණයෙන් පසු තම අනුමානය නිවැරදි බව අනාවරණය විය. ගැටලුවට බලපෑ හේතු සාධක අනාවරණය කරගත් අජිත් ඒ පිළිබඳ ව පරිවෙණාධිපති හිමියන් දැනුවත් කර නිමල් නිවැරදි මාවතට ගැනීමට අවශ්‍ය මාර්ගය විවර කරන ලදී.

38. නිමල්ගේ චර්යාව පිළිබඳ සොයා බලා විසඳුම් හඳුනා ගැනීමට අජිත් අනුගමනය කළ ක්‍රියාවලිය සමාජ විද්‍යාවේ දී හඳුන්වනු ලබන්නේ,

(1) නිරීක්ෂණයක් ලෙස යි. (2) පර්යේෂණයක් ලෙස යි.

(3) අනාවරණයක් ලෙස යි. (4) පරීක්ෂණයක් ලෙස යි.

39. අජිත් විසින් නිමල් පිළිබඳ තොරතුරු සොයා බැලීමට අනුගමනය කළ නිරීක්ෂණ ක්‍රමය කුමක් ද?

(1) සහභාගිත්ව නිරීක්ෂණය (2) වක්‍ර නිරීක්ෂණය

(3) ඍජු නිරීක්ෂණය (4) පූර්ව නිරීක්ෂණය

40. නිමල්ගේ චර්යා වෙනසට හේතුව ලෙස අජිත් ඇති කර ගත් අනුමානය පර්යේෂණ ක්‍රම විද්‍යාවේ දී හඳුන්වනු ලබන්නේ,

(1) සාධක ලෙස ය. (2) උපන්‍යාස ලෙස ය.

(3) නිගමන ලෙස ය. (4) දත්ත ලෙස ය.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**සමාජ විද්‍යාව - I, II** **4 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - II

**සැලකිය යුතුයි.**
❖ **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) දහනව වන සියවස වන විට බටහිර සමාජය තුළ විපර්යාසයන් සිදු වීමට බලපෑ හේතු **දෙකක්** ලියන්න.
(ii) ඔගස්ට් කොම්ට් දැක්වූ යථානුභූත සමාජ අවධිය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(iii) ව්‍යග්ගපජ්ජ සූත්‍රයට අනුව මෙලොව යහපත් කර ගැනීමට හේතු වන කරුණු **දෙකක්** ලියන්න.
(iv) සියලු ම ආගම්වලට පොදු ලක්ෂණ අතුරින් **දෙකක්** සඳහන් කරන්න.
(v) භෞතික සංස්කෘතියට අයත් අංග හඳුනා ගත හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න.
(vi) පිරිවෙන් ශිෂ්‍යයා යන තත්ත්වයට අදාළ කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.
(vii) ශ්‍රී ලාංකේය ග්‍රාමීය සමාජවල දක්නට ලැබෙන යහපත් ලක්ෂණ **දෙකක්** ලියන්න.
(viii) ඩෙංගු උවදුර වළක්වා ගැනීමට කළ හැකි කාර්යයන් **දෙකක්** යොජනා කරන්න.
(ix) තොරතුරු රැස් කර ගැනීමට සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ වාසි **දෙකක්** ලියන්න.
(x) **ගිබන්** නම් ඉතිහාසඥයාට අනුව පුද්ගලයාට අධ්‍යාපනය ලබා ගත හැකි ක්‍රම **දෙක** මොනවා ද?

(ලකුණු 2 x 10 = 20)

02. (i) සමාජ විද්‍යාව අර්ථකථනය කරන්න. (ලකුණු 02)
(ii) සමාජ විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
(iii) යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට පංචශීලයේ ඇති වටිනාකම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (i) සමාජ වෙනස් වීම පිළිබඳ න්‍යායාත්මක විග්‍රහයන් ඉදිරිපත් කර ඇති ප්‍රවේශ **දෙකක්** ලියන්න. (ලකුණු 02)
(ii) මැක්ස් වෙබර් පෙන්වා දුන් ආධිපත්‍ය සංකල්ප **තුන** මොනවා ද? (ලකුණු 03)
(iii) සමාජයේ ගුණාත්මක පරිවර්තනයක් සඳහා විහාරස්ථානය මගින් සිදු විය යුතු කාර්යයන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) සංස්කෘතිය නිර්වචනය නරන්න. (ලකුණු 02)

(ii) දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික හා අධ්‍යාත්මික සංවර්ධනයට උපයෝගි කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** අගය කරන්න. (ලකුණු 05)

05. (i) බහුවිධ සමාජයක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) නාගරික සමාජවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) බුදු දහම මානව කේන්ද්‍රණවාදය ප්‍රතික්ෂේප කරන දර්ශනයකි. නිදසුන් **දෙකක්** ඇසුරින් පහදන්න. (ලකුණු 05)

06. (i) සමාජ පාලනයට මග පෙන්වනු ලබන කිතුනු දහමට අයත් දසපනතේ අංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සමාජ පාලනය සඳහා භික්ෂූන් වහන්සේලාගෙන් සිදු විය යුතු කාර්යයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සමාජ පාලනය සඳහා අධ්‍යාපනයේ ඇති වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. (i) ශ්‍රී ලාංකේය සමාජයේ සියදිවි නසා ගැනීමේ ප්‍රතිශතය අඩු කර ගැනීමට සුදුසු යෝජනා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සමාජ ගැටලු ඇති වීම කෙරෙහි බලපාන සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සමජ ගැටලු නිරකරණය සඳහා සාමාජිකයින් තුළ සංවර්ධනය කර ගත යුතු ගුණ ධර්ම **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

08. (i) නිරීක්ෂණයෙන් ලබා ගන්නා තොරතුරුවල විශ්වසනීය බව හා වලංගුතාව ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) තොරතුරු ලබා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ දී පර්යේෂකයා විසින් අවධානය යොමු කළ යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සමාජ විද්‍යා පර්යේෂණවල වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக் கல்விப் பிரிவு

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 04 ශ්‍රේණිය

## (08) සමාජ විද්‍යාව - I, II

| 08 | S | I, II |
|---|---|---|

පැ තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

### සමාජ විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. සමාජ විද්‍යාව "මානව වංශ විද්‍යාව" ලෙස හඳුන්වන ලද සමාජයීය විද්‍යාඥයා කවු ද?
(1) එලිසබත් ජේ. විල්කින්ස් (2) එල්. ටී. හොබ්හවුස්
(3) ජෝන් ස්ටුවට් මිල් (4) රොබට් පාර්ක්

2. නිදහස, සමානාත්මතාව හා අයිතිවාසිකම් දිනා ගැනීමට මගපෙන් වූ ප්‍රංශ විප්ලවය සිදු වූයේ කුමන වර්ෂයේ දී ද?
(1) 1730 (2) 1789 (3) 1838 (4) 1917

3. 15 වන හා 16 වන වන සියවස්වල බටහිර සමාජය තුළ ව්‍යාප්ත වූ විද්‍යාත්මක පුනරුදය නිසා,
(1) රාජාණ්ඩු පාලනය ශක්තිමත් විය. (2) සාම්ප්‍රදායික චින්තනයේ වර්ධනයක් සිදු විය.
(3) ගතානුගතික මතවාද ව්‍යාප්ත විය. (4) විද්‍යාත්මක අදහස් ව්‍යාප්ත විය.

- පහත කරුණු හොඳින් අධ්‍යයනය කර ප්‍රශ්න අංක 4ට පිළිතුරු සපයන්න.

A - දේශපාලනික ප්‍රතිසංස්කරණ
B - ධනවාදයේ නැගී සිටීම.
C - ගෘහ කර්මාන්ත ව්‍යාප්ත වීම.
D - නාගරීකරණය

4. ජෝර්ජ් රිට්සර් දැක්වූ බටහිර සමාජය විපර්යාසය වීමට බලපෑ සාධක පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B හා D (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

- පහත කරුණු හොඳින් අධ්‍යයනය කර අංක 4 වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - සමාජානුයෝජන ක්‍රියාවලිය බිඳ වැටීම.
B - ඒකාධිපති පාලනය බිඳ වැටීම.
C - ආගමික සාරධර්මවල බලපෑම අඩු වීම.
D - ආගමික සංස්ථා බිඳ වැටීම.

5. ධනවාදී ආකල්ප බටහිර සමාජය තුළ ව්‍යාප්ත වීම නිසා පවුල් සංස්ථාව බිඳ වැටීමෙන් ඇති වූ සමාජ ගැටලු පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

6. ස්වාභාවික විද්‍යා කාණ්ඩයට අයත් විෂයයන් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර මින් කුමක් ද?
(1) ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව
(2) මනෝ විද්‍යාව, මානව විද්‍යාව, සමාජ විද්‍යාව
(3) දේශපාලන විද්‍යාව, රසායන විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව
(4) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, තාරකා විද්‍යාව

[2 වැනි පිටුව බලන්න.

7. පුද්ගල සමාජානුයෝජනය කෙරෙහි සමාජයෙන් සිදු වන බලපෑම වඩාත් හොඳින් විග්‍රහ කර ගත හැකි ජාතක කථාව මින් කුමක් ද?
   (1) ඉල්ලීස ජාතකය
   (2) සත්තිකුම්භ ජාතකය
   (3) සාම ජාතකය
   (4) මහා සුපින ජාතකය

8. **"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි"** යන සංකල්පයෙන් වඩාත් හොඳින් විග්‍රහ කෙරෙන බෞද්ධ සමාජ විද්‍යාත්මක මූලධර්මය කුමක් ද?
   (1) කෘත්‍යවාදය
   (2) පරිණාමවාදය
   (3) සමාජානුයෝජනය
   (4) තත්ත්වය හා කාර්යභාරය

9. පුද්ගල උපත අනුව ගොඩනැගෙන තත්ත්වය හැඳින් වෙන්නේ,
   (1) සාධිත තත්ත්වය ලෙස ය.
   (2) ආරෝපිත තත්ත්වය ලෙස ය.
   (3) ගතික තත්ත්වය ලෙස ය.
   (4) ස්ථිතික තත්ත්වය ලෙස ය.

- පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කර 10 සිට 12තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - සාධාරණ ශ්‍රම විභජනයක් පැවතීම
  B - රදලයාට සියලු දේපලවල අයිතිය ලැබීම
  C - ලාභය මත නිෂ්පාදනය සිදු කිරීම
  D - දේපල පිළිබඳ පොදු අයිතියක් තිබීම
  E - ධනපති හා නිර්ධන වශයෙන් පන්ති දෙකක් පැවතීම
  F - රදල හා ප්‍රවේණිදාස වශයෙන් පන්ති දෙකක් පැවතීම

10. පූර්ව කොමියුනිස්ට් සමාජයක ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද ?
    (1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

11. වැඩවසම් සමාජයක ලක්ෂණ නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
    (1) A හා B ය. (2) A හා E ය. (3) B හා C ය. (4) B හා F ය.

12. ධනවාදී සමාජයක ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
    (1) A හා B (2) A හා C (3) B හා F (4) C හා E

- පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කර 13 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - මහා පරිමාණ කර්මාන්තශාලා බිහි වීම.
  B - සංකීර්ණ සමාජ සම්බන්ධතා පැවතීම.
  C - නිෂ්පාදන කාර්යයේ දී යන්ත්‍රවලට ප්‍රමුඛතාව ලැබීම.
  D - සාම්ප්‍රදායික පාලන ක්‍රම වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ව්‍යාප්ත වීම.
  E - පොදු පහසුකම් වර්ධනය වීම.
  F - සරල සන්නිවේදන ක්‍රම වෙනුවට බහු ජනමාධ්‍ය ක්‍රම භාවිතයට යොමු වීම.

13. කාර්මීකරණයේ මූලික ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
    (1) A හා B (2) A හා C (3) B හා E (4) D හා F

14. නාගරික සමාජයේ මූලික ලක්ෂණ පමණක් සඳහන් වරණය වන්නේ,
    (1) A හා C ය. (2) B හා C ය. (3) B, හා E ය. (4) C හා F ය.

15. නවීකරණයේ අංශවල සිදු වන වෙනස්කම් පමණක් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
    (1) A හා B (2) A හා C (3) D හා F (4) E හා F

16. යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජයක සිට ඓන්ද්‍රිය ඒකාබද්ධතාව සහිත සමාජක් දක්වා සමාජය පරිණාමය වූ බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා වන්නේ,
    (1) ඔගස්ට් කොම්ට් ය.
    (2) හර්බට් ස්පෙන්සර් ය.
    (3) එමිල් ඩුර්කයිම් ය.
    (4) මැක්ස් වෙබර් ය.

[3 වැනි පිටුව බලන්න.

17. යුතුකම් ඉටු කර අයිතිවාසිකම් දිනාගැනීමේ අගය වඩාත් හොඳින් විග්‍රහ වන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක් ද?
(1) පරාභව සූත්‍රය (2) සිගාලෝවාද සූත්‍රය (3) වසල සූත්‍රය . (4) මහා මංගල සූත්‍රය

18. බෞද්ධ සමාජ පන්ති ක්‍රමයට පදනම් වී ඇත්තේ,
(1) සීලයයි. (2) කුලයයි. (3) ධනයයි. (4) බලයයි

- පහත සඳහන් A, B, C හා D යන සිද්ධි යුගල අධ්‍යයනය කර අංක 19 සහ 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - (i) උත්සාහ සම්පත්තිය
(ii) දෙලොව දියුණුව
B - (i) ආරක්ෂා සම්පත්තිය
(ii) ධන විනාශය
C - (i) කල්‍යාණ මිත්‍ර ඇසුර
(ii) යහපත් චර්යා
D - (i) පමණ දැන සමව කටයුතු කිරීම
(ii) ණයගැතිභාවය

19. අංක (i) වැඩි වීම, අංක (ii) හි වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) B සහ D ය.

20. අංක (i) වැඩි වීම, අංක (ii) හි අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක තෝරන්න.
(1) A සහ B (2) A සහ C (3) B සහ D (4) C සහ D

21. බී. මැලිනොවුස්කිගේ සංස්කෘතිය පිළිබඳ නිර්වචනයට පදනම් වී ඇත්තේ,
(1) මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා ආකාරයයි. (2) පුද්ගල සමූහයක සංවිධානාත්මක ස්වරූපයයි.
(3) ජීවන රටාවන්ගේ ස්වරූපයයි. (4) භෞතික හා අභෞතික අංගයි.

22. බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව කෘෂිකර්මය, කර්මාන්ත හා වෙළෙඳාම ආදි ආර්ථික කටයුතුවල නිරත වීමට අවසරය හිමි වූ සමාජ ස්තරය කුමක් ද?
(1) ක්ෂත්‍රිය (2) වෛශ්‍යය (3) බ්‍රාහ්මණ (4) ශුද්‍රය

23. සමාජ පැවැත්ම ඵලදායීව සිදු කිරීමට මගපෙන්වන කරුණු තිස් අටකින් යුතු සාරධර්ම පද්ධතියක් දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?
(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) කූටදන්ත සූත්‍රය (3) මහා මංගල සූත්‍රය (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

24. "ප්‍රාථමික සංස්කෘතිය" නම් කෘතිය මගින් සංස්කෘතිය පිළිබඳ වටිනා කරුණු රැසක් අනාවරණය කළ මානව විද්‍යාඥයා කවුද?
(1) රේමන්ඩ් ෆර්ත් (2) ඊ. බී. ටයිලර් (3) රැල්ෆ් ලින්ටන් (4) බී. මැලිනොවුස්කි

- පහත ප්‍රකාශ හොඳින් අධ්‍යයනය කර අංක 24 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - මිනිසාට තමා අවට පරිසරය තමාට කැමති ලෙස සකස් කර ගැනීමට මග පෙන්වීම
B - සමාජයේ සෙසු සාමාජිකයන් සමග සහයෝගී ව සාමූහික ජීවන රටාවක් ගෙන යාමට මග පෙන්වීම
C - පවතින සංස්කෘතිකාංගයන්ට අනුගත ව ම රාමුගත ජීවිතයක් ගත කිරීමට මග පෙන්වීම
D - සම්ප්‍රදායන් අධ්‍යයනයෙන් නව දර්ශනයක් හා චින්තනයක් ප්‍රතිෂ්ඨාපනයට මග පෙන්වීම

25. සංස්කෘතියෙන් ඉටු වන ප්‍රධාන සේවාවන් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

26. විචාරශීලී චින්තනයෙන් යුතුව තීරණවලට එළඹීමේ ආකාරය දැක්වෙන බෞද්ධ සූත්‍රය මින් කුමක් ද?
(1) පරාභව සූත්‍රය (2) වසල සූත්‍රය (3) කාලාම සූත්‍රය (4) ඉන්දක සූත්‍රය

27. ශ්‍රී ලාංකේය සමාජ පාලනය සඳහා භාවිත වන දිසාපති, උප දිසාපති හා කච්චේරි ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ,
(1) පෘතුගීසීන් විසිනි. (2) ද්‍රවිඩයන් විසිනි. (3) ඉංග්‍රීසීන් විසිනි. (4) ලන්දේසීන් විසිනි.

28. "දේවධර්මය" ලෙසින් හැඳින්වෙන බෞද්ධ සමාජ පාලන සංකල්පය කුමක් ද?
(1) හිරි ඔත්තප්ප (2) කර්මය (3) පුනර්භවය (4) ත්‍රිලක්ෂණය

29. ශ්‍රී ලාංකේය බෞද්ධ දරුවන්ට දහම් අධ්‍යාපනය ලබා දීම සඳහා දහම් පාසල් ආරම්භ කිරීමට පුරෝගාමී වූයේ කවුද?
(1) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා (2) අනගාරික ධර්මපාලතුමා
(3) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා (4) වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා

- පහත දැක්වෙන කරුණු ඇසුරින් 30 සහ 31 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - අදත්තාදානය නො කිරීම
B - නිරතුරුව ම ප්‍රණාමයේ යෙදීම
C - කාමය වරදවා නො හැසිරීම
D - පොහොසත් අය සිදු කළ යුතු අනිවාර්ය දන් දීම
E - ප්‍රාණඝාතය නො කිරීම
F - රාමළාන් මාසයේ දී දිවා කාලයේ නිරාහාර ව සිටීම

30. කතෝලික ආගමේ දසපනතට අයත් අංග පමණක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) A, B හා C (2) A, C හා E (3) B, C හා D (4) B, E හා F

31. ඉස්ලාම් ආගමේ අනිවාර්ය ඉගැන්වීම්වලට අයත් සංකල්ප පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) A, C හා E ය. (2) B, C හා F ය. (3) B, D හා F ය. (4) C, D හා F ය.

32. ශ්‍රී ලංකාවේ පැරණි ගම් පිළිබඳ තොරතුරු දැක්වෙන **"එදා හෙළ දිව"** කෘතියේ කතුවරයා කවුද?
(1) නිව්ටන් ගුණසිංහ (2) නුර් යාල්මාන් (3) ඊ. ආර්. ලීච් (4) රොබට් නොක්ස්

- පහත 'අ' තීරුවෙන් මානව චර්යාවන් ද 'ආ' තීරුවෙන් එම චර්යාවන් වර්ධනය වීමෙන් ඇති වන සමාජ ගැටලු කිහිපයක් ද දැක්වේ. ඒවා අධ්‍යයනය කර 33 වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1.අදින්නාදාන | A - මදිරාබාධය |
| 2.කාමමිත්‍යාචාර | B - මනුෂ්‍ය ඝාතන |
| 3.සුරාධූර්ත | C - ඒඩ්ස් රෝගය |
| 4.ප්‍රාණඝාත | D - හොරකම |

33. ඉහත 'අ' තීරුවේ දැක්වෙන චර්යාවන්ට අදාළව 'ආ' තීරුවේ ගැටලු ගැළපූ විට වඩාත් ම නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A, B, C හා D (2) C, A, D හා B (3) C, B, A හා D (4) D, C, A හා B

- පහත දැක්වෙන සිය දිවි නසා ගැනීමට තුඩුදෙන හේතු හොඳින් අධ්‍යයනය කර 34 සහ 35 වෙනි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - වී අස්වැන්න සාධාරණ මිලකට විකුණා ගැනීමට නො හැකි වීමෙන්
B - මුහුදේ ගිලෙමින් සිටින පිරිසක් බේරා ගැනීමට උත්සාහ කිරීමෙන්
C - දුප්පත්කම නිසා ආදරය පිළිබඳ බලාපොරොත්තු බිඳ වැටීමෙන්
D - යුද්ධයක දී අනෙක් සාමාජිකයන් බේරා ගැනීම සඳහා ඉදිරියට පැමිණීමෙන්
E - විභාගයෙන් අසමත් වීම නිසා ඇති වූ සමාජ පීඩනය දරා ගැනීමට නොහැකි වීමෙන්

34. සමාජ අනෝමීය තත්ත්වය නිසා සිය දිවි නසා ගැනීමට තුඩු දෙන හේතු පමණක් නිවැරදිව සඳහන් වරණය කුමක් ද?
(1) A, C හා E (2) B, C හා D (3) B, D හා E (4) C, D හා E

35. පරහිතකාමී සිය දිවි නසා ගැනීමට තුඩු දෙන හේතු පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A හා C (2) B හා D (3) C හා D (4) D හා E

36. "පර්යේෂණය" පිළිබඳ වඩාත් නිවැරදි අර්ථ දැක්වීම මින් කුමක් ද?
(1) ගැටලුවක් සම්බන්ධව තොරතුරු ගවේෂණය කිරීමයි.
(2) ප්‍රවේශම් සහගත සොයා බැලීමක් තුළින් නව දැනුම හා එයට බලපාන හේතු සාධක සොයා බැලීමයි.
(3) නොදන්නා දෙයක් පිළිබඳ කරුණු රැස් කර වාර්තා කිරීමයි.
(4) ගැලුවක් විශ්ලේෂණය කර නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීමයි

37. පර්යේෂණයක දී දත්ත රැස් කිරීම සඳහා භාවිත කරන නිරීක්ෂණය යනු,
(1) පරීක්ෂකයා සහභාගිවන ක්ෂේත්‍රය තුළ සජීවී තොරතුරු ලබා ගැනීමයි.
(2) පර්යේෂකයා සමාජයේ දකින දකින දේ වාර්තා කිරීමයි.
(3) සමාජ චර්යාවන් සොයා බැලීමයි.
(4) යම් සිද්ධියක් පිළිබඳ තොරතුරු අසා දැන ගැනීමයි.

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  තම දහම් පාසලට පැමිණෙන සිසුන් සංඛ්‍යාව දිනෙන් දින අඩු වන්නට වූයෙන් ඒ පිළිබඳව තොරතුරු සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රධානාචාර්ය හිමියන් විසින් නන්ද හිමියන්ට පවරන ලදී. ඒ පිළිබඳ පර්යේෂණයක නිරත වූ නන්ද හිමියන් සිදු කළ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

  A - සිසුන් දහම් පාසලට නොපැමිණෙන්නේ අමතර පන්තිවලට සහභාගි වීම නිසා යැ යි සිතා ඒ පිළිබඳව සොයා බැලීම

  B - දහම් පාසලට නොපැමිණෙන සිසුන් අතුරෙන් සිසුන් දහදෙනෙකු අධ්‍යයනයට තෝරා ගැනීම

  C - එම සිසුන් හමුවී කතාබහ කර අවශ්‍ය තොරතුරු ලබා ගැනීම

38. A අක්ෂරය යටතේ නන්ද හිමියන් ගොඩනගා ගත් උපකල්පනය පර්යේෂණ ක්‍රම විද්‍යාවේ දී හඳුන්වනු ලබන්නේ,

    (1) උපන්‍යාසය ලෙසයි. (2) නියැදිය ලෙසයි. (3) විශ්ලේෂණය ලෙසයි. (4) පරිකල්පනය ලෙසයි.

39. B අක්ෂරයට අනුව තෝරා ගත් සිසුන් ප්‍රමාණය පර්යේෂණයේ,

    (1) ජනගහනයයි. (2) නියැදියයි. (3) කණ්ඩායමයි. (4) සංගහණයයි.

40. C අක්ෂරය යටතේ භාවිත කළ දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රමය හැඳින්වෙන නම කුමක් ද?

    (1) සම්මුඛ සාකච්ඡා (2) නිරීක්ෂණ (3) සිද්ධි අධ්‍යයන (4) ප්‍රශ්නාවලී

* * *

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக் கல்விப் பிரிவு

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 04 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - II

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරා ගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

---

1. (i) සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකුගේ** නම් ලියන්න.
(ii) සමාජයීය විද්‍යාවන් **දෙකක්** සඳහන් කරන්න.
(iii) මානව සමාජය වෙනස් කිරීමට සමත් වූ නව සොයා ගැනීම් **දෙකක්** ලියන්න
(iv) හර්බට් ස්පෙන්සර් දැක්වූ සමාජ පරිණාමයේ අවධි **දෙක** මොනවා ද?
(v) සංස්කෘතියේ ප්‍රධාන කොටස් **දෙක** කුමක් ද?
(vi) බහුවිධ සමාජයක ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(vii) සමාජ පාලන ආයතන **දෙකක්** සඳහන් කරන්න.
(viii) ශිව භක්තිකයින් උපවාසයේ යෙදීමෙන් අපේක්ෂා කරන කාරණා **දෙකක්** ලියන්න.
(ix) කැලි කසළ ගැටලුවට විසඳුම් **දෙකක්** යෝජනා කරන්න.
(x) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් කිරීමේ දී අනුගමනය කළ යුතු තර්කන ක්‍රම **දෙක** කුමක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)

2. (i) "සමාජ සංස්ථා" පිළිබඳ අර්ථකථනයක් සපයන්න. (ලකුණු 02 යි)
(ii) සමාජය විසින් භික්ෂුවකගෙන් අපේක්ෂිත කාර්යයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) බුදු දහමේ දැක්වෙන සමාජ විද්‍යාත්මක ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3. (i) නවීකරණයේ බලපෑම නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ii) කාර්මීකරණයේ අයහපත් ප්‍රතිඵල **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) මහින්දාගමනය නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** අගයන්න. (ලකුණු 05 යි)

4. (i) විවාහ උත්සවයක දී අනුගමනය කරන සංස්කෘතිකාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) උප සංස්කෘතියක ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
(iii) ඉන්දියානු ආක්‍රමණ නිසා හෙළ සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

5. (i) මානව කේන්ද්‍රණවාදය යනු කුමක් ද? (ලකුණු 02 යි)
(ii) ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතික උත්සව **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
(iii) අටලෝ දහමින් අකම්පිත වීම මානව සංවර්ධනයට හේතු වන බව කරුණු **දෙකක්** ඇසුරින් තහවුරු කරන්න. (ලකුණු 05 යි)

6. (i) සංස්කෘතිය සඳහා අර්ථකථනයක් සපයන්න. (ලකුණු 02 යි)
(ii) සමාජ පාලනයක් අවශ්‍ය වීමට බලපාන මානව චිත්තවේග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) සමාජ පාලනය සඳහා අධ්‍යාපනයේ ඇති වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 05 යි)

7. (i) සමාජ ගැටලුවක සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ii) ශ්‍රී ලාංකේය සමාජයේ බහුලව දක්නට ලැබෙන අපරාධ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) මතින් තොර රටක් ගොඩනගා ගැනීමට උපයෝගී කර ගත හැකි බෞද්ධ මාර්ගෝපදේශ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

8. (i) නිරීක්ෂණය බෙදෙන මූලික කොටස් **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)
(ii) දත්ත රැස් කිරීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගී කර ගැනීමේ වාසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) සමාජ විද්‍යා පර්යේෂණ සිදු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *